# ලෝකෝපකාර වර්ණනාව

හෙවත්

රණස්ගල්ලේ මහාස්ථවිරපාදයන්වහන්සේ

විසින් විරචිත

ලෝකෝපකාරය පිළිබඳව

වැලිගම

රාජකුලවර්ධනාරාමාධිපති

දඹගස්ආරේ

සීමානන්ද ස්වාමීන්වහන්සේ

විසින්

පාඨශෝධනය කිරීමෙන් ලියනලද

ව්‍යාඛ්‍යානය හා සංක්ෂිප්ත වර්ණනාව.

පීටර් ද සිල්වා පරණමාණ

විසින්

අලුත්ගම සද්ධර්මප්‍රකාශ යන්ත්‍රාලයෙහි මුද්‍රණයකරවා

ප්‍රසිද්ධ කරනලදී.

ශ්‍රී. බු. ව 2468
ක්‍රි. ව. 1925

# සංඥාපනය.

"ලෝකෝපකාරය":—මෙනම් ප්‍රශස්තතර නීති ශාස්ත්‍රීය ග්‍රන්ථයතෙම තොටගමු විහාරවරය වාසස්ථානකොටගෙන වැජඹුනු රණස්ගලුතෙර සාමීන් විසින් කරන ලද්දකි. තොටගමු විහාරවාසිත්වයෙන් වැජඹුනු ස්ථවිරපාදයන්වහන්සේලා පිළිබඳ ප්‍රවෘත්ති බෙහෙවින් ප්‍රසිද්ධව පවතින නමුත් මෙම ස්ථවිරපාදයන් වහන්සේ පිළිබඳව ග්‍රන්ථාරූඪවූ හෝ මුඛපරම්පරායාතවූ හෝ විස්තර ප්‍රවෘත්ති මේතාක් දැනගැනීමට නොහැකිවීම චිත්තානන්දයට හේතුනොවන්නේමය. නමුත්;

"සිරිසර ගුණැති මහ-නැන තෙදිනි ලොව පරසිදුවසිටි
සිරිපිරි තොටගමුවෙ-වෙහෙර බොහොසෙසාල් හැරඹැඩසිටි.
සොළුවර සොළෙ මෙපොත-පුරසත්‍යසභාවස පිරිසිටි
පරපුර වණිජකුල-රණස්ගලුතෙර නමැති යතිඳු"

යන-ලෝකෝපකාර ග්‍රන්ථාවසානයෙහි දක්වනලද මේ පද්‍යමයෙන් පෙණියන්නේ මුන්වහන්සේ ඉතා උසස් ගුණ සමූහයකින් හා ප්‍රශස්ත ප්‍රඥාමහිමයෙන්ද පූජ්‍යතරව තොටගමු විහාරවරයෙහි වැඩිවශයෙන්ද. අන්පැනක මඳවශයෙන්ද කල්යැවූබවයි.+ වණිගවංශයෙහි උත්පන්නවූ මුන්වහන්සේ ගුණවශයෙන් හා ප්‍රඥාමහිමයෙන්ද කුලපරම්පරා වශයෙන්ද ලෝකයාගේ බහුමානයට භාජනව පැවැත්තාහුයයි ඒකාන්තයෙන් සිතන්නට ඉඩතිබේ මුන්වහන්සේගේ ජන්මග්‍රාමය රණස්ගලු ප්‍රදේශයම බව යටදැක්වූ පද්‍යයෙන් පෙණියන්නේය මේ ප්‍රදේශය වනාහි සත් කොරලය බද ප්‍රදේශයක් බව සාරුණු පරීක්ෂාකිරීමේදී දැන ගන්ට ලැබුණු නමුත් මේ පිළිබඳවූ වැඩි විස්තරයක් සොයාගත නොහැකිවිය. මුන්වහන්සේ විසින් මේ පොත කරනලද්දේ ශක වර්ෂ 1721 දී බව යටදැක්වූ ගීයෙහි පුරසත්‍ය යන්නෙන් ප්‍රකාශිත නමුත් මේ පොතේ සඳහී විලාශය හා භාෂාරීතිය ගැනත්

---

+ තොටගමු විහාරයෙහි වැඩිවශයෙන් කල්යැවූ බව කියාතිබෙන හෙයින් මුන්වහන්සේගේ ජන්මග්‍රාමයෙහි කලින්කල විසූ බවද සිතිය හැකිය.

සලකනවිට මෙහි පෙණෙන වර්‍ණ දෝෂයෙන් දූෂිතවූවක් බව සිතිය හැක. ස්වර්ගස්ථ වැදල සික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන මහා නායක ස්ථවිරපාදයන්වහන්සේ විසින්ද මෙහි පුරසත්‍ය යන වර්‍ණ සඞ්ඛ්‍යාව වරදයයි ප්‍රකාශ කළබව අසනු ලැබීය. මෙයමෙසේම තවත් උතුමන් විසින්ද පිළිගෙන තිබේ.

මෙම ග්‍රන්ථයට ප්‍රථමයෙන් ව්‍යාඛ්‍යානය ලියූ ආචාර්‍ය මූල්ලේරියාවේ ගුණරතන මහාස්ථවිරපාදයන් වහන්සේ විසින්ද මෙම පුරසත්‍ය යන වර්‍ණ සඞ්ඛ්‍යාව ගැන සැක සහිත බවත් මෙම ග්‍රන්ථය නොවගමු කාලයට සමීප කාලයක කෘතියක් වියහැකි බවද කියනලද්දේයයි, පෙල්වත්තේ රත්පත් විහාරාධිපති මකාලාඕවේ ශ්‍රී මේධඞ්කරාභිධාන නායක මහාස්ථවිරපාදයන්වහන්සේ අප සමග කීහ. එම නායක ස්ථවිරපාදයන් වහන්සේගේ අදහස සද එසේම බවත් අප සමග කළ කථාවෙන් දැනගතිමු. මේ කාරුණු මෙසේ නමුත් අපට ලැබුණු පොත්කොපිවල එකකැවිම දක්නා ලැබූ හෙයින් පුරසත්‍යයනුම අපගේ සංස්කරණයෙහි යෙදූබව ප්‍රකාශකරමු. ඒමේ ලෝකෝපකාරයනම් ග්‍රන්ථය වනාහි ලොකුකුඩා සියලුදෙනාටම සප්‍රයොජනවනසේ නීතිශාස්ත්‍රීයොපදෙශයන්ගෙන් සරසාතිබේ. තවද මේ පොතේ දක්වා තිබෙන උපදෙශයන්ගෙන් වැඩියක් සංස්කෘත භාෂාමය නීති ශාස්ත්‍රීය ශ්ලොකයන්ගෙන් හා ධර්මපාද ගාථාදියෙන් උපුටාගත් බවද සමහර පද්‍යයන් තමන්වහන්සේගේ බුද්ධියෙන්ම උපදවාගත් අදහස් වලින් සරසනලද බවද පෙණේ. එම නිසාද මේපොත උගත් නූගත් උභයපක්‍ෂයෙහිම ව්‍යාකාකර්‍ෂණය කරන ප්‍රශස්තතර ග්‍රන්ථයක්ම බව වැඩිදුරටත් කීයහැක්කේය.

41 "නසත්මුත් දුදනන්-සුදනෝ උන්වම බැඹ සලසන්
සඳුන්තුර සිඳිනා-පොරොව මුවඅග සුවඳවනමෙන්"
"සුජනො නයාති වෛරං පරහිත නිරතො විනාශකාලෙපි
ඡෙදෙපි චන්දනතරුඃ-සුරභයති මුඛං කුඨාරස්‍ය"

104 "උතුමෝ පවාලොව- නිවැරදි සහන් නමුත් බඳවත්
කළවරදට රවුළු-දියරම් නොබැඳෙවීද සමුදුර"
"බලඃකරොති දුර්වෘත්තාං නූනං ඵලති සාධුෂු
දශානනොහරාත්සීතාං බන්ධනන්තුමහොදධෙඃ"

132 "දළඅත්තිය විසැති-සතදුදනා ලියරදුන් සිහුගං
කෙළෙනම් කාකිවත්-කෙරේ අපදපමණ නොකරව්"
"ශෘඞ්ගිනාඤ්ච නදීනාඤ්ච නඛිනාංශස්ත්‍රපාණිනාම්
විශ්වාසොනෛව කර්තව්‍යඃ ස්ත්‍රීෂුරාජ කුලෙෂුච"

959 "පච්බැඳි සිත් නොමැති-දනහට යම් දෙසක් පැමුණුනත්
වණනොමැති අල්ලෙහි-විසය නොනැගෙන මෙන් නොවේ
"පාණිම්හි චෙ වණො නාස්ස හරෙය්‍ය පාණිනා විසං [දුක්
නාබ්බණං විසමන්වෙති නත්ථි පාපං අකුබ්බතො"

මෙහි දැක්වූ ගී සතර අනතුරු ශ්ලොකත්‍රය හා ගාථාව ඇසුරු කොට කරනලද බැව් පෙනේ. මේ ආදී වශයෙන් සලකනවිට මෙම ග්‍රන්ථය නිර්මාණයකළ මහාස්ථවිරපාදයන් වහන්සේ පාලි සංස්කෘත භාෂාවිෂයෙහිද සමර්ථ උතුමෙකු බැව් ප්‍රකාශවන්නාක් මෙන්ම මෙම ග්‍රන්ථයාගේ පූජ්‍යතරභාවයත් ස්ඵුටවේමය. තවද මෙම ග්‍රන්ථයට (සවශ්සත්විවදුල) මුල්ලේරියාවේ ආචාර්‍ය්‍ය ගුණරතන මහාස්ථවිරපාදයන්වහන්සේ විසින් ලියනලද සන්නයත් ඉන්පසු තවත් උගත් ස්ථවිරතුමෙකු විසින් ලියනලද සන්නය කුත් මුද්‍රාඞ්කිතව ප්‍රචලිතවූහ. එම සත්කෘතීන්ගෙන් ආධුනික ජනතාවට අත්පත්වූ විපුල ප්‍රයොජනය වර්ණනා විෂයාතීතයයිද විශෙෂයෙන්ම පාඨශාලාවල උගෙනීම කරන ශිෂ්‍ය පරම්පරාවට එයින් ඇතිවූ සඵලය තෙම ප්‍රශස්ත තරයයිද කියහැක්කේය. එහෙත් මෙම ග්‍රන්ථයෙහිවූ පද්‍යයන්ගේ සැලකියයුතු පාඨභෙද පැරණි පිටපත්හි දක්නට ලැබී පරීක්ෂාකළවිට තවමත් මෙම ග්‍රන්ථය නිසිප්‍රමාණ ශුද්ධියකට නොපැමිණි බැව් වැටහී ගියේය. මෙසේ මේ ග්‍රන්ථයාගේ ඌනත්වය සැලකූ අපි මෙහි පිටපත් කීපයක් සපයා මීට අභිනව ව්‍යාඛ්‍යානයක් ලියා අදහස් පැහැදිලි කරණු පිණිස ඇතැම් තැන විස්තරාර්ථද ගළපනලදහ. ආධුනික ජනානුග්‍රහය පෙරදැරිකොට අප විසින් මෙසේ ලියනලද මේ ව්‍යාඛ්‍යානයෙන් ලොකයාහට අත්‍යන්ත ප්‍රයොජනයක්ම ඇතිවනු නියතයි. මෙහි යම් යම් තැන අපගේ ප්‍රමාද භ්‍රමාදීයෙන් ජනිතවූ දොෂස්ථාන ඇත ද ද්විතීය සංස්කරණයේදී ශුද්ධියට පමුණුවාලීමට අදහස් බැවින් පරාර්ථකාමී සුධීහු අපවෙත දන්වා එවත්නම් සතුටින් භාරගන්නා බැව් හිතාධ්‍යාශයෙන් මතක් කරමු. තවද මෙග්‍රන්ථ සංස්කරණයේදී හංගල්ලේ ගෞතමවිද්‍යාලයාධිපති පණ්ඩිතාචාර්‍ය වැලිපටන්විල ශ්‍රී දීපඞ්කර මහාස්ථවිරස්වාමිපාදයන්වහන්සේ ඇතැම් කාරණා සොයාදීමෙන් හා ශුද්ධිය බැලීමාදියෙන් විශිෂ්ටාධාර කළබව කෘතඥ ගුණසැලකීම්වශයෙන් බුහුමන් පෙරටුව නොම්සුරුව සිහිපත්කරමු. එසේම දෙව්නුවර දපුළුසෙන් බෞද්ධ පාඨශාලාවේ උපාචාර්‍ය ඇල්. ඇම්. ලීලසේන මහත්මයා විසින්ද පොත් කොපියක් සපයාදීමෙන් අපට ආධාරකළ බව ස්තුති පූර්වකව සඳහන් කරමු. එසේම වැලිගම

රාජකුලවඩ්ඪනාරාමාධිපතිව වැඩවිසූ අපගේ ප්‍රව්‍රජ්‍යාචාර්‍ය්‍යොත්තමවූ ගෞරවාහී දෙඩම්පහළ සරණතිස්සාභිධාන මහාස්ථවිර පාදයන්වහන්සේද, ධර්මාචාර්‍ය්‍යොත්තමවූ වැලිගම අග්‍රබෝධි පරිවෙණාධිපති බද්දේගම කීර්ත්තිශ්‍රී ධම්මරතනාභිධාන මාතර හම්බන්තර දෙදිශාවේ ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරපාදයන්වහන්සේද මෙහිදී කෘතඥතා පූර්වකව සිහිපත් කරමු.

මේබවට,

වැලිගම රාජකුලවඩ්ඪනාරාමාධිපති

**දඹගස්ආරේ සිමානන්දතෙරුන්නාන්සේය.**

25.3 25 වෙනි දින
වැලිගම රාජකුලවඩ්ඪනාරාමයෙහිදීය

# ශුද්ධිපත්‍රය.

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 1 | තමෙක්මුත් | තුමෙක්මූත් |
| ,, | 6 | යදෘශවූ | සදෘශවූ |
| ,, | 9 | රශ්මීයෙන් | රශ්මියෙන් |
| ,, | 10 | තාරකාවක් | තාරකාවෙක් |
| ,, | 19 | යන වස්තූන්ට........ | යන වස්තූන්ට; සමුද්‍ර, සමුද්‍ර ජලයද; මෙර, මෙරු පර්වතයද; |
| ,, | 22 | පෞඪ | ප්‍රෞඪ |
| ,, | 24 | දත්දුන්තාවුන්ගේ | දැන් දුන්තවුන්ගේ |
| 2 | 10 | අජ්ඩාරොහ | අශ්වාරොහ |
| ,, | 13 | ගැසීවෙන් | ගැසීමෙන් |
| ,, | 30 | ගොයම්පැල | ගොයම්පැලින් |
| 5 | 1 | සප්තකූල | සප්තකූට |
| ,, | 2 | අතුරෙන් | අතුරෙහි |
| ,, | 10 | අශ්වකර්ණසමුද්‍රය | අශ්වකර්ණපර්වතය |
| ,, | 10 | ජලමටටමෙන් | ජලමට්ටමෙන් |
| ,, | 23 | පිටතීන්ද | පිටතින්ද |
| ,, | 24 | සිහිලසමවිය | සිහිල්මවිය |
| ,, | 27 | පිටතීනුදු | පිටතිනුදු |
| ,, | 28 | ගීමන් | ගිමන් |
| ,, | 35 | පිහිටී | පිහිටි |
| ,, | 39 | කාමාවචර | කාමාවචර |
| 6 | 17 | විසීදහසක් | විසිදහසක් |
| 7 | 3 | නොතිවුද | නොතිවූද |
| ,, | 19 | වෙසයෙන් | වෙශයෙන් |
| 8 | 1 | විදුවත් | විදුවක් |
| ,, | 26 | කෝපයද | කොපයද |
| 9 | 14 | ජවනගංස | ජවනහංස |
| ,, | 31 | රසයක්වේ | රසයෙක්වේ |
| 10 | 1 | වීසින් | විසින් |
| ,, | 15 | සිලප | සිල්ප |
| 11 | 2 | මැදෙහි | මැදෙහි |
| ,, | 22 | සිම | සිට |

| පිට | පෙළ | අශුබ | ශුබ |
|---|---|---|---|
| 13 | 1 | තඳට | තඳට |
| ,, | 18 | ශතෲන් | ශත්‍රෑන් |
| 14 | 1 | රකිණා | රකිතා |
| ,, | 15 | මොක්දකිනා | මොක්දකිනා |
| 16 | 23 | වෙසධාරිව | වෙෂධාරිව |
| 17 | 10 | තදවෙග | තදවේග |
| 18 | 23 | දිවසාතික්‍රමණය | දිවසාතික්‍රමණය |
| 19 | 4 | තිරිඳුන් | තිරිඳුන් |
| ,, | 5 | ගංහො | ගංහෝ |
| 20 | 24 | වෘඞිකාරණ | වෘඞීකාරක |
| 22 | 2 | මූවහත | මුවඅත |
| ,, | 6 | තුළඑහි | එහිතුළ |
| ,, | 17 | මුවහත | මූවඅත |
| ,, | ,, | මූවහ | මූවාහ |
| ,, | 27 | පත් | යපත් |
| ,, | 33 | සවමියාගටවඩා | සවාමියාගටවඩා |
| 23 | 7 | රාක්‍ෂසයෙකු | රාක්‍ෂසයකු |
| ,, | 15 | සදපහන් | සඳපහන් |
| ,, | 19 | තිමල් | තිමල |
| ,, | 25 | මතුර්මුඛයා | චතුර්මුඛයා |
| ,, | 32 | ගුණලයවක් | ගුණලවයක් |
| 24 | 2 | සිළුමිණිති | කටමිණිති |
| ,, | ,, | කොමළත | කොළත |
| ,, | 8 | විලියෙන් | විළියෙන් |
| ,, | 12 | සිළුමිණිති | කටමිණිති |
| ,, | ,, | ගිඛාමාණිකායයෙන් | කාණ්ඩමාණිකායයෙන් |
| ,, | 26 | ඊධායෙන් | ඍධායෙන් |
| ,, | 27 | හොදුර | ගොදුර |
| 25 | 3 | තමාශති | තමාගති |
| ,, | 30 | හෙලිමෙකි | හෙලීමෙකි |
| ,, | ,, | මහාමාගියෙහි | මහාමාගීයෙකි. |
| ,, | 37 | වාටමෙති | වැටමෙති |
| 26 | 1 | විඳින | විඳිති |
| ,, | 6 | සෙබඩක | සෙබඩක නිසා |
| ,, | 11 | අනතරායක් | අනතරායෙක් |
| ,, | 19 | සත්දෙනෙකුත් | සත්දෙනෙකුන් |

| පිට | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| ,, | 20 | කිසිවෙක් | කිසිවෙක් හටත් |
| ,, | 29 | ශබ්දයසා | ශබ්දයඅසා |
| 27 | 33 | උක්තප්‍රකාරවූ | උක්තප්‍රකාරවූ |
| ,, | 35 | සෙවනායකාරණ | සෙවනායකාරන |
| 28 | 7 | හාසන්තහුය | හාසන්නාහුය |
| ,, | 13 | සේවයට | සෙවයට |
| ,, | 22 | සතපපවා | සතප්පවා |
| ,, | 37 | දේවියෑගේ | දෙවියගේ |
| 30 | 32 | වින් | විසින් |
| 32 | 8 | පඬි | පඬි |
| 34 | 10 | භ්‍රාජමාන | භ්‍රාජමාන |
| 35 | 21 | මන්ත්‍රිවරයෝ | මන්ත්‍රිවරයෝ |
| 36 | 35 | ගිලංහළි | ගිලන්හට |
| 37 | 12 | භීතියෙන් | භීතියෙන් |
| ,, | 13 | පැමිණෙන්නාවූ | පැමිණියාවූ |
| 43 | 29 | ආයුෂඇතිව | ආයුෂඇතිවූ |
| 44 | 4 | සඳසිහ | සඳසහ |
| 47 | 20 | විඥයෝවෙති | අඥයොවෙති |
| 48 | 18 | චෞරපුරුෂයන්ගේ | චෞරපුරුෂයන්ගේද |
| 51 | 5 | තොමහ | නොමඟ |
| ,, | 7 | නොදනුම්කමෙහී | නොදනුම්කමෙහි |
| ,, | 27 | තොමග | නොමඟ |
| 52 | 29 | දෙලෝවැඩ | දෙලෝවැඩ |
| 53 | 1 | මෙකීවත් | මෙතිවත් |
| 54 | 4 | මෙකී සිවුගුණ | මෙතිසිවුගුණ |
| ,, | 16 | මෙකීසිවුගුණ | මෙතිසිවුගුණ |
| 55 | 6 | අනීසොකු | අතිසොකු |
| 56 | 23 | යම්පත්හිමියන් | සම්පත්හිමියන් |
| 60 | 10 | පවතීත් | පවතිත් |
| 61 | 1 | මැතිවරන් | මැතිවරන් |
| 65 | 10 | චිත්තානුකූල | චිත්තානුකූල |
| 66 | 1 | ගිනිතපිත | ගිනිතපිත |
| ,, | 5 | ගිම් | ගිම් |
| 68 | 9 | † | ※ |
| ,, | 10 | කරන්නවුන | කරන්නවුන් |
| ,, | 13 | සතුරෝනැත් | සතුරෝනැති |

| පිට | පෙළ | අශුඩ | ශුඩ |
|---|---|---|---|
| 68 | 17 | පටෙවාඩම් | පච්චෝඩම |
| ,, | 20 | කාපපු | කාප්පු |
| ,, | 24 | වලය | වළය |
| ,, | 25 | පටටකාර | පච්චකාර |
| ,, | 27 | ගැටනිවුල්හර* | ගැටනිවුල්හර |
| ,, | 40 | අගදුහරණ | අභදුබරණ |
| 69 | 1 | තුඩිවේ | තුඩවේ |
| ,, | 4 | විලසින් | විලසින් |
| ,, | 6 | නොවව | නොවව් |
| 72 | 23 | ලොතාක්මෙති | ලෝතාක්මෙති |
| 73 | 3 | බී බී | බි බී |
| ,, | ,, | විදිත | විදිතා |
| 76 | 4 | තැතක් | හැතක් |
| ,, | 8 | වීලස්වේ | විලස්වේ |
| 77 | 24 | ප්‍රාපනකරත් | ප්‍රාපනකරවත් |
| 78 | 13 | භාශෂිාවගේ | භායෂිාවගේ |
| 79 | 15 | ලගුවෙත් | ලගුවෙත් |
| ,, | 18 | කුඩාවූවාක | කුඩාවූවාක් |
| ,, | 27 | පැමීණෙන | පැමිණෙන |
| 80 | 4 | වදීත | වදිත |
| ,, | 12 | දූතහන්තාක්මෙති | දූතගත්තාක්මෙති |
| 86 | 5 | දිවමවැඩී | දිවමවැඩි |
| 87 | 4 | නායෙක් | නොයෙක් |
| ,, | 17 | දීනත්දිතම | දිනෙත්දිතම |
| 88 | 13 | කොරෙමින් | කොරෙමින් |

* ගැට සිද-නිවුල්හර සිද-ඇතැම් තැන දෙකක්ව පෙණේ.

වර්ණනාසහිත-

# ලෝ කෝ ප කා ර ය.

## නමදිම් රුවන්තිසා.

1 මුනිඳුට සරිකෙනෙක්-තුන්ලොවම නැත් මුනිතුමෙක්මුත්
අපමණ තරුරැසින්-සඳටසරි තරුවෙක් නොමැතිමෙන්

2 සමුදුර මෙර පොළොව*-තුරු ලේ හිස්මසැස දන්දුන්†
නොසරිවනකල ලොව-බුදුබැව් පතනුවෝ ලතරවෙත්.

---

1 මුනිඳුට, සර්වඥයන්වහන්සේට; සරි, (ගුණමහිමාදියෙන්) සදෘශවූ; කෙනෙක්, කශ්චිත් පුද්ගලයෙක්; මුනිතුමෙක්මුත්, සර්වඥ රාජයෙක්(ම)විනා; තුන්ලොවම, ත්‍රිවිධලොකයෙහිම; නැත්, අවිද්‍යමානවේ; (කුමක්වැනිදයත්?) අපමණ, ප්‍රමාණරහිතවූ; තරු රැසින්, තාරකාසමූහය අතුරෙන්; සඳට, චන්ද්‍රයාහට; සරි, (රශ්මියෙන්) සදෘශවූ; තරුවෙක්, තාරකාවක්; නොමැතිමෙන්, අවිද්‍යමානවන්නාක්මෙනි.

(1 භා:) සර්වඥයන්වහන්සේට ගුණමහිමාදියෙන් සදෘශවූයේ සර්වඥකෙනෙක්මමුත්- (සමවූ) අන්‍යයෙක් ස්වර්ගමර්ත්‍යපාතාල යන ලොකත්‍රයෙහිම නැත්තේය. (කුමක්වැනිදයත්?) ආකාශයෙහි විද්‍යමානවූ අප්‍රමාණ තාරකා සමූහය අතුරෙන් චන්ද්‍රයාට සමවන තාරකාවක් නොමැත්තාක්මෙනි.

2 දන්දුන්, (බුඬත්වය ලැබීම පිණිස) දානමුඛයෙහි දුන්නාවූ; ලේහිස්මසැස-ලේ, රුධිරද; හිස්, ශීර්ෂද; මස්, මාංසද; ඇස්, නෙත්‍රද යනවස්තූන්ට; පොළොව, මහාපෘථිවියද; තුරු, (ආකාශයෙහි) තාරකාද යනමේ වස්තූන්; නොසරිවනකල, සදෘශනොවන කල්හි; ලොව, ලොකයෙහි; බුදුබැව්පතනුවෝ, බුඬභාවය ප්‍රාර්ථනා කරන (සාධු) ජනයෝ; ලතරවෙත්, පෞඪවෙත්; හෙවත් දෘඪාධ්‍යාශය ඇත්තෝවෙති.

(2 භා:) බුඬභාවය ප්‍රාර්ථනාකොට දන්දුන්නාවූන්ගේ ශරීරයෙහි රුධිරයට සමුද්‍රජලයද, හිස්වලට මහාමෙරුපර්වතයද, මස්වලට මහාපෘථිවියෙහි පස්ද, ඇස්වලට ආකාශයෙහි තරුද, සම නොවන කල්හි බුදුබවපතන උතුමෝ දෘඪතරාධ්‍යාශය ඇත්තෝමවෙති.

---

2. *මේ පොළව-හැම—†තරුලේමස් ඇසට දන්දුන්-හැම.

සමුද්‍රය වනාහී වටින් සක්වළගල පැහැර සිටිනේය- සමුද්‍රතීරයෙහි පටන් ක්‍රමක්‍රමයෙන් අඟුලෙක දෑඟුලෙක වියතෙක දෙවියතෙක රියනෙක දෙරියනෙක යටෙක* දසයටෙක ඉස්බෙක† දසඉස්බෙක ගව්වෙක දෙගව්වෙක යොත්නෙක සියක්යොත්නෙක දසක්යොත්නෙකැයි මෙසේ සක්වළගලපටන් ගැඹුරු ගැඹුරුව ගොස් මහමෙර සමීපයෙහි සුවාසූදහසක් යොදුන් පමණ ගැඹුර ඇත්තේය. මේ සමුද්‍රය යටින් සතළිස්දහසක් යොදුන් උසඇති ජලස්කන්ධයතෙම දෙසිය තුන්සිය පන්සිය යොදුන්ද- දසදහසක් යොදුන්ද පමණ දිගඇති තිමිතිමිඟල- තිමිරපිඟල- ආනන්ද- තිමින්ද- අජ්ඣාරෝහ- මහාතිමි- යනාදිවූ ඒ ඒ මත්ස්‍යරාජයන්ගේ පැළඹීමෙන් කැළඹී චලිතවන්නේය- මැද සාරදහසක් යොදුන් උස දියකඳ නිශ්චලව තිබෙන්නේය. ඉන් උඩ සතළිස්දහසක් යොදුන් උස දියකඳ රළගැසීමෙන් චලිතවන්නේය. ඒ රළින් මහින්ද නම් රළ සැටයොදුන් උස උඩනගා වැටෙන්නේය. ගඞ්ගා නම් රළ පණස්යොදුන් උඩනගාහෙන්නේය. රෝහණනම් රළ සතළිස්යොදුන් උඩනගා පතිතවන්නේය. තවද එම සමුද්‍රයෙහිම තැනින්තැන ඛුර මාලීසමුද්‍රය. අග්ගිමාලීසමුද්‍රය. දධිමාලීසමුද්‍රය. කුසමාලීසමුද්‍රය. නලමාලීසමුද්‍රය. ප්‍රවාලනලමාලීසමුද්‍රයයි සවැදෑරුම්වෙයි. එයින් ඛුර මාලීසමුද්‍රයනම් වීදුරුවැල්ලෙන් (දියමන්තිමයවූ වැල්ලෙන්) එකාලොකවිද නානා සත්වයාඔප්නැඟූ සාරසමූහයක්මෙන් බැබලීමෙන් යුක්තවූ මනුෂ්‍යයන්වැනි මත්ස්‍යසමූහයා දියමුදුනෙන් ඉපිල ගිලේද ඒ සමුද්‍රය ඛුරමාලීනම්වෙයි. යම්තෙනෙක්හි සතරතින් නිමවා ඔප්නැඟූ රන්පතක්සේ යට රන්වැල්ලෙන්විහිදී සුවර්ණ රශ්මීහු ජලතලාව මුදුනෙන් පෙණේද ඒ සමුද්‍රය අග්ගිමාලීනම්වේ. යම්තෙනෙක්හි යට රිදීවැල්ලෙන් පැණනැඟාවූ ආලෝකය දියෙහි පැතිර කිරිමුහුදමෙන්ද. ඉතා සුදුවූ දධිපටලයක්මෙන්ද. සුදුරැස්විහිදේද ඒ සමුද්‍රය දධිමාලීනම්වෙයි. යම්තෙනෙක්හි ඉඳුනිල්මිණිවැල්ලෙන් විසිරගිය නිල්පැහැයෙන් මුහුද හීතණින් ගැවසීගත් භූමිප්‍රදෙශයක්මෙන්ද තරුණ ගොයම්පැල ගැවසීගත් ගොයම්වෙලක්මෙන්ද නිල්පැහැයෙන් බබලන්නේනම් ඒසමුද්‍රය කුසමාලීනම්වේ. යම්තෙනෙක්හි වංශවර්ණ මහරිමල්වර්ණාදිවූ මාණික්‍යයන්ගේ උත්සන්නතායෙන් තරුණ හුනවනයක්මෙන් පෙණේද: ඒ සමුද්‍රය නලමාලීනම්වෙයි. යම්තෙනෙක්හි ප්‍රවාලයන්ගේ උත්සන්නතායෙන් ජලතලාව රිවිමඬලක්මෙන් රක්ත ප්‍රභාවෙන් පෙණේද ඒ සමුද්‍රය ප්‍රවාලනලමාලීනම්වෙයි.

---

*යටෙක්නම් සත්රියනෙකි-†ඉස්බනම් යෂ්ටිවිස්සක් හෙවත් එක්සියහතළිස්රියනෙකි.

තවද මහාසමුද්‍රය යම්තෙනෙක්හි තද පවන්වෙගයෙන්
වටින් දියකඳ ඇද යොදුන්ගණන් උඩනැඟී වටින් ඉවුරුබිඳුනු
හෙලක්සේද නටුවනැති අක්බඹරක්සේද කොතබිම්බලාසිටවූ
මිටනැති කුඩයක්සේද සියලු දිශාවෙන් පෙණී වටින් ප්‍රපාතව
උඩනැඟී රළබිඳී වෙගයෙන් හුනුකල්හි වටට දියරැලිය ගොස්
මහමෙරද සක්වළගලද පැහැර දසදෙලොස්යොදුන් පමණ උඩ
නඟා භයානකවූ ශබ්දපවත්වා නැවත මහමුහුද හුනුකල එම
ස්ථානයෙහි යොදුන්ගණන් දිගුපුළුල් ගැඹුරු මහවළවේද. ඒ
ස්ථානය වඩබාමුඛයයි කියතලදී. එයින් සක්වළට අභිමුඛව
යන්නාවූ ක්ෂුද්‍රවූ දියරැලිත් වෙරළ ගලාබස්නේය. ඒ මුහුද වඩ
බාදියනම්වේ. තවද අවීචිමහානරකයේ පැසෙන සත්වයන්ගේ
කර්මවශයෙන් නරකාවාරය හැමදවස්හිම හැරී වැසෙන්නේය. ඒ
නිරාදොර ඇරීගියකල්හි මහගිනිකඳක් නික්ම යොදුන්ගණන්
දියකඳ මුහුද යටභාගයෙන් දවන්නේය. එකල්හි මුදුනෙහි සිටි
දිය කරකැවී කැකෑරී මහාශබ්දපවත්වා අවීචිනිරාදොර වැගිර
සිඳෙන්නේය. දියසලාවක්මෙන් ස්රකැවී වළවූතැන් වළබාමුඛ
නම්වෙයි. තවද මහමුහුද කෙනෙක්කල් වැසිවටත් නියම්කලත්
අඟලක් පමණත් අඩුවැඩිනොවන්නේය. තවද මේ මහාසමුද්‍රය
හැමකල්හිම ක්ෂුද්‍ර මහත්වට දිගු ආදී අනේකවිධ මුතුද, රතුතිල්
ආදී නොයෙක් පැහැයෙන්යුත් මැණික්ද, වංශවණී මහරිමල්
වණීාදී අනෙකවිධවූ වෛරළුමිණිද, දක්ෂිණාවෘත්ත නන්දොදර
ධමනසංඛාදී අනෙකභෙදවූ සක්ද, ශ්වෙතකාලමුද්ගවණීාදී විවිධ
ශෛලද, කුඳුමහත්මදරත් සතරත් දිගු ලුහුඬු නානාවිධ පබළුද
කර්බූරාදී නොයෙක්පැහැඇති මැසිරිගල්දැයි මෙසේ අපමණවූ
රත්නයෙන් බබලන්නේය. එම මහමුහුදමැද සලපොළොවෙහි
පටන් පැනනැඟි ත්‍රිකූටනම්වූ පර්වතතුණක් මුදුනෙහි එක්ලක්ෂ
අටසැටදහසක් යොදුන් උසඇති නෙරිසණ්ඨානවූ අෂ්ටවණීය
කින් බබලන මහාමෙරුපර්වතය පිහිටියේය. ඒ මහමෙර සුවාසූ
දහසක් යොදුන් මුහුදගැලී සිටිනේය. සුවාසූදහසක් යොදුන්
උද්ගතව සිටිනේය. ඒ මහමෙරපල්ලේ ත්‍රිකූටඅතර දසදහසක්
යොදුන් පමණතැන් අසුරභවනය පිහිටියේය. ඒ මහාමෙරු
පර්වතය සතරදිග සතරපැහැයෙක. සතරඅනුදිග සතරපැහැයෙ
කැයි අටපැහැයෙක් ඇත්තේය. මහමෙරවනාහි පූර්විදිශාපාර්ශ්වය
රජතමූවාය. දක්ෂිණපාර්ශ්වය ඉන්ද්‍රනිල්මිණිමූවාය. පශ්චිමපාර්ශ්වය
පබළුමූවාය. උත්තරපාර්ශ්වය රුවන්මූවාය. එසේහෙයින් පූර්
දිග පලිහුවන් සුදුපැහැය. දකුණුදිග ඉඳුනිල්මිණිවන්පැහැය.
පැළදිග පබළුවන් රත්පැහැය. උතුරුදිග සතරන්වන්පැහැය
(සතරඅනුදිග) අග්නිදිග සුදුනිල්මිශ්‍රකපැහැය.

නිරිතදිග රත්නිල්මිශ්‍රක පැහැය. වායුදිගරත් රන්මිශ්‍රක පැහැය. ඊශාණදිග සුදු රන්මිශ්‍රකපැහැය. මෙසින් සතරදිග සතරඅනුදිග පර්වත සමුද්‍රාදිය සවකීය වර්ණකරමින් සක්වළගල පැහැර සිටිනේය. එහෙයින් පූර්වදිශාවෙහි සමුද්‍රය කිරිමුහුදනම් විය. දක්ෂිණදිශාවෙහි සමුද්‍රය නිල්මුහුදනම්විය. පශ්චිමදිශාවෙහි සමුද්‍රය ප්‍රවාලසාගරනම්විය. උත්තරදිශාවෙහි සමුද්‍රය සවර්ණසාගරනම්විය. ඒ ඒ දිශාවන්හි ආකාශයද ඒ ඒ වර්ණයෙන්ම හොබනේසි. සතරඅනුදිගද එමෙන්ම ඒ ඒ වර්ණවී ජම්බුද්වීපය අපරගොයානය පූර්වවිදෙහය උතුරුකුරුදිවයින යන කොදෙව් පිරිවරකොටඇති මේ සතරමහාද්වීපයටම මහාමෙරුපර්වතය උතුරුදිගමවිය. චක්‍රවාටපර්වතය දකුණුදිගමවී මහාමෙරුපර්වතයාගේ හාත්පස්හි පුලුලින්ද උසින්ද පන්දහසක් පන්දහසක් යොදුන් පමණවූ නාගාලින්දය, ගරුඩාලින්දය, කුම්භාණ්ඩාලින්දය,යක්ෂාලින්දයයි භවිතිසාභවනයට අරක්ගෙණ සිටින උන් උන්ගේ නාමයෙන්ම ප්‍රසිද්ධවූ ආලින්ද සතරෙක්වී. ඒ මහාමෙරුපර්වතය සිසාරා සුවාසූදහසක් යොදුන් උසඇති යුගන්ධරපර්වතය පිහිටියේය. එසින් දෙසාලිස්දහසක් යොදුන් උස සයුරගැලී සිටියේය. දෙසාලිස්දහසක් යොදුන් උද්ගතව සිටියේය. ඒ යුගන්ධරපර්වතය සිසාරා දෙසාලිස්දහසක් යොදුන් උසඇති ඊසධරපර්වතය පිහිටියේය. එසින් එක්විසිදහසක් යොදුන් උසදියෙහි ගැලී සිටියේය. එක්විසිදහසක් යොදුන් උස උද්ගතව සිටියේය. ඊසධරපර්වතය සිසාරා එක්විසිදහසක් යොදුන්උසඇති කරවීකපර්වතය පිහිටියේය. එසින් දසදහස්පන්සියයක් යොදුන් උසදියෙහි ගැලීසිටියේය. එපමණම උද්ගතව සිටියේය. ඒ කරවීකපර්වතය සිසාරා දසදහස්පන්සියයක් යොදුන් උසඇති සුදර්ශනපර්වතය පිහිටියේය. එසින් පන්දහස්දෙසියපණස්යොදුන් උස දියෙහි ගැලී සිටියේය. එපමණම උද්ගතව සිටියේය. ඒ සුදර්ශනපර්වතය සිසාරා පන්දහස්දෙසියපණස්යොදුන් උසඇති නෙමින්ධරපර්වතය පිහිටියේය. එසින් දෙදහස්සසියපස්විසියොදුන් උස දියෙහි ගැලී සිටියේය. එපමණම උද්ගතව සිටියේය. නෙමින්ධර පර්වතය සිසාරා දෙදහස්සසියපස්විසියොදුන් උසඇති විනතකපර්වතය පිහිටියේය. එසින් එක්දහස්තුන්සියදෙළොස්යොදුන් දෙගව්වක් පමණ උස දියෙහිගැලී සිටියේය. එපමණම උද්ගතව සිටියේය. ඒ විනතකපර්වතය සිසාරා එක්දහස්තුන්සියදෙළොස්යොදුන් දෙගව්වක්පමණ උසඇති අශ්වකර්ණපර්වතය පිහිටියේය. එසින් සසියපණස්යොදුන් එක්ගව්වක් පමණ දියෙහිගැලී සිටියේය. එපමණම උද්ගතව සිටියේසි.

මහාමෙරුපර්වතරාජයාගේද යුගන්ධරාදිවූ සප්තකුලපර්වතයන්ගේද අතුරෙන් සීදන්තසමුද්‍රයෝ පිහිටියාහුය. එම සමුද්‍රයන්හි ජලය ඉතා සියුම්ව මොණරපිලක් දමුවත් එය ගිලීයන හෙයින් එම සමුද්‍රයන්ට සීදන්තසමුද්‍රයෝයයි නම්වූහ. මහමෙර හා යුගන්ධරපර්වතය අතුරෙහි සුවාසූදහසක් යොදුන් පුළුලඇති සීදන්තසමුද්‍රය පිහිටියේය. එසේම යුගන්ධරපර්වතයද ඊසධරපර්වතයද අතුරෙහි හතළිස්දෙදහසක් යොදුන් පුළුලැති සිදන්තසමුද්‍රය පිහිටියේය. ඊසධරපර්වතයද කරවීකපර්වතයද අතුරෙහි විසිඑක්දහසක් යොදුන් පුළුලැති සිදන්තසමුද්‍රය පිහිටියේය. මේ පිළිවෙළින් අශ්වකර්ණසමුද්‍රය දක්වාම පර්වතය ජලමට්ටමෙන් උඩට තිබෙන උසප්‍රමාණයට ඒ ඒ සිදන්තසමුද්‍රයන්හි පුළුලබැව් දතගතයුත්තේය, තවද:- මහමෙර පටන් අශ්වකර්ණපර්වතය දක්වාම වූසීදන්තසාගරයන්හි සප්තකූටපර්වතයෝ අනුපිළිවෙළින් මිටිව වෙදිකාකාරයෙන් පිහිටියාහුය. එයින් යුගන්ධරපර්වතය මුදුනෙහි සතරවරම් රජුන්ගේ වාසභවනවූ චාතුර්මහාරාජිකනම් දිව්‍යලොකය පිහිටියේය. ඒ සිවුමහරජය එක්සිය අටපාදයකින් යුක්තවූ සත්විසිමහනක්ෂත්‍රයින්ද, දෙලොස්රාශීන්ද, නවග්‍රහයන් ගෙන්ද යනමේ ආදිවූ බොහෝ තාරකා විමානයෙන් ගැවසීගත්තේය.

එයින් චන්ද්‍රමණ්ඩලය අයම්විතරින් උසින් උනු පණස් පණස් (49) යොත්නක් පමණය. වටින් එක්සියසත්සාළිස්යොදුන් පමණය. මේ චන්ද්‍රවිමානය ඇතුළෙන් ඉන්ද්‍රනීලමාණික්‍යමයවිය. පිටතින් රිදීමයවිය. එසේහෙයින් ඇතුළතින්ද පිටතින්ද සිහිල සමවිය. සූර්‍ය්‍යමණ්ඩලය අයම්විතරින් උසින් පණස්පණස්යොදුන් පමණවිය වටින් එක්සියපණස්යොදුන් පමණවිය. ඇතුළෙන් රන්වන්පැහැ ඇත්තේය. පිටතින් පබළුවන්පැහැ ඇත්තේය. එසේහෙයින් ඇතුළෙනුදු පිටතිනුදු උෂ්ණමවිය. මෙසේ චන්ද්‍රසූර්‍ය්‍ය දෙදෙන ගිම්හන් හිමන් වසන් යන තුන්ඍතුවම අජ ගජ ගො යන තුන්වීථියෙහි හැසිර පූර්වාපර දක්ෂිණ උත්තර යන සතරදීපයෙහි දෙදහසක් දිවයින්වලින් තුණක් අඩිකලෙස දහසක් දිවයින්වලට එකවිටම ආලොක පතුරුවා සියවිමන්හි බබලන්නාහුයි. චාතුර්මහාරාජිකයෙන් දෙසාළිස්දහසක් යොදනින් මත්තෙහි මහමෙර මුදුන දසදහසක්යොදුන් අයම්විතර ඇති නොයෙක් දිව්‍යසම්පත්තින් බබලන්නාවූ තව්තිසාභවනය පිහිටියේය. මේ දෙදෙව්ලොවම චක්‍රවාට පරියන්තය දක්වා පිහිටියේය. තව්තිසාදෙව්ලොව පටන් දෙසාළිස්දහස් දෙසාළිස්දහස් යොදනින් මත්තෙහි යාමදිව්‍යලොකය, තුෂිතදිව්‍යලොකය, නිර්මාණරතීය, පරනිර්මිතවසවර්ත්තියයි මෙසේ අනුක්‍රමයෙන් මතු මත්තෙහි කාමාවචර සදිව්‍යලොකයම පිහිටියේය.

සටඅජටාකාශමත්තෙහි නවලක්‍ෂසැටදහසක්යොදුන් බොලඇති වාපොළොව පිහිටියේය. එම වාපොළොව මත්තෙහි සාරලක්‍ෂඅසූදහසක් යොදුන් බොලඇති ජලපොළොව පිහිටියේය. ඒ ජලපොළොව අනන්තාපරියන්ත හැමසක්වළටම ආධාරව පැතිර සිටියේය. ජලපොළොව මුදුනෙහි පිහිටියාවූ සියලු සක්වළවල් පාංශුජලශෛලාදියෙන් මඳක් නබා පිරූ පාත්‍රසමූහයක් වටින් වටගසා දියෙහිටතැබූවාක්මෙන් පිහිටියෝය. එයින් සක්වළ තුනක් එක්වූතැන්අතර තුනැස්වූ අවකාශයන්හි ලෝකාන්තරික නරකය අප්‍රමාණව පිහිටියේය. විෂයක්‍ෂෙත්‍ර- ආඥාක්‍ෂෙත්‍ර- ජන්මක්‍ෂෙත්‍රයයි කියනලද ත්‍රිවිධ බුද්ධක්‍ෂෙත්‍රවූ ඒ හැමසක්වළවල සලපොළොවෙහි පටන් බ්‍රහ්මාණ්ඩය දක්වා වටින් චක්‍රවාටපර්‍ය්‍යන්තව මේ අතුරෙහි පිහිටි ධාතු ජීවමූලාදීවූ පෘථිවිපර්වතවීප වෘක්‍ෂලතාදෙව බ්‍රහ්මභවනාදිවූ සියලු වස්තූන්ම සාධාරණවූවත් ඒහැම සක්වළින් මේ මඟුල්සක්වළ ගුණානුභාවයෙන් උතුම්වන්නේය. සියලු අර්ථයෙනුදු වැඩිතරම් වූයේය. මේ සක්වළෙහිත් යට එක් ලක්‍ෂ විසිදහසක්යොදුන් ඝනකඩබොල්සලපොළොව. එක්ලක්‍ෂ විසිදහසක් යොදුන් ඝනවූ පස්පොළොව ධරාගෙණ පැතිර චක්‍රවාටපර්වතය වටින් උද්ගතව සිටිනේය. ඒ සලපොළොවත් පස්පොළොවත් එක්ව දෙලක්‍ෂසතළිස්දහසක් යොදුන් ඝනකඩබොල් මහපොළොවයයි ලොකප්‍රසිද්ධවිය. එහි මුදුනෙහි සුවාසූදහසක් යොදුන් ගැඹුරුවූ මහාසමුද්‍රය වටින් සතිස්ලක්‍ෂදසදහස් තුන්සියපණස්යොදුන් පමණවූ සක්වළගබ පැහැර සිටිනේය. ඒ සමුද්‍රය අතරතුර පිහිටි සතරමහාවීපයෙන් එකි එකී දිවයිනක් පිරිවරා පන්සියයක් පන්සියයක් කොදෙව් බැගින් දෙදහසක් කොදෙව් පිහිටියේය. එයින් සකටසණ්ඨානවතුනැස්වූ මේ ජම්බුද්වීපය අයම්විත්ථාරින් දසදහසක් දසදහසක් යොදුන් පමණ ඇත්තේය. ආදාස සටහන්වැ වටවූ අපරගොයානය අයම්විත්ථාරින් සත්දහස් සත්දහස් යොදුන් පමණ ඇත්තේය. පීඨ සටහන්ව සතරැස්වූ උතුරුකුරුදිවයින අයම්විත්ථාරින් අටදහස් අටදහස් යොදුන් පමණ ඇත්තේය. අඩ්ඩචන්ද්‍රසටහන්ව දෙකොන්වූ පූර්වවිදෙහය අයම්විත්ථාරින් සත්දහස් සත්දහස් යොදුන් පමණ ඇත්තේය. පිරිවර පන්සියයක් පන්සියයක් දිවයින් හා සමග වෙනවෙනම ඒ සතරදිවයින වසන මනුෂ්‍යයන්ගේ මුහුණුත් ඒ ඒ සටහන්මවිය.*

* සාරසඞ්ග්‍රහ- ජිනාලඞ්කාර වර්ණනා- සද්ධර්මරත්නාකරය යන පොත්වලින් ගන්නාලදී.

3 දහම් සිතුරුවනට-වැඩිවූ*වතෙක් තුන්ලොවමනැත්
දහම්සොඬ නරනිඳු-ඉන්මය†රකුසා¶ කටටපැන්නේ

4 වටුපැටිව දෙගුරුන්-නොහිවුද ලැව්ගිනි එනුබලා×
කලසත්කිරිබෙලෙන්-සිටපිගිනි ගංතෙරටපත්මෙන්‡

3 දහම්සිතුරුවනට; සද්ධර්මලක්ෂණචින්තාමාණික්‍යයට; වැඩිවූ, (අධිකබවයෙන්) අධිකවූ; වතෙක්, වස්තුවෙක්තෙම; තුන්ලොවම, ත්‍රිවිධලොකයෙහිම; නැත්, අවිද්‍යමානවේ; දහම්සොඬනරනිඳු, ධර්මසෞණ්ඩනම් නරෙන්ද්‍රයා; රකුසා, රාක්ෂසයාගේ; කටට, මුඛාභ්‍යන්තරයට; පැන්නේ, පතිතවූයේ; ඉන්මය, ඒ හෙතුකොට ගෙනමැයි.

(3 භා:) පෙරදඹදිව්තලෙහි දහම්සොඬනමින් රජෙක් ඇතිවිය, ඒරජහට ධර්මපදයක් පමණවත් අසන්ට කෙනෙක්නැතිවිය. ධර්මයක්කියනකෙනෙකුට දහසේ පටන් කොටිප්‍රකොටියදක්වාද, යුවරාජ්‍යයේ පටන් ශ්වෙතඡත්‍ර සහිත මුළුරාජ්‍යයද දී දූසභාවයෙහි සිටගෙන ධර්මය අසනබැව් කියා නුවර බෙරලමාත් ධර්මදෙශකයෙකු නොලැබ ශොකාග්නියෙන් තැවිසිට ධර්මයෙන් තොරවූ රාජ්‍යයෙන් කිනම් ප්‍රයොජනදැයි සලකා අමාත්‍යයන්ට රාජ්‍යය පාවාදී ධර්මයසෙවීම පිණිස වනයටගියකල්හි ඒබැව්දත් ශක්‍රදෙවෙන්ද්‍රතෙම රාක්ෂසවෙසයෙන් පැමිණ කරුණු විචාරාසිට "තා මට ගොදුරුවන්නොහිතම් මම තට ධර්මයක් දෙසමි"යි කීයේය. ඊට සතුටුවූ දහම්සොඬරජතෙම "ධර්මයක්දෙසව මම එවිගස තාගේ මුඛයට පතිමි"යි ගිවිසගෙන පර්වතමුදුනට නැගීසිට භියමයලෙස පැන්නේය. එවිට රාක්ෂසයා එම රාක්ෂසවෙශය අත්හැර ශක්‍රදෙවෙන්ද්‍රවිලාශයෙන් පෙණීසිට රජ දූතින් වඩා දෙව්ලොවට ගෙනගොස් දම්දෙසා පහදවනලද්දේය.

4 වටුපැටිව, (අපමහබෝසතානන්) වටුකුරුල්ලෙක්ව; දෙගුරුන්, (ස්වීය) මවුපියන්විසින්; නොහිවූද, නොහිවනලද්දවූද; ලැව්ගිනි, දවාග්නිය; එනුබලා, එනනියාව නිරීක්ෂණයකොට; කල, කරනලද්දවූ; සත්කිරිබෙලෙන්, සත්‍යක්‍රියාබලය හෙතුකොටගෙන; ගිනි, වහ්නිය; ගංතෙරටපත්මෙන්, ගඞ්ගාතීරයට ප්‍රාප්තවූවාසේ; සිටපි, ශමිතවිය; හෙවත් නැවැත්තේය

3 *වඩිනා-හැම- †ඉන්වද-ගැම- ¶රකුස්සා-හැම-
4 ×නොහිව්ලැව්ගිනිඑනුබලබලා-හැම- ‡සිටපිගංතෙරට පත්වූමෙන්-හැම-

5 මහාවනවිදුවන්-අවිදුන්මැදෙහි පාතඅවියත්
අඳදනහමදපණ-ඔවුන්වත බලන්නට දෙනවැනි

6 සුදනන්කොපවුව-දුදනන්මෙත්වුවද* නොතිබේ
මදක්කල් තිබුනත්-ඉන්වන අවැඩක් වැඩක්ද† නැත්

7 ජිවිසහජවතහභස-×දිවග් ජයඟති බුදුකුරුවිසින්
තිරිසන්ව උපනත්-බෝසතුන් සිතුදෙසක් සිදුවේ

---

4 භා:- අපමහබෝසත්තෙම කර්මවශයෙන් එක්කලෙකදී වටුකුරුල්පලක්ව ඉපිද මව්පියන්විසින් කදල්ලෙහිලා රක්නා ලද්දේවේ. එසඳ එක්දිනයෙක්හි ආරණ්‍යයේ ලැව්ගින්නක් අට ගෙන වනය සිසාරා ඇවිලෙමින් එනවිට වටුපැටියාගේ මව්පිය දෙදෙනාම බියවැද පැටියා අත්හැරදමා පලාගියහ. වටුපැටියා ඒදූත කදල්ලෙහි සිටගෙන සත්‍යක්‍රියාකෙලේය. එවිගසම එම ගින්න නිවිගියේය.

5 මහාවන, යහපත්වන්නාවූ; විදුවක්, විද්‍යාවක්; හෙවත් ශිල්පශාස්ත්‍රාදියක්; අවිදුන්මැදෙහි, අඥානපුරුෂයන් මධ්‍යයෙහි; පාත, ප්‍රකාශකරන්නාවූ; අවියත්, අපණ්ඩිතපුරුෂතෙම; (තෙමේ ද) අඳදනහට, අන්ධවූ ජනයාට; ඔවුන්වත, ඔවුන්ගේ වක්ත්‍රය; (මුහුන) බලන්නට, බලනුපිණිස; දපණ, දර්පණයක්, හෙවත් කැට පතක්; දෙනවැනි, ප්‍රදානය කරන්නාක් වැන්න.

6 සුදනන්, සත්පුරුෂජනයන්ගේ; කොපවුව, කොපයක් වුවත්; දුදනන්, දුර්ජනයන්ගේ; මෙත්වුවද, මිත්‍රභාවයක්වූවත්; නොතිබේ, එම කොප මෛත්‍රීදෙක නොපවත්නේය; (සථිරනොවන්නේය (යම්හෙයකින්) මදක්කල්, සවල්පකාලයක්; තිබුනත්, පැවැත්තේනමුත්; ඉන්වන, ඒ හෙතුවෙන් වන්නාවූ; අවැඩක්, අනභිවෘද්ධියක්ද; වැඩක්ද, අභිවෘද්ධියක්ද; නැත්, නැත්තේය.

6 භා:- සත්පුරුෂයන්ගේ කෝපයද අසත්පුරුෂයන්ගේ මිත්‍රභාවයද ස්ථිරනොවේ. වහා වෙනස්බවටම යේ. යම්හෙයකින් මඳකලක් පැවැත්තේද සත්පුරුෂයාගේ කොපයෙන් අවැඩක් හෝ අසත්පුරුෂයාගේ මිත්‍රභාවයෙන් වැඩක් හෝ නොවන්නේමය.

---

6 *මිත්වුවද-හැම- †වැඩක්ම-හැම-
7 ×රතහසරිවිසමග-හැම-

8 රුරුමුවරද කල-මහදන කුමරු ගඟින් ගොඩලා,
බඹරදු දම්දෙසා-සුවඅබය ලැබ දෙවි*සත්හට.

9 ඇමරසයටම වැඩි-රසයෙකි සුරන් බුදිනේ†
ඊටත් වැඩිරසෙකි-තමාදරුවන් හැනු සුබොජුන්.

---

7. ජවනහස, ජවනහංස වූ බොධිසත්වතෙම; රිවිසහ, සූය්‍ය්‍යීයා හා සමගින්; දිවත්, ධාවනයකොටත්; බුදුකුරු විසින්, බුබාඞකුර හෙයින්; ජයගති, ජයග්‍රහණය කොළේය; තිරිසන්ව, තිරශ්චීනව; උපනත්, උපනනකවූයේද; බෝසතුන්, බොධිසත්වයන් විසින්; සිතූදෙයක්, සිතනලද්දක්; ( ම ) සිදුවේ, සිඬවන්නේයි.

භා: බොධිසත්වතෙම එක්කලෙක්හි ජවන හංසයොනි යෙහි උපන්නේය. හෙතෙම වේගයෙන් සූය්‍යීයාහා සමග ධාවනය කොට සූය්‍යීයාගේ ගමන්වේගය පැරදවිය යනු පූර්වප්‍රවෘත්තියකි. වේග වත් ගමන්ඇති සූය්‍යීයාද පැරදවූයේ බොධිසත්ව බලය හෙතුකොට ගෙනම මුත් අන්‍ය ශක්තියකින් නොවේ. ( විස්තර ජවන හංස ජාත කයෙන් දතයුතු, )

8 රුරුමුවරදකල, ( බෝසත්හු ) රුරුනම් මෘගරාජත්වූ කල්හි; මහදන කුමරු, මහාධන නම් රාජකුමාරයා; ගඟින්, ගඞ්ගා යෙන්; ගොඩලා, පරතීරප්‍රාප්තකොට; බඹරදු, බ්‍රහ්මදත්තරාජයා හට; දම්දෙසා, ධර්‍මදෙශනාකොට; සුව, සුවයහා; අබය, නිර්‍භය භාව යද; සත්හට, (නාගරික සකල) සත්වයන්ට; ලැබදෙවි, ලබ්ධකරවීය

භා: අපමහ බෝසත්හු පෙර රුරුනම් මෘගරාජයෙක් වූසේක් ගඟින් එතරවිය නොහැකිව සිටි මහාධන කුමාරයා තමාගේ පිටනත්වා ගඟින් එගොඩ කබා නැවත බ්‍රහ්මදත්ත රාජයාට ධර්‍මය දෙශනාකොට නුවර සියලුසත්වයන්ට සැපය හා නිර්භය භාව යද ලබාදුන්නේය.

9. සුරන්, දෙවියන් විසින්; බුදිනේ, වළඳනු ලබන්නේ; ඇම රසයවම වැඩි, (ලොව ඇතිකාක්)සියලු රසයන්ටම අධිකවූ;රසයෙකි, රසයෙක්වේ; (අමාරසයවේ යනුයි) තමා, තමන්ගේ; දරුවන්, දරක යන් විසින්; ( පුත්‍රයන්විසින් ) හැනු, අනනලද්දවූ; සුබොජුන්, මනා භොජනය තෙම; ඊටත්වැඩි, ඒදෙවියන්ගේ අමෘරසයටද අධිකවූ; රසෙකි,රසයක්වේ.

---

8 * ලැබවියේ-බොහෝ 9 † නොමැති රසයෙකි සුරන් බුදිනේ-වැඩි

10 දෙගුරුන් විසින් තම-දරුවන්ට දෙන නොමඳ දනනම්,
විසතුන් සබාමැද-ඉන්ට ඉදිරිව සිල්ප දෙනුමැයි.

11 නදසඳ කැන් සඳුන්-නොමඳ හැමකල් සිසිලවනුමෙන්,
උතුම්ම සිසිලයෙකි-තතෙයි තමදරුවන් වැකෙනවා.

12 දෙගුරුන්ටත් වඩා-දරුවන්ටමයි දනන්*සෙනෙහස,
මෙලොවත් රැකමලත්-සගමොක් දෙනබැවින් කරවපින්.

---

9 හා: ) සුරලොව දෙවියන් විසින් නිතර වළඳනු ලබන අමෘත රසයතෙම ලොකයෙහි විද්‍යමානවූ සියලුරසයන් අතුරෙන් ලෞකිකවූ ශ්‍රේෂ්ඨ රසය වේ. ඊටත් උතුම්වූ රසයනම් තමාගේ දරුවන් විසින් අනතලද ආහාරයම වන්නේය.

10 දෙගුරුන් විසින්, මව් පිය දෙදෙන විසින්; තමදරුවන්ට, ස්වීයපුත්‍රයන්ට; දෙන, දියයුතුවන්නාවූ; නොමඳ දනනම්, නානාවිධ වස්තුවනම්; වියතුන් සබාමැද, ව්‍යක්ත ජනයන්ගේ සභාමධ්‍යයෙහි; ඉදිරිවඉන්ට, අභිමුඛව සිටිනු පිණිස; හෙවත් සම්මානලාභය පිණිස; සිල්ප දෙනුමැයි, ශිල්පයන්දීමම වේ.

මවුපිය දෙදෙන විසින් තමන්ගේ දරුවන්ට පරිත්‍යාග කරනුලබන්නාවූ එකම ශ්‍රේෂ්ඨ ධනයනම් සභාමධ්‍යයෙහි ඉදිරිව ඉදීමට සාමර්ථ්‍යය ඇතිකරන ශිල්පශාස්ත්‍රයක් දීමම වන්නේය.

11 නද, ආනන්දකරවූ; සඳකැන්, චන්ද්‍රකාන්තියද; සඳුන්, චන්දනද; හැමකල්, සියලුකාලයෙහි; නොමඳ, බොහෝවූ; සිසිලවනුමෙන්, ශීතලවන්නාක්මෙන්; තතෙයි, තාත්තේයයි; වැකෙන, (තමාගේ කාන්ති) පතිතවන්නාවූ; තමදරුවන්, තමන්ගේ පුත්‍රයන් පිළිබඳවූ; වා, වචනයතෙම; උතුම්ම, ශ්‍රේෂ්ඨවූම; සිසිලයෙකි, ශීතලයක් වේ.

12 දෙගුරුන්ටත්වඩා, මාතෘපිතෘන්ටත් වැඩියෙන්; දනන්, ජනයන්ගේ; සෙනෙහස, ප්‍රේමය; හෙවත් දෘඪතර ආලය; දරුවන්ටමයි, පුත්‍රයන් කෙරෙහිමයි; ( එමෙන් ) මෙලොවත්, ඉහාත්මභාවයත්; රැක, රක්ෂාකොට; මළත්, මැරුනේද; හෙවත් පරලොකයෙහිත්; සගමොක්දෙනබැවින්; ස්වර්ගමොක්ෂසම්පත් ප්‍රදානය කරන හෙයින්; පින්, පුණ්‍යය; කරව්, රැස්කරව්.

---

12 * දනෝ-හැම

13 සාව අප බෝසත්-සක්බමුණාට දෙනුව ඇඟමස්,
පිනූසඳ ගින්නම-සුරිඳුගෙන සඳ මැදෙහි ඇන්දේ.

14 මුනිඳුන් ගුණමහිම-මෙලොවදිම දනෙයි නිදිගත් විට,
යක්බූ ඔබාගත-සුගතසිහිකළ බියබැහැරයේ.

---

12 හා: මනුෂ්‍යයෝ තමන්ගේ මව්පිය දෙදෙනාට වැඩිසෙන් සපිය පුත්‍රයන් විෂයෙහි සෙනහස පවත්වන්නාහුය. කුශලකර්මතෙම සත්ත්වයා මෙලොවදිත් ආරක්ෂාකොට පරලොවදිත් ස්වර්ගමෝක්ෂ සම්පත්ති ප්‍රදානය කරන්නේය. එහෙයින් මවුපියන් කෙරෙහි පවත්නා ස්නෙහයමෙන් ඉහාත්මභාවය ගැන මදවශයෙන්ද, දරුවන් කෙරෙහි පවත්නා අධිකස්නෙහය මෙන් පරලොව විපාකදෙන කුශලයගැන අධිකවශයෙන්ද සැලකියයුතුය.

13 අපබෝසත්, අපගේ බොධිසත්ත්වයන් වහන්සේ; සාවා, ශශකව; ඇඟමස්, ශරිරමාංශය; සක්බමුණාව, ( දන්ඉල්ලාපැමිණි ) ශක්‍රබ්‍රාහ්මණයාට; දෙනුව, දානයකරනු පිණිස; ගින්නට, වහ්නි මධ්‍යයට; පිනූසඳ, පැන්නකල්හි; සුරිඳු, සුරෙන්ද්‍රතෙම; ගෙන, ( ඔහු ) ග්‍රහණයකොට; සඳමැදෙහි, චන්ද්‍රමණ්ඩල මධ්‍යයෙහි; ඇන්දේ, ( ශශ රූපය ) ලක්ෂිත කෙළේය.

හා: අපමහ බෝසතාණන් වහන්සේ පෙරකළ කර්ම විසින් ශශයොනි යෙහි ජනමලැබ සාවෙක, වඳුරෙක, සිවලෙක යන යහ ලුවන් තුන්දෙන හා එක්ව සිල්රකිනා අවදියට ඔවුන්ගේ සිල් විම සනු පිණිස මහලු බමුණු වෙසක් මවාගෙන ශක්‍රයා අවුත් කුසගින්න ප්‍රකාශකොට ආහාරයක් ඉල්ලූවිට දන්දීමේ අභිලාෂය පූර්වයෙහි සිව තරම් පුරුදුකළ ඒසාවා ඇඟමස්දී ඔහු සතුටුකරනු කැමැත්තේ දරදසක් එක්කරවා ගිනිදල්වවා එහි පනිනවිට ශක්‍රතෙම ස්වකීය විලාශයෙන් සැරසී ශශකයා වඩාගෙන දෙව්පුරයටම ගොස් ශශක යාගේ රූපයසියලු ලෝකයාට පෙණෙනසේ අඳුන් කුරපව් මැඩගස් සුසින් චන්ද්‍රමණ්ඩලයෙහි ඇඳ තැබීය

14 මුනිඳුන්, සර්වඥයන්වහන්සේගේ; ගුණමහිම, ගුණානුභාවය තෙම; නිදිගත්විට, නිද්‍රාපගතකල්හි; මෙලොවදිම, ඉහලෝකයෙහිදීම; දනෙයි ( තමතමන්ටම ) ජානනයවේ; ( කෙසේද ) යක්බූ, යක්ෂයන් හා භූතයන්; ඔබාගත, මර්දනයකොට ගත්කල්හී; සුගත, සර්වඥයන් වහන්සේ; සිහිකළ, අනුස්මරණය කළකල්හි; බිය, යක්ෂභූතභීතිය; බැහැරයේ, පහවන්නේය.

15 ඉසුරෙන් පිරිහුනත්-සුදනෝ තමාගුණ ඩුනොකෙරෙත්,
බිඳුනත් රන්බඳුන-ඇතිබර අගය අඩුනොවන මෙන්.

16 සුදනෝ තමසිරිත්-කලවුන් තමන් ලෙසම සලකත්,
පහනින් ගත්පහන්-එකලෙසම බබලන විලස්නෙන්.

17 මුතුමිණිකනාවත්-නොමඳ ලැබ පලඳිනත් සිරලෙස්,
ගුණනුවණ සිප්දත්-දරුවන් ලබනු වැඩිපෙම් වඩයි.

---

14 හා: සර්වඥයන් වහන්සේගේ නිර්මල සාරගුණානුභාවය නිද්‍රාවට පැමිණිකල්හි පවා සකලසත්වයන්ට මෙලොවදීම දුනෙන්නේය. කෙසේදයත්? යක්‍ෂභූතපිශාචාදීන් විසින් මනුෂ්‍යයන් නිදිමේදි පීඩාකරනකල්හි බුදුගුණ සිහිකළවිටඑම චණ්ඩවූ අමනුෂ්‍යයෝ සිත්බිය ගෙන වහාම ඉවත්වයෙති.

15 සුදනෝ, සත්පුරුෂජනයෝ; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යයෙන්; පිරිහුනත්, පරිහීනවූවාහු නමුත්; තමා, තමන්ගේ; ගුණ, (කාරුණ්‍යමුදිතාදී) ගුණයන්; අඩුනොකෙරෙත්, ඌනනොකෙරෙත්; රන්බඳුන, සුවර්ණ භාජනය; බිඳුනත්, භින්නවූයේනමුත්; ඇති, (එහි) විද්‍යමාන වන්නාවූ; බර, භාරප්‍රමාණයහා; අගය, (සුවර්ණයෙහි) අර්ඝය; (වටිනාකම) අඩුනොවනමෙන්; ඌනනොවන්නාක්මෙනි.

16 සුදනෝ, සත්පුරුෂජනයෝ; තම, තමන්ගේ; සිරිත්, ශෝභන චාරිත්‍රයන්; කලවුන්, (පරිචිත) කළාවූ ජනයන්; තමන් ලෙසම, තමාසේම; සලකත්, කල්පනාකෙරෙත්; පහනින්, ප්‍රදීපයෙන්; ගත්, ග්‍රහණය කළාවූ; හෙවත් දල්වාගන්නාලද්දවූ; පහන්, ප්‍රදීපයන්, එකලෙසම, (ආලෝකයෙන්) ඒකාකාරයෙන්ම; බබලන විලස්නෙන්, බබලන්නාක්මෙනි.

17 මුතු, මුක්තාය; මිණි, මාණික්‍යය; කනා, සුවර්ණයයන්නමසින් (නිර්මිත) වූ; වත්, වස්තූන්; හෙවත් ආභරණයන්; නොමඳ, බොහෝසේ; ලැබ, ලබාගෙන; සිරලෙස්, ශ්‍රීීයෙහි; පලඳිනත්, පිලඬිනය කරතත්; ගුණ, (කාරුණ්‍යමුදිතාදී) ගුණය; නුවණ, ප්‍රඥායයනමෙයින් යුක්තවූද; සිප්දත්, ශිල්පයන් දන්නාවූද; දරුවන්, පුත්‍රයන්; ලබනු, ලැබීම ගතම; වැඩිපෙම්, අධිකවූ ප්‍රේමයක්; හෙවත් යථොක්තප්‍රකාර ආභරණයන් දැරීමෙන් ජනිතප්‍රේමයටද වඩා අධිකවූ ප්‍රේමය; වඩයි, වර්ධනයකරයි.

හා ) මුක්තා, මාණික්‍ය, සුවර්ණ යනාදියෙන් තනනලද යහපත් ආභරණයන් හිසේ පැළඳීමෙන් ලබන ප්‍රීතියට වඩා ගුණනුවණ ඇත්තාවූද, ශාස්ත්‍රදන්නාවූද දරුවන්ලැබීමෙන් සත්වයන්ගේ චිත්තයට හටගන්නා ප්‍රීතිය ඉතාමහත් වන්නේය.

18 සවණ පිනවනසව්-නදට තුටුවන දනෝ ලෙව්හි,
තමදරුවන් බොළඳ-වදන් නොහැසූ නෑසූ එදනෝ.

19 තමපාපිටෙහි උන්-රුපුන්නොනසා රකිති උතුමෝ,
අඳුරුරුපු පාන්කඳු-මුලඅඳුරු නොමදුරු කරනමෙන්*

20 උතුමෝ දුදන බස්-නොහසත් සතන් බස්මිස,
සුගඳ දුගඳ දෙකට-සතුටු නොසතුටු ගහණවනමෙන්.

---

18 සවණ පිනවන, කණියන් ප්‍රීණනය කරවන්නාවූ; සව් නදට, ( ගීත භෙරිආදී ) සිල්ලුනාදයන්ට; තුටුවන, සන්තුෂ්ටවන් නාවූ; ලෙව්හි දනෝ, ලොකවාසී ජනයෝ; තම දරුවන්; ස්වීය දරකයන්ගේ; බොළඳ වදන්, සුරතල්වචනයන්; නොහැසූ, ශ්‍රවණය නොකොළෝද; එදනෝ, ඒජනයෝ; නෑසූ, ( ප්‍රියතර නාදයක්) නොඇසුවෝ වෙත්.

භා: ලොකවාසී සත්වයෝ ප්‍රියතර නෘත්‍යගීතාදි ශබ්දයන් කොපමණ ඇසුවත් ප්‍රිය ශබ්දයක් ශ්‍රවණය කළාහුනම් නො වෙත්. ස්වකීය දරුවන්ගේ බොළඳ සුරතල් බස් ශ්‍රවණය කිරීමෙන්ම මධුරනාද ශ්‍රවණය කළාහුනම් වන්නෝය.

19 උතුමෝ, උත්තමයෝ; තමපාපිටෙහි, තමන්ගේ පාදසමීප යෙහිදු; උන්, උපවිෂ්ටවූ; රුපුන්, ශත්‍රූන්; නොනසා, නෂ්ටනොකොට; රකිත්, රක්‍ෂාකෙරෙත්; අඳුරුරුපු, අන්ධකාරයට ශත්‍රැවූ; පාන්කඳු, ප්‍රදීපස්කන්ධයතෙම; මුල, ( එම ප්‍රදීපස්තම්භයාගේ ) මූලස්ථානගතවූ, අඳුරු, අන්ධකාරය; දුරුනොමකරනමෙන්; බැහැර නොකරන්නාක් මෙනි.

භා: උත්තමයෝ තමාලඟසිටින්නාවූද සතුරා දුරුනොකොට ඔහුට පිහිටවීමෙන් රක්‍ෂාකෙරෙත්, ( කුමක්වැනිදැයි යතහොත්.) අන්ධකාරය නසා දුරුකරන පහන්ගස තමාගේ මුලතිබෙන අන්ධකා රය දුරුනොකරන්නාක්මෙනි.

20 උතුමෝ, උත්තමයෝ; සතන්බස් මිස, සත්පුරුෂයන්ගේ තෙපුල්විනා; දුදනබස්, දුර්ජනයන්ගේ තෙපුලන්; නොහසත්, ශ්‍රව ණය නොකෙරෙත්;කෙසේද? සුගඳ දුගඳදෙකට,සුගන්ධ දුර්ගන්ධයට; සතුටුනොසතුටුවන්නාවූ, සන්තුෂ්ටවන්නාවූද අසන්තුෂ්ටවන්නාවූද; ගහණමෙන්, නාසිකාව මෙනි.

---

19 * මුළඅඳුරු නුදුරුකලාක්මෙන්-ඇතැම්.

21 ඇසුරුවන් සතසිය-සියපණසෙ රකිණා සුදනහට,
මොක්දකිනා තුරුම+-දුකක්නොමවේ ලෙව්සතන්ගෙන්†

22 ඇම සැපසවම වැඩි-සැපතෙකි දනුව දැකුම උතුමන්,
ඊවත්වැඩි සැපෙකි-නොදැකිම කලෙකත් දුදනන්.

23 උතුමෝ නොලැබ ලබ-වැඩකෙරෙති ලොවෙහි
නිවතුන්වත්,
නොයෙක් පලබර තුරු-නද පලදි ‡ සත රකින එව්.

---

20 හා: නායිකාව තමන්ට ආඝ්‍රාණයවන සුගන්ධය ආදරයෙන් ඉවසන්නේය. ආඝ්‍රාණයවන දුර්ගන්ධය නොඉවසා බැහැර ලන්නේය. එමෙන්ම උත්තමයෝ සත්පුරුෂයන්ගේ වචනයක් ඇසෙනවිට ආදරයෙන් අසත්. දුර්ජනයන්ගේ වචනය ඇසෙනවිට එයපිළිකුල්කොට වහාම බැහැරකෙරෙති.

21 ඇසුරුවන්, ආශ්‍රයකරනු ලබන්නාවූ; සියසත, සර්ව සත්ත්වයන්; සියපණසෙ, තමද්විශෙසයින්; රකිනා, රක්ෂාකරන්නාවූ; සුදනහට, සත්පුරුෂජනයන්ට; මොක්දකිනාතුරුම, නිවන්ලබන ජාතිය දක්වාම; ලෙව්සතන්ගෙන්, ලොකවාසී සත්ත්වයන්කෙරෙන්; දුකක් නොම වේ, දුඃඛයක් නොවන්නේමය.

22 උතුමන්, උත්තමජනයන්ගේ; දැකුම, දර්ශනය තෙම; ඇම සැපසටම වැඩි, ලෞකික සියලු සම්පත්තියටම අධිකවූ; සැපයෙකි, සම්පත්තියෙකැයි; දනුව, ඥානයකරව; කලෙකත්, (කිසි) කාලයෙක්හි වත්; දුදනයන් නොදැකීම, දුර්ජනයන්ගේ දර්ශනය නොවීම; ඊටත්වැඩි, ඊටදඅධිකවූ;හෙවත් උත්තමයන්ගේ දර්ශනයෙන් ජනිත සුඛයටද අධිකවූ; සැපයෙකි, සම්පත්තියෙකි.

23 උතුමෝ, (කරුණාරස පරිපූර්ණවූ) උත්තමයෝ; ලබ, ලාභයක්; නොලැබ, නොලබාම; හෙවත් ස්වීය ධනයහෝ කාලය වෙයද වියවින්ම; ලොවෙහි, ලොකයෙහි; නිවතුන්වත්, නිර්ධන ජනයන් වද පවා; වැඩකෙරෙති, අභිවෘද්ධිය සලස්වන්නාහුය; නොයෙක්, අනෙක විධවූ; පල, ඵලයන්ගෙන්; බර, භරිතවූ; තුරු, වෘක්ෂයන්; නද, සන්තුෂ්ටියෙන්; පලදී, ඵලදානයකොට; සත, සත්ත්වයන්; රකින එව්, රක්ෂා කරන්නාක්වැනිය.

---

21 + මොක් දකිනදතුරු- 21 † සව්සතන්ගෙන්- ඇතැම්.
23 ‡ සද පලද-තැම්.

24 මසුරුදද දන දන+ -සුදනතටපත් දනට වැඩවේ,
ඝාරදිය මේ රදුට-හසුව සතහට අමාවනමෙන්.

25 අදමින් † සව්ඉසුරු-නොමද ලැබෙනත් නුවනැතියෝ,
අනුන් නසා ලබන-ඉසුරු වසුරු අසුරු සලකත්.

26 ගුරු දෙගුරු නෑසිය-සුතඹුන් රකින උතුමෝ, ‡
මෙලොව යසමඟුලුත්-ලබත් පරලොව සුවද සගමොක්.

---

24 මසුරු, මාත්සය‍්‍යීයුක්තාවූ; දදදන, දශධජනයන්ගේ; දන, ධනයතෙම; සුදන, සාධුජනයන්ගේ; අතටපත්, හස්තප්‍රාප්තවූයේ; දනට, (ලොකවාසී) ජනයන්ට; වැඩවේ, වෘඞ්දෘයක වන්නේය; ඝාර දිය, (සාගරයෙහිවූ) ක්ෂාර ජලය; මේරදුට, මේඝරාජයාට; හසුව, ලබ්ධව; සතහට, සත්වයාට; අමාවනමෙන්, අමෘතයක්සේ වන් හෘක්මෙනි.

හා: සමුද්‍රගත කරදිය කිසිවෙකුවත් පානයකළ නොහැකි වන ලවන ජලයෙකි. එබැවින් සමුද්‍රයෙහි තිබියදී කිසිවෙකුටත් එයින් ප්‍රයෝජන නැත්තේය. එම ජලය මේඝය විසින් අහසටගත් කල්හි මධුර රසයුක්තකොට වර්ෂාකරනු ලැබේ. එවිට ලොකයෙහි අනෙක සත්වයන්ට සුඛදායක මධුර ජලයක්දවේ. එමෙන්ම අඥාන ලොභාබියාගේ ධනයද කිසිවෙකුටත් ප්‍රයෝජන නැති නිස්සාරධන යෙකි. එය ගුණවත් සත්පුරුෂයෙකුගේ අතටපත්වූවිට එයින් ලොකයාට අභිවෘද්ධියක්ම වන්නේය.

25 නොමද, අමන්දවූ; සව්ඉසුරු, සකලෛශ්වය‍්‍යීයන්; අදමින්, අධර්මයෙන්; ලැබෙනත්, ලැබෙත් නමුත්; අනුන් නසා, අන්‍යයන් පෙළා; ලබන, ලබන්නාවූ; ඉසුරු, ඓශ්වය‍්‍යීයතෙම; වසුරු අසුරු, වර්චස් සදෘශයයි; නුවනැතියෝ, බුඞිමත්හු; හෙවත් කරුණා විඥා පණ්ඩිතජනයෝ; සලකත්, කල්පනා කෙරෙත්.

26 ගුරු, ආචාය‍්‍යීය; දෙගුරු, මාතෘ පිතෘ දෙදෙනාය; නෑ, ඥාතිහුය; සිය, ස්වකීය ජනයෝය; සුත, පුත්‍රයෝය; අඹුන්, භාය‍්‍යීාවෝය යන මොවුන්; රකින, රක්ෂාකරන්නාවූ; උතුමෝ, උත්තමයෝ; මෙලොව, ඉහාත්මභාවයෙහිදී; යස, කීර්තිලක්ෂණවූ; මඟුලුත්, මඞ්ගල්‍යයද; පරලොව, පරලොකයෙහි; සගමොක් සුවද, ස්වර්ගමොක්ෂ සුඛයද; ලබත්, ලබන්නාහුය.

---

24 + මසුරුවූ දනාදන-සමහර. 25 † නිදුකින්-හැම.
26 ‡ ගුරුන් දෙගුරුන් හා—නෑසිය සුතඹු රකින සුදනෝ-වැඩි

27 ගුණමකුසතන්හා* -සමග විසුවත් නැණැති සුදනෝ,
මනාගුණනොහරින්-කොසඹතුරතුළ බැඳිමීයමෙන්.

28 කලගුණද රසබස-දෙකම දනගත් නැණැති සුදනෝ,
මිනිස්වෙස් ගෙනවුත්-මෙලොව සතරකිණ සුරතුරුමෙනි·

29 භුවනැතිසෝ සකල-නොවෙත් කොතරම් දුක්සැපවුවත්,
ගැසුවත් තදවේග-පවනින් නිසල සෙල් මෙන්.*

---

27 නැණැති, ප්‍රාඥවූ; සුදනෝ, සාධුජනයෝතුමූ; ගුණමකු, (මෙරමාගේ) ගුණ නසන්නාවූ; සතන්හා සමග, සත්ත්වයන් හා එක්ව; විසුවත්, වාසයකළත්; මනාගුණ, (තමාතුළ පැවැති) ශොභන ගුණයන්; නොහරිත්, අත්නොහරින්නාහුය. (කුමක්මෙන්දයත්) කොසඹ තුර තුළ, කොසඹවෘක්ෂාභ්‍යන්තරයෙහි; බැඳි, බඳිනලද; මීයමෙන්, මධුපටලය මෙනි.

භා: කොසඹරුකනම් තික්තරසයෙන් යුක්ත වූවකි. එම වෘක්ෂවිද්‍රයෙක්හි බඳිනලද මීපටලයෙහිද තික්තරසය ඇතිවිය යුතු නමුත් එසේ නොවී ස්වාභාවික මධුරරසයෙන්මයුක්තවපවතියි. එමෙන්ම සත්පුරුෂ ගුණවතා දුර්ජනයෙකු ඇසුරුකරන්නේද දුර්ජන භාවය නොගෙන තමාගේ සිත්තුළ පැවැති සත්පුරුෂ භාවයම පවත්වමින් දිනෙන් දින වර්ධනයට පමුණුවන්නේය.

28 කලගුණ, කළාවූගුණයද; රසබස, රසවත් තෙපුලද යන; දෙකම, විවිධකාරණයන්ම; දනගත්, ජානනය කළාවූ; (කලගුණ සැලකීම හා එය ප්‍රකාශ කිරීමද යනාදෙකරුණදත්තාවූ) නැණැති, ප්‍රඥ ඇත්තාවූ;සුදනෝ, සාධුජනයෝ තුමූ;මිනිස්වෙස් ගෙන, මනුෂ්‍ය වෙසධාරිව; අවුත්, ආගමනයකොට; මෙලොව, මේ ලෝකයෙහි; සතරකින, සත්ත්වයන් රක්ෂාකරන්නාවූ; සුරතුරුමෙනි, දෙවදුම වැන්නෝයි.

භා: කලගුණයිත්හි දරමින් කලගුණය ප්‍රකාශකරනපුද්ගල තෙම මනුෂ්‍යවෙෂධාරී කල්පවෘක්ෂවැනියයි කීමෙන් යථෝක්ත කාරණවය ලොකයෙහි විද්‍යමානවේනම් එයින්ම ලොකයාගේ ආරක්ෂාවද සැපතද සිතූ පැතූ සම්පත්ද සිඹවෙණිය දතයුතුවේ.

---

27 * ගුණමිතු දනන් හා-බොහෝ

29 * සුනෙර තදපවනින්-නොහැකිළිලසින් මදක්සෙවුම්-කියි

30. විරිදුන් මද වරද-කියනුයේ දකිනහට තමදෙස් ×
කිසිකලෙකත් දුකක්-එකසගවිතරත් නොවේ
දෙලොවින්.

31. උතුමන් ගුණනුවන-කියනුහට දෙලෝ වැඩඅත්වෙ,
එහෙයින් සත්සතන්-ගුණනම නුවන පමණ දක්වත්.†

32. රන්බඳනෙහි කෙසර-තෙල් අඩුනොවී පවතින මෙන්,
උතුමන්හද සපිරි-කුළුණුමෙන්† අඩුනොවී පවතී.

---

29 කොහරම්, කතිප්‍රමාණවූ, දුක්සැප, දුඃඛය හා සෞඛ්‍යය; වූවත්, වූවාහු නමුත්; නුවණැතියෝ, ප්‍රාඥජනයෝ; සසලනොමවෙත්, චඤ්චල නොවන්නාහුය; (කෙබඳුද?) තදවෙග, ඝනබද්ධවෙගවත්වූ; පවතින්, මාරුතයෙන්; ගැසුවත්, ප්‍රහාරදුන්නාහු නමුත්; නිසල, නිශ්චලවන්නාවූ; සෙල්මෙන් ශෛලමෙනි.

30. විරිදුන්, වෛරිජනයන්ගේ; මදවරද, මඳවූවද්‍යයද; කියනුයේ, කථනයකරනපරිද්දෙන්; තමදෙස්, තමාගේ දෙෂය; දකිනහට, සලකනජනයාහට; එකසගවිතරත්, කෙශාග්‍රප්‍රමාණවූද; දුකක්, දුඃඛයක්; කිසිකලෙකත්, කිසිමකාලයෙක්හිත්; දෙලොවින්, උභයලොකයෙන්; නොවේ, නොවන්නේය.

30. භා:-තම්හට විරුඬවූ ජනයාගේ මඳ දෙෂයද ප්‍රකාශකිරීමට උත්සාහදරන්නාක්මෙන් තමාගේ දෙෂය තමාම සලකාගන්නාහට දෙලොවින්ම කිසිදුකක් කිසිකලෙකත් නොවන්නේය.

31. උතුමන්, උත්තමයන්ගේ; ගුණනුවන, ගුණ හා ඥනය; කියනුහට, ප්‍රකාශකරන්නාහට; හෙවත් වර්ණනාකරන්නාහට; දෙලෝ, උභයලොකයෙහි; වැඩ, වෘද්ධියක්; අත්වේ, හස්තප්‍රාප්තවන්නේය; එහෙයින්, එසේ හෙයින්; සත්, සාධුජනයෝතුමූ; සතන්, සත්පුරුෂජනයන්ගේ; ගුණ, ගුණය; නම නුවන පමණ, තමාගේ ඥනප්‍රමාණයෙන්; දක්වත්, ප්‍රකාශකෙරෙත්.

31 භා:-උත්තමයන්ගේ ගුණය හා බුඬිමාහාත්ම්‍යය වර්ණනාකරන සත්වයාහට උභයලොකයෙහිම අභිසිඬිය වන්නේය. එබැවින් ලොකයෙහි සත්පුරුෂයෝ සත්පුරුෂයන්ගේ ගුණය තමන්ගේ බුඬිප්‍රමාණයෙන් වර්ණනාකෙරෙත්.

32. රන්බඳනෙහි, සවර්ණභාජනයෙහි; (ම) (වත්කළාවූ) කෙසරතෙල්, සිංහතෙලය; අඩුනොවී, ඌනනොව; පවතිනමෙන්, ප්‍රවෘත්තවන්නාක්මෙන්, කුළුණුමෙත්, කාරුණා මෛත්‍රිදෙක; උතුමන්, උත්තමයන්ගේ; හද, හෘදයෙහි; සපිරි, සම්පූර්ණව; අඩුනොව, ඌනනොව; පවතී, පවත්නේවේ.

---

30. × කියනුයේ දකිනට තමන්දෙස්-වැඩි
31. + ගුණත් මනුවන පමණ දක්වම්-ක්‍රමවිරොධයි.
32. † කුළුණුමෙන්-සමහර.

33. සුදනෝ නිවත්වත්-පරනට දුකැතිවිට × පිහිටවෙත්,
කිසිනැති පවන් පත-පවන ඇරයා ගිම නරිනමෙන්.

34. දෙපසරුපු ඉඳිනත්-එවසෙත් සැපදෙසම නුවනැතියෝ,
දසත් දෙතිසක් මැද-නොනැළි දිව දිව දවසරිනමෙන්.

35. යමෙකුකල යහපත-සිත්හිවනුයේ ලොවනපුරැනැත්,
ලුහුදනකල නපුර-සිත්හි තබනුයෙ යහපතෙක් නැති. +

---

33. සුදනෝ, සත්පුරුෂජනයෝ; නිවත්වත්, ධනනැත්තෝ වද; පරනට, අන්‍යයන්ට; දුක්ඇතිවිට, දුකක් විද්‍යමානකාලයෙහි; පිහිටවෙත්, ප්‍රතිෂ්ඨාස්ථානවෙත්; කිසිනැති, කිසිම මාරුතයක් නැත්තාවූ; පවන්පත, විජිනිපත්‍රය; යාපවනඇර, යහපත්මාරුතයයවා; ගිමන් අරිනමෙන්, ග්‍රීෂ්මාපගමය කරන්නාක් මෙනි.

33. භා:-වටාපතෙහි කිසිවිටෙකත් පවන් නැත්තේය. නමුත් යමෙකුට සුලඟ ඕනෑවූවිටකදී මිහිරි සුලඟ ලබාදී ග්‍රීෂ්මය දුරුකිරීමට එහි ශක්තියක් ඇත්තේය. එමෙන්ම සත්පුරුෂයෝ වස්තුනැත්තාහුද අන්‍යයන්ගේ දුකෙහිදී වස්තුදීමාදියෙන් පිහිට වෙති.

34. රුපු, ශත්‍රූහු; දෙපස ඉඳිනත්, උභයපාර්ශ්වයෙහි විද්‍යමාන වන්නාහු නමුත්; නුවනැතියෝ, ප්‍රාඥජනයෝ; සැපදෙසම, සැපවූස්ථානයෙක්හිම; වෙසෙත්, වාසයකෙරෙත්; දසත්දෙතිසක් මැද, දෙතිස්දන්තයන් මධ්‍යයෙහි; නොනැළී, පීඩිතනොවී; දිව, ජිහ්වාව; දිව, (මුඛාභ්‍යන්තරයෙහිම) ධාවනයකොට; දවස් අරින මෙන්, දිවසාතික්‍රමණය කරන්නාක්මෙනි.

35. යමෙකු, යම්පුද්ගලයෙකු විසින්; කළ, කරනලද්දාවූ; යහපත, ශොභනකාර්‍ය්‍යය; හෙවත් හිතවත් කාර්‍ය්‍යය; සිත්හි වනුයේ, චිත්තයෙහි වන්නේනම්; (සිතෙහි තබාගන්නේනම්; ලොව, ලොකයෙහි; නපුරැනැත්, අනිෂ්ටයක් නොවන්නේය; ලුහුදන, ලඝුජනයා විසින්; (හීනයන්විසින්) කළ, කරනලද්දාවූ; නපුරු, විරුඬභාවය; සිත්හි, (තමාගේ) චිත්තයෙහි; තබනුයෙ, තබනලද්දේ නම්; යහපතෙක්, ශොභනාර්ථ සිඬියක්; නැති, අවිද්‍යමානයි.

---

33. + පරහට දුකක්විට-ඇතැම්.
35. × යහපතෙක්ඇය්-වැඩි

36. කෙත්වත් ලොවනොයෙක්-පලතුරුරකිණ මේගවිලසින්
සත් සත් ලත් සැපත් × -සතදුක්ගිමට මහත්සෙවනෙකි.

37. මහලු පඬිතවසුන්-අඳ දද දුබල + දිලිඳු සත්සත්,
මෙ ඇමට පිහිටවනු-තිරිඳුන්විනා අන්කෙනෙක් නැත්.

38. නොමඳ ගංගෝ ඇල-දියනිති වැදත් නොපිරි සිඳුමෙන්,
අපමණ දනලදත්-ඉසුරුමත් දනන් + සිත් නොපිරේ.

---

36. ලොව, ලොකයෙහි; නොයෙක්, නානාවිධවූ; කෙත්වත්, ක්‍ෂෙත්‍රවාස්තූන්ද; පලතුරු, ඵලගත් වෘක්‍ෂයන්ද; රකිණ, රක්‍ෂාකරන්නාවූ; මේගවිලසින්, මේඝය පරිද්දෙන්; සත්, යහපත්වූ; සත්, සත්ත්වයන් විසින්; ලත්, ලද්දාවූ; සැපත්, සම්පත්තිය; සත, සත්ත්වයන්ගේ; දුක්ගිමට, දුඃඛලක්‍ෂණ සම්පහරණයට; මහත් සෙවනෙකි, මහත්වූ ඡායායෙකි.

37. මහලු, මහල්ලෝය; පඬි, පණ්ඩිතයෝය; තවසුන්, තාපස යෝය යන මොවුන්ටද; අඳ, අන්ධයෝය; දද, දග්ධයෝය; දුබල, දුර්වලයෝය; දිලිඳුසත්, දරිද්‍රසත්ත්වයෝය; සත්, සත්පුරුෂ ජන යෝය යන; මෙඇමට, මේ සියල්ලටද; පිහිටවනු, ප්‍රතිෂ්ඨාවන් නාවූ; තිරිඳුන්විනා, නරේන්ද්‍රයන්හැර; අන්කෙනෙක් නැත්, අන්‍යයෙක් නැත්තේය.

38. නොමඳ, බොහෝවූ; ගංගෝ ඇල, ගඞ්ගා, ඔය, මාතිකා යන මොවුන්ගේ; දිය, ජලයතෙම; නිති, නිත්‍යයෙන්; වැදත්, ප්‍රවිෂ්ටවත්; නොපිරි, පූර්ණනොවන්නාවූ, සිඳුමෙන්, සමුද්‍රය සෙ සින්; අපමණ, ප්‍රමාණරහිතවූ; දනලදත්, වස්තුලද්දාවූ නමුත්; ඉසුරුමත්දනන්, ඓශ්වර්‍ය්‍යයුක්ත ජනයන්ගේ; සිත්, චිත්තය තෙම; නොපිරේ, සම්පූර්ණනොවේ.

---

36. × සත්සත්කලන් සැප
සත් අන් කලසැපත් } බොහෝ
[illegible] සත් කල සැපත්

37. + මහලුපඬි සුදනන්
අඳද දුබලවූ-බොහෝ

38. *ඉසුරුමත් දනගෙ-හැම

**39. යමෙකු යම් තැනකට-පමුණුවනු ගුණ දනයි නියවත්,**
**සුරනිඳු දිනිඳු හැර ×-තරිඳුමැද සසැදියා බලසින්.**

**40. මෙගගම් පලතුරැ-පරහටම වැඩ පමුණුවනමෙන්,**
**සුදනන් ලත්ඉසුරැ-සවසතට වැඩවේය නිතියෙන්.**

**41. ගිනයන් + රැගෙනත්-ඉවුවනු † දෙසන් කෙරෙ**
**නැණැතියේ,**
**කනාතොම දනිවත්-ලෝකැඩපතෙන් වතබලනුමෙන්.**

---

39. නියවත්, ප්‍රාඥජනයා විසින්; යමෙක්, යම්කිසිකෙනෙක්; (තෙම) යම් තැනකට, යම්ස්ථානයකට; පමුණුවනු, ප්‍රාප්තකරනු ලබන්නේ; ගුණදනයි, ගුණවිශෙෂය ජානනය කොටය; හෙවත් යොග්‍යා යොග්‍ය භාවය දනයි; සුරනිඳු, සුරේන්ද්‍රයා විසින්; දිනිඳු හැර, සූර්‍ය්‍ය අත්හැර; තරිඳුමැද, චන්ද්‍රමණ්ඩලමධ්‍යයෙහි; සස, ශශරූපය; ඇඳියාව්ලසින්, ඇන්දක්වැන්නේය.

39. භා:-ශක්‍රයා ශශරූපය චන්ද්‍රමණ්ඩලයෙහිම ඇන්දේ ලෝකවාසින්ට ඉතා පහසුවෙන් බලාගැනීම පිණිසය. ඉදින්එය සූර්‍ය්‍ය මණ්ඩලයෙහි අඳිනලද්දේනම් කිසිවෙකුටත් මනාප අන්දමෙන් බලාගත නොහැක්කේය. එමෙන්ම නුවනැතියන් විසින් ගුණයුක්ත පුද්ගලයෙක් යම්ස්ථානයකට පත්කරනුලබන්නේ ඒ ස්ථානයෙහි ඇතිවියයුතුවූ ගුණවිශෙෂයක් සලකාගෙනමය.

40. මේග, මේඝයද; ගම්, ග්‍රාමයන්ද; පලතුරු, ඵලගත්වෘක්ෂයන්ද යන මොවුන්; පරහටම, අන්‍යයන්හටම; වැඩ, වෘඩියක්; පමුණුවනමෙන්, සිඩකරන්නාක්මෙන්; සුදනන්, සාධුජනයන් විසින්; ලත්ඉසුරු, ලද්දවූ ඓශ්වර්‍ය්‍යය තෙම; සවිසතට, සකල සත්වයන්ටම; නිතියෙන්, නිරන්තරයෙන්; වැඩවේය, වෘඩිකාරණ වන්නේය.

40. භා:-මෙඝයෙන් (වර්‍ෂායෙන්) ගම්බිම් පලතුරු ආදිය හටගත්කල්හි එයින් මෙඝයට කිසිම ප්‍රයොජනයෙක් නැත්තේය. ප්‍රයොජනය තම් ලොකවාසී අන්‍ය ජනයන්ටමය. එමෙන්ම සත්පුරුෂයින් විසින් ලද්දවූ ඓශ්වර්‍ය්‍යයෙන් තමන් ප්‍ර නොලබන්නේද පරහට සැපමිණිසම වන්නේය.

41. නැනැතියේ, ප්‍රාඥපුද්ගලතෙම; ගීනයන්, (ගුණධනාදියෙන්) ලාමක ජනයන්; රැගෙනත්, ග්‍රහණයකොටද; (ආශ්‍රිත

---

39. × සුරිඳුදිනිඳු හැර
41. + නිහයන් † සිදුවනු-බොහෝ.

42. එකකට වති එකෙක්-සමති අනිකෙක් අනික් එකකට,
තද පවන ලදුවත්-නැවගොඩ රථය මුහුද නොදිවේ.

43. ඇමසතට වැඩවන-ගම්මැදෙහි පලතුරක් විලසින්,
සුදනන් අතට පත්-ඉසුරුවැඩවේය සව්ලෙව්හට. ×

---

කොටත්) ඉටුවන දෙයක්, (ලොකයාට) ප්‍රියජනක සිඩියක්; කෙරේ, කරන්නේය; නොමද, බොහෝවූ; කනා, සවණියන්; ඇතිවත්, ඇත්තාහු නමුද; ලෝකැඩපතෙන්,ලොහමය දපිණතලයෙන්; වත, වක්ත්‍රය; බලනුමෙන්, නිරීක්ෂණය කරන්නාක් මෙනි.

41. භා:-උසස්වූ කුලසම්පත් ආදිය ඇති ජනසමූහයා හීන පුද්ගලයන් ඇසුරුකොටත් ඔවුන්ගෙන් යහපතක්ම කරන්නේයි. ප්‍රභූජනයන් විසින් රන්රිදී මුතුමැණික් ආදී සම්පත් ඇති සල්හිඳු ලොහමය කැඩපතෙන් මුනුන බැලීමෙන් ඉතා යහපත් ප්‍රයෝජන ලබන්නාක්මෙනි.

42. එකකට, එක්කාය්‍යීයකට; එකෙක්, එක්පුද්ගලයෙක් තෙම; වති, සමර්ථවේ; අනිකෙක්, අන්‍යයෙක්තෙම; අනික්එකකට, අන්‍යකාය්‍යීයකට; සමති, සමර්ථවන්නේය; (කුමක්මෙන්ද?) තද පවන ලදුවත්, ඝනබඩමාරුතවෙගය ලත්නමුත්; නැව, නෞකාව; ගොඩ, ස්ථලප්‍රදෙශයෙහිද; රතය, රථයතෙම; මුහුද, සමුද්‍රයෙහිද; නොදිවේ, ධාවනය නොකෙරේ

42. භා:-සමුද්‍රයෙහිම යාමට සාමර්ථ්‍යය ඇති නෞකාව එහිම මුත් ගොඩභූමියෙහි නොයන්නාක්මෙන්ම- එක්කාය්‍යීයකට සමර්ථපුරුෂයා ඊටමමුත් අනිකකට සමර්ථනොවේමය. ගොඩබිම යාමට සාමර්ථ්‍යයඇති රථය එහිමමුත් සමුද්‍රයෙහි නොයන්නාක් මෙන්ම-අනික්කාය්‍යීයකට සමර්ථපුරුෂයා ඊටමමුත් අනිකකට සමර්ථනොවේමැයි.

43. ඇමසතට, සියලුසත්වයන්ට; වැඩවන, වෘඩිකාරවූ; ගම්මැදෙහි, ග්‍රාමමධ්‍යයෙහිවූ; පලතුරක් විලසින්, ඵලගන්නා වෘක්ෂයක් පරිද්දෙන්; සුදනන්, සත්පුරුෂයන්ගේ; අතටපත්, හස්තප්‍රාප්තවූ; ඉසුරු, ඓශ්වය්‍යීයතෙම; සව්ලෙව්හට, සකලලොකයාහට; වැඩවේය, වෘඩියට හෙතුවන්නේය.

---

43. × ඉසුරුවැඩවේ සව්ලෙව්හටත්-(ඇතැම්)

44. නසත්මුත් දුදනන් ×-සුදනෝ උන්වම වැඩ සලසත්,
සඳුන්තුර සිඳිනා-පොරොව මුවගත † සුවඳවනමෙන්.

45. තදරුදු ගුණැතිවත්-ලියෝමදහස සිසිලපැලත්,
තද යකඩින් තැනූ-පත් සිසිලස නොමදපානෙව. +

46. රකුසෙක් නම ලියක්-තැබූකරඬුවකලා කුසතුළ,
තුළඑහි වත්සිදුට-තමහිමිට දිවුණුව කළාපෙම.

---

43. භා:-සියලු සත්වයන්ටම හිතාර්ථසාධනය පිණිස ග්‍රාමමධ්‍යයෙහි විද්‍යමානවූ අනල්පමධුරඵල හරිතවෘක්ෂයකින් නානාවිධ සත්වයන්ට අමඳප්‍රයොජනය වන්නේය. එපරිද්දෙන්ම මනාගතිගුණ ඇත්තාවූ සත්පුරුෂ ජනයන්ගේ අතට පැමිණියාවූ ධාර්මික ඓශ්වර්යයෙන්ද ලොකවාසී නානාවිධ සත්වයන්ගේ හිතාර්ථසාධනය වන්නේමය.

44 සුදනෝ, (ගුණවත්) සත්පුරුෂජනයෝ; දුදනන්, දුර්ජනයන් විසින්; නසත්මුත්, නසනුලබන්නාහු නමුත්; උන්වම, ඒ දුර්ජනයන්ටම; වැඩ, අභිවෘධියක්; සලසත්, සිඬකෙරෙත්; (කෙසේදයත්) සඳුන්තුර, චන්දනවෘක්ෂය; සිඳිනා, ඡෙදනයකරන්නාවූ; පොරොව, ඵරසුවගේ; මූවගත, මුඛපාර්ශ්වය; හෙවත් මූවත; සුවඳවනමෙන්, සුගන්ධවන්නාක්මෙනි.

44. භා-සඳන්ගසකපන පොරෝවෙහි මූවත සඳුන් සුවඳින්ම යුක්තවූයේවේ. (සඳුන්රුක) මා නසන්නාවූ මොහුට සුවඳ දෙන්නේ ඇසිදූසි සිතා තමාගේ සුවඳ පොරවටවැද්දනොදී ඉවත්කර නොගනියි. එමෙන්ම සත්පුරුෂයෝ තමන්ට පීඩාකරන සතුරාටද පීඩානොකොට ඔහු රැකගන්නාහුය.

45. තද, ඝනබඩවූ; රුදුගුණැතිවත්, රෞද්‍රගුණඇත්තාහු නමුත්; ලියෝ, ස්ත්‍රීහු; මඳහස සිසිල, මන්දහාස්‍ය නමැති සිසිලය; පැලත්, ප්‍රකාශකෙරෙත්; තද, ඝනබඩවූ; යකඩින්, අයොද්‍රව්‍යයෙන්; තැනූ, සාදනලද්දාවූ; පත්; අයඃපාත්‍රය; නොමඳ, අමන්දවූ; සිසිලස, ශීතලස්පර්ශය; පානෙව්, ප්‍රකාශකරන්නාක්මෙනි·

46. රකුසෙක්, රාක්ෂසයෙක් විසින්; කරඬුවකලා, කරණ්ඩයකබහා; කුසතුළ, කුක්ෂිඅභ්‍යන්තරයෙහි; තැබූ; ස්ථාපිතවූ, හෙවත් රක්ෂාකළාවූ; නමලියක්; ස්ත්‍රියක්තොමෝ; එහිතුළ, තදනතරයට; වන්, ප්‍රවිෂ්ටවූ; සිදුට, සිඬනම්දෙවියාට; තමහිමිට, ස්වකීයස්වාමියාහටවඩා; දිවුණුව, විගුණකොට; පෙම්කළා, ප්‍රේමයකළාය.

---

44 × නසනත් දුදනයන්, † මූවතය–ඇතැම්.
54 + කාසත් සිසිලසය පානඑම්–ඇතැම්.

47. සඳනඳ කරනසඳ-පහන් සියුරන් මනතෙමනමෙන්,
සඳ සඳ පහන්සඳ සළලු සඳකොඳ සඳපහන්වේ.

48. නිමලගුණ රුසිරු-ඉසුරුතෙදවිකුම් ඇතිතැනටත්.
පැමිණනද රැකවල්-ඇතත් සිතුවක් කෙරෙති අඟනෝ.

49. කනාලිය පැරයූ-තුනුසිරිමවා ඇතිදු සිවවත්,
මනගුණ පිඝාපිය-හදතුළ ගලතුල තුලේ. ×

---

46. භා:-රාක්ෂසයෙකු විසින් ආරක්ෂාකරගනු පිණිස එක්තාලයෙක්හි සවකීය භාර්යාවක් කරඬුවකබහා එමකරඬුව කුක්ෂියෙහිබහා රක්නාලද්දීය. එසේ කරනකල්හි එක් සිඬයෙක් එම කරඬුවතුළට වැද සිටියෙන් එම භාර්යාව එම සිඬයාට ප්‍රෙම කරමින් යථොක්තරාක්ෂසයා කෙරෙහි ඇලුම්නොකෙළේය.

47 සඳ, සන්ධ්‍යාකාලයෙහි; නඳකරන, ආනන්දකරවූ; සඳ පහන්, චන්ද්‍රප්‍රභාව; සියුරන්, චකොරපක්ෂීන්ගේ; (මහවත් ඇටිකුළුපක්ෂීන්ගේ) මන, චිත්තය; තෙමනමෙන්, සන්තුෂ්ටකරන්නාක්මෙන්;සඳ, කාන්තාවන්ගේ;සඳ, චිත්තනැමැති, සඳපහන්, චන්ද්‍රප්‍රභාතොමෝ; සලෙලු, සල්ලාලජනයාගේ; සඳ, චිත්තනැමැති; කොඳ, කුන්ද (ප්‍රබොධ)යට; සඳපහන්වේ, චන්ද්‍රාලොකයෙක් වන්නේය.

48. නිමල්, නිර්මලවූ; ගුණ, ගුණයද; රුසිරු, රූපශ්‍රීයද, ඉසුරු, ඓශ්වර්‍ය්‍යයද; තෙද, තෙජසද; විකුම්, වික්‍රමයද; (යනමේ අඞ්ගයන්) ඇතිතැනටත් පැමිණ, ඇත්තවුන්කරා ප්‍රාප්තවද; අඟනෝ, අඞ්ගනාවෝ; නදරැකවල ඇතත්, දෘඪතර රක්ෂාවරණ ඇත්තාහු නමුත්; සිතුවක්, චිත්තාභිප්‍රාවක්ම; කෙරෙති, කරන්නාහුය.

49. සිව්වත්, මතුර්මුඛයා විසින්; කනාලිය, කනකලතාවන්; පැරයූ, පැරදවූ; පීය, සත්‍රීන්ගේ; තු ්සිරි, දෙහශ්‍රීය; මවාඇතිදු; නිර්මාණයකරන ලද්දේවන්නේ නමුත්; මනගුණ, (ඇලාගේ) චිත්තයෙහි විද්‍යමානවියයුතු ගුණධර්මයන්; පිය:, පහතොට; හද තුළ, හෘදයාභ්‍යන්තරයෙහි; ගල, ශෛලයෙක්; අතුළතුලේ, ආස්තරණය කළාක්මෙනි.

49. භා:-මහාබ්‍රහ්මයා විසින් සත්‍රීන්ගේ අසදෘශරූප සෞන්දර්‍ය්‍යය මනාසේ මවනලද්දේ නමුත් සිතෙහි කිසිමගුණලයවක් නොපිහිටුවා (මහාබ්‍රහ්මයා විසින්ම) මහත්වූ පාෂාණයක් බහනලද්දක් වැනිවේ. සත්‍රීන්ගේ සිත්හී සතබ්ධභාවය මෙයින් හැඟවූහ.

---

49. × හදතුළ ගලක් ඇතුලෙතුලේ-වැබි
† ගලතුල හදතුලේ අතුලේ-ඇනැම්.

50. වැදුවත් දරුවන්- ළඳුන්සෙනෙහස සැබෑනොකරව,
සිළුමිණිනි බබලන-උරගවිස සඟවා කෙළෙනවැනි.

51. ගෙසිදෙය පිටනදී-තැන තැන ඇවිද කරනනොපණත්,
ලියන්ගෙන් වනවැඩ-ඇතත්උන්කෙරෙහි ලොබ
නොකරව.

52. තම සිතට නොහැඟෙන-ලෙසවසන රුදුදුන අඟනන්,
ලුණුබෝමාලුවෙහි-ලොබනුවුමෙන් හැරකරව දුරු.

53. සලෙලුන් දුකලියන්-සැඟවෙනු නොවේ විලියෙන්,
බළලුන්ගොදුරතට-පැමිණෙනතෙක් වැන්න සැඟවුම්,

---

50. ළඳුන්, කාන්තාවන්; දරුවන්වැදුවත්, දරුප්‍රසූතිය කළත්. සෙනෙහස, (ඔවුන්ගේ) ස්නේහය; සැබෑනොකරව්, විශ්වස්ත නොකරව්; සිළුමිණිනි, ශිඛාමාණික්‍යයෙන්; බබලන, භ්‍රාජිතවන්නාවූ; උරග, සර්පයන්; විසඝඟවා, විෂයගුප්තකොට; කෙළන වැනි, ක්‍රීඩාකරන්නාක් වැන්නේය.

51. ගෙයි, ගෘහයෙහි; (විද්‍යමාන)වූ; දෙය, ද්‍රව්‍යයන්; පිටත බාහිරයට; දී, ප්‍රදානයකොට; තැන තැන, තන්හි තන්හි; ඇවිද, ආහිණ්ඩනයකොට; නොපණත්කරන, අකාර්‍ය්‍යයන්කරන්නාවූ; ලියන්ගෙන්, කාන්තාවන්ගෙන්; වන, සිඬවන්නාවූ; වැඩ,අභිවෘද්ධියක්; ඇතත්, විද්‍යමානවේ නමුත්; උන්කෙරෙහි, එම ස්ත්‍රීන්කෙරෙහි; ලොබ, ලොභයක්; හෙවත් ඇල්මක්; නොකරව්,නූපදවව්.

52. තම, තමාගේ; සිතට, චිත්තයට; නොහැඟෙනලෙස අනුකූල නොවනපරිද්දෙන්; වසන, වාසයකරන්නාවූ; රුදු රෞද්‍රවූ; දූතඅඟනන්, වධකස්ත්‍රීන්; ලුණුබෝ, ලවණබහුලවූ; මාලුවෙහි, ව්‍යඤ්ජනයෙහි; ලොබනුවූමෙන්, ලොභනොවන්නාක්මෙන්; හැර, සිතින්බැහැරකොට; දුරුකරව්, දූරස්ථකරව්.

53. සලෙලුන්, සල්ලාලපුරුෂයන්; දුක, දර්ශනයකොට; ලියන්, ස්ත්‍රීන්ගේ; සැඟවෙනු, සැඟවීමතෙම; විළියෙන්, වී්‍රඩායෙන්; (ලජ්ජායෙන්) නොවේ, නොවන්නේය; ගොදුර, ගොචරය; අතට පැමිණෙනතෙක්, හස්තප්‍රාප්තවනතාක්ම; බළලුන්, බිඩාලයන්ගේ; සැඟවුම්වැන්න, සැඟවීමහා සමානවේ.

54. අගනන්ට රැකවල්-කර පමණ කොට* ඉඳින අවිඥන්,
බිජු වපුරා වැටව-සියොතුන්ට වැටබැඳ ඉඳිනමෙනි +

55. තමාගති නොවිඳින-තැන්තැන්හි පරගන පතනුවෝ,
අමායයි රාපී-දෙලොව දුක්විඳිනවුන් වැන්නෝ.

56. සගමොක් දෙසට යන-මග අකුලි මාවත නිරායන†,
විසමුසු අමායුන්-ලියෝ මායම් පිරූ බඳුනෙක.

---

54 අගනන්ට, අඟනාවන්ට; රැකවල්කර, රක්ෂාවරණ තබා; පමණකොට, ප්‍රමාණකර: ගෙවත් සෑහේයයි විශ්වාසය කොට; ඉඳින, වාසයකරන්නාවූ; අවිඥන්, අව්‍යක්ත ජනයෝ; (කෙසේද?)වැවේ, වාපියෙහි: බිජුවපුරා,, බීජයන් වාපනයකොට; සියොතුන්ට, පක්ෂීන් (වැළැක්වීම) පිණිස; වැටබැඳ, වෘතිබන්ධනයකොට; ඉඳිනමෙනි, වාසයකරන්නාක් මෙනි.

54 භා:-ස්ත්‍රීන්ගේ ආරක්ෂාව පිණිස රැකවල්තබා මෙපමණකින් ස්ත්‍රීහු ආරක්ෂාවෙත්යයි සලකා වාසයකරන අව්‍යක්ත මනුෂ්‍යයන්ගේ වාසයකිරීම කුමක්වැනිදයත්? වැවතුළ ධාන්‍යාදි බීජයන් වපුරා පක්ෂීන්ගේ වැළැක්වීම පිණිස හාත්පස වැටබැඳ එපමණකින්ම ආරක්ෂාවේයයි සලකා සතුටුව සිටින්නාක්මෙනි. පක්ෂීන්ගෙන් අන්තරායක් නැතත් එම වැවතුළ පවත්නා ජලයෙන් එම බීජයන් කුණුවීමට හෝ එම ජලයෙන් බැහැරට ගෙනයාමට හෝ පැමිණෙනබැව් සැලකිය යුතුයි.

55. තමා, තමහට පැමිණියයුතුවූ: ගති, ගතිය; හෙවත් සතර අපායොත්පත්තිය: නොවිඳින, ජානනය නොකොටම; තැන්තැන්හි, තන්හි තන්හි පරගන. පරාඞ්ගනාවන්; (අනුන් සන්තක කුලාඞ්ගනාවන්) පතනුවෝ, ප්‍රාර්ථනාකරන ජනයෝ; (කෙසේද? අමායයි, අමෘතයයි සලකා රාපී,සුරාපානයකොට; දෙලොව. උභයලෝකයෙහි. දුක්, (ඝෝරතර කටුක භයානකවූ) දුඃඛයන්; විඳිනවුන්වැන්නෝ, අනුභවකරන්නන් වැනිවෙති.

56 ලියෝ, කාන්තාවෝ; සගමොක්දෙසට, ස්වර්ගමෝක්ෂ පුරවරයට; යන, ගමනය කරන්නාවූ; මග, මාර්ගයට; අකුලි, අකුල් හෙලිමෙකි; නිරායන. නිරයට යන්නාවූ; මාවත, මහාමාර්ගයෙහි; විසමුසු. විෂහා සම්මිශ්‍රවූ; අමායුන්, අමෘතයක්බඳුය; මායම්පිරූ, මායාධර්මයෙන් පූර්ණවූ; බඳුනෙක, භාජනයෙකි.

56. භා:-කාන්තාවෝ ස්වර්ගමෝක්ෂ පුරවරයට ගමනයකරන මාර්ගය අසුරාදමනලද කටුඅකුලකි. (එසේම) නිරයටයාම පිණිස ඉතා පහසුවූ මහා මාර්ගයෙකි. (යලිත්) විෂද්‍රව්‍යයෙන් මිශ්‍රවූ අමෘතයයි. (නැවතද) ස්ත්‍රීමායමින් පිරුණු භාජනයෙකි.

---

*පමණකට-බොහෝ + බැඳ ඉඳින වාටමෙනි-ඇතැම්
†මාපතනිරායන-බොහෝ.

**57. ලඳුන් පෙම් බැඳුමට-පැමිණ දුක්විඳින අවියත් දන,***
**බෝසත් රණමොණර-සෙබඩසානිසා මල + බැඳුනුවැනි.**

---

7. අවියත්දන, අඥානජනයෝ; ලඳුන්, කාන්තාවන්ගේ; පෙම්බැඳුමට, ප්‍රේමබන්ධනයට; පැමිණ, ප්‍රාප්තව; දුක්විඳිති, දුඃඛ විඳිනයකරන්නාහ, (කෙසේද?) බෝසත්, බොධිසත්ත්වූ; රණ මොණර, ස්වර්‍ණමයූරයා; සෙබඩසා, මයූරධෙනුවක් නිසා: මල, පාශයෙක්හි; බැඳුනුවැනි, බද්ධවූවාක්මෙනි.

.57. භා: යටගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යයකරන සමයෙහි බොධිසත්ත්වයෝ මයූර යොනියෙහි ඉපිද වැඩිවිය පැමිණ ශරීරය ස්වර්‍ණවර්‍ණ බැවින් මනුෂ්‍යපථයෙහි විසීමෙන් අනතුරාක්වේදෝ යන බියෙන් හිමාලය වනයටගොස් පර්‍වත වලලුතුනක් ඉක්මවා සතරවන පර්‍වත වලල්ලවූ දණ්ඩකීරණ්‍ය නම් පර්‍වතයෙහි වාසයකරන්නේය. එසමයෙහි බරණැස්රජහු විසින් මොහු අල්වා ගෙන්වන්ට උත්සාහකොටත් නොහැකිවූයෙන් රන්වන් මයූර රාජයා කෙරෙහි ආඝාතබැඳ මොහුගේ මාංසය අනුභවකල කෙනෙක් අජරාමර වන්නේයයි රන්පතකලියවා තබා මළේය. බෝසත්හුද "**උදෙ නයං**" යනාදී බ්‍රහ්මමන්ත්‍රයක් උදය සවස භාවිතාකරනහෙයින් රජවරු සත්දෙනෙකුත් හා වැද්දන් සත්දෙනෙකුත් මියයන තෙක් කිසිවෙක් තමන් අල්වාගතනොහී වසන අතර-ප්‍රයොග යෙහි දක්‍ෂ ව්‍යාධයෙකු-මොහු මේ මන්ත්‍රය හදරනතෙක් අල්වන්නට නොහැකිබැව් දැන එක්තරා පිටිසර ගමකට ගොස් මොනර කිකිලියක් අල්වා තමාවිසින් අසුරුගැසූකල්හි නටන්නටත් රාව ප්‍රතිරාව කරන්නටත් පුහුණුකරගෙන පෙරලා අවුත් බෝසත්හු ගොචර ග්‍රහණය සඳහා බසින මාගීයේ මළුඉඳුවා ඒ අවට සෙබඩද නහරකරවා බෝසතාණන්වහන්සේ මන්ත්‍රය නොහොත් පිරිත පිරිවහන්නට පළමු මොනර සෙබඩලවා රාග නිශ්‍රිත නොට හැඩවිය. බෝසතාණන්වහන්සේ කිසිකලෙකත් නොඇසූවිරූ රාගනිශ්‍රිත මධුර ශබ්දය සා රාගයෙන්මත්ව පිරිත පිරිවහනු නොහැකිවූයේම සෙබඩ සිටිතැනට පැමිණියේය. පැමිණි ඇසිල්ලෙහිම ව්‍යාධයාවිසින් හිඳුවනලද මළයෙන් බැඳුණේය. වැදිතෙමේ එම මයූරරාජයා ගෙනගොස් බරණැස්රජහට දුන්නේය. අඥාන ජනයන්විසින් කාන්තාවන්ගේ ප්‍රේමබන්ධනයට පැමිණීමෙන් අනන්තදුක් සමූහයට භාජනවනබව මෙයින් හඟවයි.

මෙහි විස්තරය ස්වර්‍ණමයූර ජාතකයෙන් දතයුතුයි.

---

57. *දුක්විඳිනු අවියත්-හැම. × සෙබඩසා නිසාවුන්-හැම.

**58.** ඉමිහිමිඉන්දදී-නොහිමිදුට කල්බඳින සොරගත,
තම බුදින මස්ඇර-නොකනමස්කා කුලනසතවෙති.

**59.** ලියන් නිසාකරන-බැහැර නොමදව දුක්විඳින සත*
පබවතවෙත†ලොබින්-කුසරජපවා වසුන්කත්ඇද්දේ.

**60.** දිවිමුන් තද සතුරු-බියපව් අසන නුගුණත්×
මෙකී සිව්අවැඩම-පරගතන් සෙවුනහට පැමිණේ.

---

58. ඉමි, ස්වායත්තාවූ; හෙවත් තමහට නියමිතවූ; හිමි වල්ලභයා; හෙවත් පුරුෂයා; ඉන්දදී, විද්‍යමානවනකල්හි; නො හිමි, අහිමියන්; හෙවත් පරපුරුෂයන්; දුට, දශීනය කළකල්හි; කල්බඳින, මනොබන්ධනය කරන්නාවූ; සොරගත, වෛරාඞ්ග නාවෝ; (කෙසේද?) තම, තමාවිසින්; බුදින, අනුභවකටයුතුවූ; මස්, මාංසයක්; ඇර, ඉවතලා; නොකන, භක්‍ෂණයට අයොග්‍යවූ; මස්, මාංසයක්; කා, අනුභවකොට; කුල, ස්වකීය වංශය; නසන මෙති, නෂටකරන්නවුන් වැන්නෝය.

58 භා:-නියම හිමියා හැර පරපුරුෂයන් සොයන ස්ත්‍රීහු තමාවිසින් කෑයුතු මාංසය හැර නොකෑයුතු මාංසය අනුභව කොට ස්වකීය කුලය නසන්නවුන්වැනිය. මෙහි නොකෑයුතු මාංසයයි කියේ ගොමාංසගැනය. ගවමස් අනුභවකරන්නහු රොඩීකුලයට දැමීම පුරාණ ලඞ්කාවෙහි ධර්මතාවෙකි. එයින්ම කුලය නැසුනේවේ. එමෙන්ම ස්ත්‍රියෙක් පරපුරුෂයන්පතාද එය එබඳුමවූ කුලනසන ක්‍රියාවෙකි.

59. ලියන් නිසා කරන, ස්ත්‍රීන් ආශ්‍රයකරන්නාවූ; සත, (රාගසහගත ආලයඇති) සත්වයෝ, බැහැර, බාහිරයෙහි; (තමාගේ ධන්‍යපූර්ණ මහිමාදිය ඉක්මවා යන අර්ථයි.) නොමදව, අමන්දව; (ප්‍රමාණාතික්‍රාන්තකොට) දුක්, දුඃඛයන්; විඳින, විඳනය කරන්නාහුය; (කොබඳුදයත්?) පබවතවෙත, ප්‍රභාවතියකොරෙහි; ලොබින්, ලොභය හෙතුකොටගෙන; කුසරජපවා, කුශරාජයාද පවා; වසුන්කත්, අඩුකතුබැඳි කත්; ඇද්දේ, ගෙනගියේය.

විස්තර කුසජාතකයෙන් දතයුතු.

60. දිවිමුන්, (ස්වීය) ජීවිතමුසානිය; හෙවත් ජීවිතවිනාශය; තද, ක්‍රෑරවූ; සතුරුබිය, සතුරන්ගෙන් වන්නාවූ භීතිය; පව්, පාපය; අසන නුගුණත්, ප්‍රකාශවන අපකීර්තිය යන; මෙකී, උක්තප්‍රකාරවූ; ගෙඩනු ශම්කියන ලද්දවූ; සිව්අවැඩම, අනර්ථ චතුෂ්කයම; පරගතන්, පරස්ත්‍රීන්; හෙවත් අන්සතුකතුන්; සෙවුනහට, සෙවනයකාරණ ජනයාට; පැමිණේ, ප්‍රාප්තවේ; හෙවත් ලැබේ.

---

59. *නොමද දුක්පිඳිනසත-හැමි. †පබවතකෙරෙ-ඇතම්. ×බියපවූ අසනනොමදනුගුණත්-සමහර.

**61. ලියෝ බොරු සෙනෙහස-පෑ තමහිමි සොරු ගෙන නසත්,**
**කොටෙට ගුම කල ලොබින්-ගලින් බෝසත් හෙළූ ලියමෙන්.**

---

61. ලියෝ, කාන්තාවෝ; බොරු, අසත්‍යවූ; සෙනෙහස, සෙනෙහස; පෑ, ප්‍රකාශකොරෙමින්; සොරු ගෙන, චෞරපුරුෂයන් ග්‍රහණයකොට; තම, තමාගේ; හිමි, ස්වාමීහු; නසත්, නසත් නහුය; කොටෙකුට, හස්තපාද රහිත පුරුෂයෙකුට; කල, කරන ලද්දවූ; ලොබින්, ලොභය කාරණකොටගෙන; බෝසත්, බොධිසත්වයන් වහන්සේ; ගලින්හෙළූ, ශෛලයෙන් පතිතකළාවූ; ලියමෙනි, කාන්තාවමෙනි.

61. භා:-යටගියදවස බරණැස්නුවර බඹදත් රජහට චුල්ලපදුම කුමාරයා ආදීකොට පුතුන් සත්දෙනෙක්වූහ. දිනක් රාජසේවයට එන පුතුන්දුටු රාජ්‍යය උදුරාගනිත් යන බියෙන් ස්වීය පුත්‍රයන්ට රාජ්‍යය හැර පිටතගොස් වසන්නටයයි අණකළ හෙයින් ස්වකීය බිසෝවරුන් සමග සොහොයුරු කුමරුවෝ සත්දෙන නික්ම යන්නාහු වාලුකාකාන්තාරයකට පැමිණ බුදිනට ආහාර නොලත්හෙයින් වල මලණුවන්ගේ දෙවියගේ පටන් පිළිවෙළින් දිනපතා එකිඑකියක් බැගින් මරා මස්කමින් යන අතර බොධිසත්වවූ චුල්ලපදුමකුමාරයාගේ දෙවිය මරන්නට නියමදින හෙටට පැමිණී තිබියදී රෑ නමබිසවුන් කරතබාගෙන යනකල්හි බිසවට හටගත් පිපාසය සංසිඳුවන්නට තම දකුණු උරහිස පලා රුධිරය පෙවීමෙන් සනපපවා එක් ආරණ්‍යයකට වැද දෙදෙනා තපස්රක්නා අවදියෙහි ගඟෙහි පාවීආ කොටෙක් තාපසාරාමයට ගෙන බිසව අකැමැත්තෙන් සිටියදීත් බෝසතාණන්වහන්සේ උවටැම්කොට නිරෝගිවූවාටපසු මුලදී අකැමැතිව සිටිබිසව පසුව කොටාකෙරේ පෙම්බැඳ ස්වාමීවූ තවුසානන් ප්‍රයොගයකින් මරණු කැමතිවූයේ "දෙවතාවෙක්හට බිලිපූජාවක් කරම්හ"යි බෝසතානන් රවටා පර්වත මුදුනට ගෙන ගොස් එම පර්වතයෙන් පහළට පෙරළාදැමීය. බෝසතානන් දිඹුල්ගසක් මත්තෙහි වැටී ගොයෙකුගේ ආධාරයෙන් ගසින්බැස පසල් දනව්වකට පැමිණිසඳ පියරජ් මලහසුන් අසා සියනුවරට පැමිණ රාජ්‍යය ගෙන දසරජදමින් රජයකරවනකලැ රජුගේ දන්හලට යපොකත දෙවිය සහ කොටාද සිහමක් ලබනු සඳහා පැමිණියද ඔවුන් රාජයා හරා පමුණුවා කරුනු විචාරා දෙවියකීයානන් බොරුකොට සත්‍ය ප්‍රකෘතිය මහජන සෙබෙහි පළකොට ඔවුන් ව වධනියම්කොටත් නැවත කුළුණු උපදවා අභයදෙනලදුව දේවියගේ හිසසා පැසක් ලවා බඳවා පසල්දනව්වකට යැවීය. විස්තරය චුල්ලපදුම ජාතකයෙන් දතයුතුයි.

**62. ගුණ නැණ විරිය ලිය-ඉඳිනගෙට වැඩිවේය *සවසිරි,**
**සවසිරි සපිරිගේවත්-අවගුණ ලියක්වන දිළිඳුවේ.**

**63. සියලිය පමණකොට- ඉඳින අවියත් දනෝ ලෙවහි,**
**විසඝෝර උරගහෙන-උරෙහිලා කෙළනවුන් වැන්නෝ.**

**64. උරණ නොව හැමකල-යෙහෙන් රකිතත් පණසෙ නිතියෙන්,**
**බඩුවක්මෙන් විකිණී-පහසදෙන් කාටවත් අගනෝ.**

---

62. ගුණ,(දයාදාක්ෂිණ්‍යාදී)ගුණය; නැණ,ප්‍රඥාව; විරිය, වීර්‍ය්‍ය යනමෙයින් යුක්තවූ; ලිය, කාන්තාවක්; ඉඳින,වාසයකරන්නාවූ; ගෙට, ගෘහයට; සව්සිරි, අනූනසම්පත්තිය; වැඩිවේය, විගුණවන්නේය; සව්සිරි, සකල සම්පත්තියෙන්; සපිරි, සම්පූර්ණවූ; ගේවත්, ගෘහයවූවද; අවගුණලියක්, ගුණවිරහිත කාන්තාවක් විසින්; වන, ප්‍රවෙශවනලද්දේ; දිළිඳුවේ, දරිද්‍ර වන්නේය.

62. භා:-කරුණාමෛත්‍රී ගුණයෙන් හා බුඬියෙන්ද, වීර්‍ය්‍යයෙන්ද යුක්තවූ යහපත් කාන්තාවක් වාසයකරන ගෘහයට නානාවිධවූ යශඓශ්වර්‍ය්‍යය වැඩෙන්නේය. සියලු සම්පත්තියෙන් පිරීගිය ගෘහයවූවත් වීර්‍ය්‍ය ගුණනුවණාදියෙන් හීනවූ ස්ත්‍රියක් වසනු ලැබේනම් එහි සම්පත් ක්‍රමයෙන් පිරිහීමට යන්නේය.

63. සියලිය, සවකීයවූ ස්ත්‍රිය; පමණකොට, ප්‍රමාණකර; හෙවත් විශ්වාසකොටගෙන; ඉඳින, වාසයකරන්නාවූ; ලෙව්හි, ලොකයෙහි; අවියත්දනෝ, අව්‍යක්තජනයෝතුමූ; විසඝොර, විෂඝොරවූ; උරග, සර්පයෙක්; ගෙන, ග්‍රහණයකොට; උරෙහිලා, වක්ෂඃප්‍රදෙශයෙහි බහාගෙන; කෙළනවුන්වැන්නෝ, ක්‍රීඩාකරන්නවුන් වැනිවෙති.

64. උරණනොව, කුපිතනොවී; හැමකල, සියලු කාලයෙහි; යෙහෙන්, යහපත් පරිද්දෙන්; නිතියෙන්, නිරන්තරයෙන්; පණසෙ, ප්‍රාණයමෙන්; රකිතත්, (ස්වාමීන්විසින්) රක්ෂාකරන ලද්දාහු නමුත්; අගනෝ, ස්ත්‍රීහු; විකිණී,විකුණනලද්දවූ; බඩුවක් මෙන්, භාණ්ඩයක් පරිද්දෙන්; කාටවත්, අන්‍යපුරුෂයෙකුට; පහස, ස්පර්ශය; දෙත්, දෙන්නාහුය.

64. භා:-තමභාර්‍ය්‍යාව කෙරෙහි කිසිකලෙකත් කොපයක් නොවී සියලුකල්හිම යහපත්ව ජීවිතය පරිද්දෙන් ස්වාමිපුරුෂයා විසින් රක්ෂාකරණලද්දී නමුත් ඒ ස්ත්‍රිය විකිණීමට තිබෙන භාණ්ඩයක්මෙන් අන්කවර පුරුෂයෙකුට නමුත් ස්පර්ශදානය කරන්නීය.

---

62. * වැඩවේය—හැම.

65. බොරුමායම් කියා-සැබෑවරදත් නැතැයි සාදත්,
සොරුකා යම්දෙයක්-දුනත් ගෙණ සහතොසින්
ලංවෙත්.

66. තම හිමිහට දුකක්-පැමිණිවිට නොහැරගතහොත්දුක්,
මෙලොව යසසිරිවේ-පරලෙව්හි සුරසැපත් පත්වේ.

67. එකෙකු සෙවුදෙය ගෙන-එකෙකු කවමින් සෙවෙති*
බැඳ පෙම්,
කෙසරිඳු හෙළු ගිජිඳු-සිවල් කාකා කකා යනමෙන්†.

---

65. (අහතෝ!, අඞ්ගනාවෝතුමූ;) බොරු, අසත්‍යවූ; මායම්, මායාවචනයන්; කියා, ප්‍රකාශකොට; සැබෑවරදත්, සත්‍යවූ වචනයද; නැතැයි, නැත්තේයයි; (කියා) සාදත්, සිඩියට පමුණුවත්; සොරු, චෞරපුරුෂයා විසින්; කා, අනුභවකොට; යම්දෙයක්, යම්කිසි ද්‍රව්‍යයක්; දුනත්, දෙනලද්දේද; ගෙන, (එය)හැරගෙන; සහතොසින්, සන්තොෂයෙන්; ලංවෙත්, (වල්ලභයාහට) සම්පවේ.

66. තමහිමිහට, තමාගේ ස්වාමිහට; දුකක් පැමිණිවිට, දුඃඛයක් ප්‍රාප්තකල්හි; නොහැර, (එමස්වාමිහු) අත්නොහැර; දුක් ගතහොත්, දුක්ගන්නේනම්; මෙලොව, ඉහලොකයෙහි; යසසිරි, යසඓශ්වර්‍ය්‍යයද; වේ, වන්නේය; පරලෙව්හි, පරලොකයේදී; සුරසැපත්, දිව්‍යලොක සම්පත්තියටද; පත්වේ, ප්‍රාප්තවන්නේය.

67. (අහංතා!, අඞ්ගනාවෝ;) එකෙකු, එක්පුරුෂයෙකුවිසින් සෙවූ, සපයනලද්දවූ; (රැස්කරනලද්දවූ දෙය, ද්‍රව්‍යය; ගෙන, ග්‍රහණයකොට; එකෙකු, අන්‍යයෙකුට; කවමින්, අනුභවකරවමින්; පෙම්බැඳ, ප්‍රෙමබන්ධනයකොට; සෙවෙති, සෙවනයකරත්; (කෙසේද?) කෙසරිඳු, සිංහරාජයාවිසින්; හෙළූ, නසනලද්දවූ; හෙවත් පතිතකරනලද්දවූ; ගිජිඳු, ගජෙන්ද්‍රයා; සිවල්, ශෘගාලයන්හා; කාකා, කවුඩන්විසින්; කකා, භක්ෂණයකොරෙමින්; යනමෙන්, යන්නාක්මෙනි.

67. භා:-ස්ත්‍රී තමාගේ ස්වාමිපුරුෂයා විසින් සපයා රැස්කර තබනලද වස්තුව අන්‍යජනයන්ට අනුභවකරවමින් සෙනෙහබන්ධනයෙන් සෙවනය කරන්නාහුය. කෙසේද යත හොත්? සිංහ රාජයාවිසින් නසනලද හස්තිරාජයා කාක, සොන, ශෘගාලාදීන් වි න් සිත්සේ අනුභවකෙරෙමින් ගමනයකරන්නාක්මෙනි.

---

67. *සෙව්ති-සෙවති-ඇතැම්. †සිවල් කවුඩන් කකායන මෙන්-ඇතැම්.

68. ඇසදුටු වරදවත්-බොරුයයි කියති බැහැර වැසවැස,
තද බොරු විසබබා-ලියක් මිහිකත්තොමෝ ගිලුපෙර*.

69. දරුපෙම් ගුණ නුවණ-සමත්බැව් මෙම කියති මලකල,
තමලිය ගුණඇතත්- නොකිය වියතුනි! මළත් උන්නත්.

70. සිරිමත් කළත් ලිය-ලුහුදනටද †ලොබවඩන්මැයි,
කිරෙන්බත්ලුවන්-සුනකයෝ කසලටද +ලොබවෙත්.

---

68. (අභනෝ, අඬගනාවෝතුමූ;) ඇස, (ස්වාමිහුගේ) සියැසින්; දුටු, දර්ශනයකළාවූ; වරදවත්, වරදයනමුත්; බැහැර වැස වැස, බාහිරයෙහි වාසයකෙරෙමින්; නොහොත් කුලාචාරසීමාව ඉක්මවමින්; බොරුයයි. අසත්‍යයයි; කියති. කථනය කරන්නාහුය; පෙර, පූර්වයෙහි; තද, ඝනබඩවූ; බොරුවිස, අසත්‍යනැමැති විෂයෙන්; බබා, ගිල්වා; ලියක්, සත්‍රියක්; මිහිකත්තොමෝ, මහීකාන්තාතොමෝ; ගිලූ, ගිලගත්තීය.

68. භා:-සත්‍රීහු බාහිරයෙහි වාසයකෙරෙමින් සියැසින්දුටු වරද නමුත් අසත්‍යයයි කියන්නාහුය. පූර්වකාලයෙහි රෞද්‍රව බොරුකියූ සත්‍රියක් මහීකාන්තාව විසින් ගිලගත්තීය. හෙවත් රෞද්‍රව බොරුකියූ එම සත්‍රිය පොළොව පලාගෙන අපායට ගෙනගියේය. (චිඤ්චමානවිකා කථාවස්තුවෙන් විස්තරදතයුතු.)

69. දරුපෙම්, දරුකයන් කෙරෙහිවූ ප්‍රේමයද; ගුණ, ගුණයද; නුවණ, ඥානයද; සමත්බැව්, සමර්ථභාවයද යන; මෙම මෙකී සියල්ලම; මලකල, (තමභාර්‍ය්‍යාව) මැරුණුකල්හි; කියති (ස්වාමිපුරුෂයෝ)කියන්නාහුය; වියතුනි!, ව්‍යක්තයෙනි!; තමලිය තමසත්‍රියගේ; ගුණ, ගුණයක්; ඇතත්, විද්‍යමානනමුත්; මළත්, (තමභාර්‍ය්‍යාව) මළකල්හිද; උන්නත්, නොමළකල්හිද; නොකිය, (ප්‍රේමගුණ, නුවණ, සමත්බැව් ආදිය) කථනය නොකරව්.

70. ලිය, සත්‍රීහු; සිරිමත්කළත්, සම්පත්තියෙන් යුක්තකරන ලද්දාහු නමුත්; ලුහුදනටද ලඝුජනයාහටද; ලොබ, ලෝභය; වඩන්මැයි,වර්ධනයකෙරෙත්මය; (කෙබඳුදයත්?) කිරෙන්,ක්ෂීරය හා මිශ්‍රකොට; බත්, භක්තය; (ආහාරය) ලුවන්, දෙනලද්දේ නමුත්; සුනකයෝ, ස්වානයෝතුමූ; කසලටද, අසූචිවලටද ලොබවෙත්, ලෝභයුක්තවෙති.

---

68. *තදබොරු විසතිබා-මිහිකත්තොමෝ ගිලුලියක් පෙර-හැම
70. †ලුහුදනටම—හැම. +කසලටම—හැම

**71. ඉසුරම ලොබින් ලිය-ලොවට වැඩකරන්නුවන් වනසන්,**
**පඬිකාලිදසන්-නසා රජතුන් වැනසී අඟනෙක්.**

**72. ලියලියලාතුරින්-තුරුද ඇද බද නිතිනි තුඹුදේ,**
**එමෙන් ලිය දුටුදුටු-සළලුන් බදුවෙනත් තුඹුදෙත්.**

---

71. ලිය, ස්ත්‍රිහු; ඉසුරට, ඓශ්වර්යයට; ලොබින්, ලොභකිරීම හෙතුකොටගෙන; ලොවට, ලොකසත්වයාහට; වැඩකරනුවන්, හිතාර්ථසාධනයකරන්නන්; වනසත්, විනාශකෙරෙත්; අඟනෙක්, අඞ්ගනාවක්තොමෝ; පඬි පණ්ඩිතවූ; කාලිදසන්, කාලිදසනම් කවිහුද; නසා, නෂ්ටකොට; රජතුන්, (කුමාරදස) රජහුද; වැනසී, විනාශකළාය.

71. භා:-කුමරදස් මහරජතුමා විසින් කරනලද ජානකීහරණ මහාකාව්‍යය දැකීමෙන් සතුටුවූ කාලිදස පණ්ඩිතතෙමේ කුමරදස්රජු දක්නුසඳහා ලක්දිවට පැමිණියේය කුමරදස්රජු හා සමවයස්ති මහාකවි කාලිදස පඬිතුමා කුමාරදස මහරජතුමාගේ මිත්‍රත්වයෙහි වසන අවස්ථාවෙහි ස්ත්‍රීසංගමයකට පැමිණීමෙන්වූ යම්කිසි උපද්‍රවයකින් කාලිදස කවිවරයා මරුමුවට පත්ව විනාශයක්හි ආදුගතකාරතුලබනබැව් ඇසූ කුමරදස් රජතෙම අධික ශොකයට පත්ව ඉවසියනොහී ඇවිලදනු එම චිතකයට පැන කාලිදස කවිවරයා වෙනුවටම ජීවිතය පූජාකෙළේය. මේ කාලය වනාහි ශ්‍රී බුද්ධවර්ෂ 10 0 පමණ බැව් පෙණේ. මේ රජතුමා සිංහාසනාරූඪවූයේ 1060 වේදැය.

72. ලිය, ලතාතොමෝ; තුරින්, වෘක්ෂයකාරණකොටගෙන; ලියලා, දලුදමා; හෙවත් වෘද්ධියට පැමිණ; තුරුද, (අන්‍ය) වෘක්ෂයන්ද; ඇද, ආකර්ෂණයකොට; බද, ආලිඞ්ගනයකොට; නිතිනි, නිත්‍යයෙන්; තුඹුදේ, තුණ්ඩදානයකෙරේ; එමෙන්, එපරිද්දෙන්ම; ලිය, කාන්තාවෝ; වෙනත්, අන්‍යවූද; දුටුදුටු සළලුන්, දර්ශනය කළකළ සල්ලාලයන්; බද, ආලිඞ්ගනයකොට; තුඹුදෙත්, (චුම්බනයට) මුඛදානය කෙරෙත්.

72. භා:-ලතාවර්ගයෝ ගස් ආශ්‍රයකොටගෙනම වැඩෙමින් අවට තිබෙන අන්‍යවෘක්ෂයන්ද ඇදවැළඳගෙන නිරන්තරයෙන් තුඹුදෙත්. එපරිද්දෙන්ම කාන්තාවෝද ස්වකීය ස්වාමියා ආශ්‍රය කාරමින්ම-වෙනත් දුටුදුටු තරුණයන් වැළඳගෙන සිඹීමට මුහුණ දිගුකෙරෙත්.

**73.** **සුරා සොරාමබී-උන්නත් රාමත එලිවනමෙන්*,**
**සොරා ලියන්කරන නොපණත් පෙණේ සඳෙහි**
**ලපමෙන්†.**

**74.** **අඟනන් වසඟයට-නොපැමිණෙනුවො ඇද්ද ලෙවිහි,**
**සුරනා ඉසුරු නම-රකීලිය ඉසින් උසුලනුයේ.**

---

73. සුරා, සුරාව; සොරාම, හොරෙන්ම; හෙවත් කිසිවෙකුටත් නොදැනෙනසේම; බී, පානයකොට; උන්නත්, (යමෙක්) උන්නේනමුත්; රාමත, (එම) සුරාවෙහි මත්තභාවය; එලිවන මෙන්, (ජනයන් ඉදිරියෙහිම) ප්‍රකාශවන්නාක්මෙන්; ලියන්, කාන්තාවන්විසින්; සොරා, හොරෙන්; කරන, කරනුලබන්නාවූ; නොපණත් අකෘත්‍යය; සඳෙහි, චන්ද්‍රමණ්ඩලයෙහි; ලප මෙන්, ශශලාඤ්ඡනය පරිද්දෙන්; පෙණේ, (යම්විටකදී) දෘශ්‍යමානවේ.

73. භා:-මද්‍යපානය කිසිවෙක්හටත් නොදැනෙනසේ හොරෙන්ම පානයකොට කෙතරම් සඟවාගෙන සිටියත් එහි විද්‍යමානවූ මද්‍යසාරයෙහි බලයෙන් දුර්ගන්ධයත් මත්තභාවයත් ප්‍රකටවන්නේ යම්සේද- එපරිද්දෙන්ම කාන්තාවන් විසින් කිසිවෙකුහට නොදැනෙනසේ හොරෙන් කරනුලබන්නාවූ අමනොඥ ක්‍රියාවෝ සඳමඩලෙහි දෘශ්‍යමාන සසලපයමෙන් කාහටත් පෙණෙනසේ යම්දිනෙකදී ප්‍රකටවන්නාහුමය.

74. අඟනන්, ස්ත්‍රීන්ගේ; වසඟයට, වසඟභාවයට; නොපැමිණෙනුවෝ; පත්නොවන්නෝ; ලෙව්හි, (මේ ලෝකයෙහි; ඇද්ද, විද්‍යමානද; (නැත්මැයි) සුරනා, (සකල) දෙවියන්ට නායකවූ; ඉසුරු, ඊශ්වරතෙම; නමලිය, තමාගේ භාර්යාවූ උමා දෙවිය; ඉසින්' ශිර්ෂයෙන්; උසුලනුයේ, උවහනයකරන්නේ; රකී, රක්‍ෂාකෙරේ.

71. භා:-ස්ත්‍රීන්ගේ වසඟභාවයට පත්නොවන්නෝ මේ ලෝකයෙහි නැත්මැයි යන්නෙන් පෘථග්ජන සත්වයන් බොහෝ සෙයින්ම ස්ත්‍රීවසඟභාවයට පැමිණෙන්නන් බැව් ගැනවීම පිණිස ඊශ්වර දෙවයාගේ භාර්යාවන් තුන්දෙනා අතුරෙන් ප්‍රධාන භාර්යාවවූ උමාදෙවිය තම ජටාවෙහි තබාගෙන ආරක්‍ෂාකරන බැව් දක්වූහ.

---

73. *එලිලනමෙන්—හැම. †සඳලපයමෙන්—හැම.

**75. ගෙය තුලෙහි ගිනිසිළු-ඇතත් තමකඳ යනු දීපයෙනි,**
**මැතිසෙන් නොමදැතත්-දිප බබලනු තෙදින නිරිඳුන්.**

**76. ඉසුරු අපමණ ඇති-රජුගෙ රටටත් සසල පැමිණේ,**
**ඉසුරු උන් කෙලෙසද-පවා ඉසුරු සසල නොකෙළෙද.**

---

75. ගෙයතුලෙහි, ගෘහාභ්‍යන්තරයෙහි; ගිනිසිළු, වහ්නිශිඛාවෝ; ඇතත්, විද්‍යමානවන්නාහු නමුත්; තමකඳ, අන්ධකාරස්කන්ධයතෙම; යනු, පහවන්නේ; දීපයෙනි, ප්‍රදීපකරණකොටගෙනය; (එමෙන්ම) නොමද,බොහෝවූ; මැතිසෙන්, මන්ත්‍රිසේනාවෝ; ඇතත්, ඇත්තාහුනමුත්; දීප, ද්වීපයතෙම; හෙවත් දිවයින; (රට) නිරිඳුන්තෙදිනි, රජුන්ගේ තෙජසින්; බබලනු, භ්‍රාජමානවේ.

75. භා:- ගෙවල් ඇතුලෙහි දල්වනලද ගින්න පවතින් නමුත් එම ගෙය ඇතුළෙහි පවත්නාවූ අන්ධකාරය පහවන්නේ පහන් ආලොකය කරණකොටගෙනමය. එපරිද්දෙන්ම බොහෝවූ අමාත්‍යසෙනාවෝ ඇත්තාහු නමුත් රටක් බබලන්නේ රජුගේ තෙජසින්මය.

76. අපමණ, ප්‍රමාණ රහිතවූ; ඉසුරුඇති, ඓශ්වර්‍ය්‍යයෙන් යුක්තවූ! රජුගෙ, රාජයාගේ, රටටත්, රාෂ්ට්‍රයටද; සසල, චඤ්චල භාවය; පැමිණේ, ප්‍රාප්තවන්නේය; ඉසුරු, ඊශ්වරදෙවයා; උන්, වාසයකළාවූ; කෙලෙසද පවා, කෛලාශපර්වතයෙහිද්‍ද පවා; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය; සසල නොකෙළෙද, (ශක්‍රතෙම), චඤ්චල නොකෙළේද.

76. භා:- අප්‍රමාණවූ ඓශ්වර්‍ය්‍යයඇති රජහුගේ රාජ්‍යයටත් චඤ්චලභාවය පැමිණේ. ඊශ්වරදිව්‍යරාජයා වාසයකරන්නාවූ කෛලාශපර්වතයෙහි ඓශ්වර්‍ය්‍යය ශක්‍රතෙම කම්පාකෙළේය. එනම්:- පුරාණකාලයෙහි සෙසු පර්වතයන්ටමෙන්ම කෛලාශපර්වතරාජයාටද විශාලතර පියාපත් පැවැත්තේය. එබැවින් එම කෛලාශපර්වතය ශක්‍රභවනයට පැමිණ ඇවිදින්ටවන්විට ශක්‍රයා ආදී දිව්‍යසමූහයාට මහත් පීඩා පැමිණෙන්ටවූයෙන් ශක්‍රතෙම වජ්‍රායුධයගෙන එම පර්වතයෙහිවූ පියාපත් සිඳහෙළුවේය. එයින් එම පර්වතයට පීඩාවක් හා ඒ ඇසුරුකොට වාසයකරන ඊශ්වරයාගේ සිතට මහත්වූ කම්පාවක්ද ඇතිවූබැව් පූර්වප්‍රවෘත්ති වලින් පෙණේ.

**77\. පුන්සඳට දෙවනා-තුරුද තමරැස පතුරුවන්නේ,**
**නිරිඳුන් පවතිනා-පණතමයි පවතිනේ මැතිවරු.**

**78\. උබය පස සුපහන්-නැතද නොහොබී සුරවරන්ටත්,**
**නිරිඳුන්ට නොහොබී-වියත් මැතිවර දෙපස නැතහොත්.**

**79\. දුකකුදු නොවී කිසි-දෙලොව සැපමොක්පතන වියතුනි!,**
**දෙකකුදු නොමසිතා-පස්පවින් වැලකී කරවපින්.**

---

77 පුන්සඳට, පූර්ණචන්ද්‍රයාහට; දෙවනා, විතීයවන්නාවූ; තුරුද, තාරකාසමූහයාද; තමරැස, තමාගේ (චන්ද්‍ර) රශ්මිය; පතුරුවන්නේ, ප්‍රකාශකරන්නේය; මැතිවරු, මන්ත්‍රිසමූහයා; පවතිනේ, පවත්නේ; නිරිඳුන්, නරේන්ද්‍රයන් විසින්; පවතිනා, ප්‍රවෘත්තවන්නාවූ; පණතමයි, පණතෙහිමැයි.

77\. භා:- පූර්ණචන්ද්‍රයාට දෙවෙනිවූ තාරකා සමූහයාද චන්ද්‍රයාගේම රශ්මිය ප්‍රකාශකරන්නේය. එබැවින් තාරකාවන්හි පැණෙන රශ්මියද චන්ද්‍රයාකෙරෙහි විද්‍යමාන රශ්මියමිස අන්‍ය රශ්මියක් නොවන්නේය. එමෙන්ම ඇමැතියෝද රජුන්පවත්නා පණතෙහිම පවතින්නාහුය ඔවුන්ට අන්පණතෙක් නැත්තේමැයි.

78\. උබයපස, උභයපාර්ශ්වය; සුපහන්නැතද, ඉතා ප්‍රසාදජනක නොවේනම්; සුරවරන්ටත්, දිව්‍යරාජයන්ටවුවත්; නොහොබී, බැබලීමක් නොවන්නේය; (එමෙන්ම) දෙපස, උභය පාර්ශ්වයෙහි; වියත්මැතිවර, ව්‍යක්ත මන්ත්‍රිවරයෝ; නැතහොත්, අවිද්‍යමානවෙත්නම්; නිරිඳුන්ට, නරේන්ද්‍රයන්ට; නොහොබී, බැබලීමක් නොවන්නේමැයි.

79 කිසිදුකකුදුනොවී, කිසිත් දුකක්නොව; දෙලොව්, උභයලෝකයෙහි; සැපමොක්, සෞඛ්‍යයහා මොක්ෂය; පතන, ප්‍රාර්ථනාකරන්නාවූ; වියතුනි!, ව්‍යක්තයෙනි!; දෙකකුදු නොම සිතා, දෙසිතක් නොසිතාම; හෙවත් ලාභාලාභවිය ගැන නොතකාම; නොහොත්, දෙකකුදු, පරලොවක් ඇද්ද නැද්ද යන දෙසිතක්; නොමසිතා, චින්තනය නොකොටම; පස් පවින්, පඤ්චවිධ පාපයන්; වැලකී තුරන්ව; පින්කරව්, කුසල් කලමැනවි.

### පඤ්චවිධ පාපයකම්.

79\. සතුන්මැරීමය, සොරකම්කිරීමය, කාමයෙහි වරදවා හැසිරීමය, බොරුකීමය, මත්පැන් පානයකිරීමය, යන පසයි. මෙද සාහත්ථිකය, ආණත්තිකයයි දෙවැදෑම්. සාහත්ථිකය යනු සියතින් කිරීමයි. ආණත්තිකය යනු අණකිරීමෙන්

කරවීමයි. සාහත්ථික කර්මය වනාහි සතකු කෙරෙහි. මොහු
ප්‍රාණවත් සතෙකැයි දැනගැණීමද, ඔහු මරමි යන චෙතනාවද,
ආයුධ දඬු ආදියෙන් කැපීම් කෙටීම් වශයෙන් ඊටකරන උප
ක්‍රමයද, එම උපක්‍රමයෙන් දිවිතොරකිරීමද යන තමාඅතින් සිඬ
වන්නාවූ ප්‍රාණහිංසාතොමෝ අඞ්ගසතරකින් යුක්තවන්නීය.
ආණත්තිකය වනාහි අභිප්‍රායවූ පරිද්දෙන් සත්ත්වඝාතනය පිණිස
නියොගකිරීමද, මරන්නහු විසින් ඔහුගේ නියමය පිළිගැණීමද,
සත්ත්වයෙක් බව දැනගැනීමද, නසමි යන චෙතනාවද, ඊට
කරනලද උපක්‍රමයද, ඔහුවිසින් නියමකළලෙසම දිවිතොරකිරී
මද, යන ෂඞ්ඞගය සම්පූර්ණවීමෙන් ආණත්තික සත්ත්වඝාතන
අකුශලකර්මය සම්පූර්ණවන්නේය. (2) අදත්තාදානකර්මය වනාහි
අනුන්සතු වස්තුවක්බවය, අනුන් අයිතියයි දැනුම්ඇතිබවය,
සොරකම්කරමි යන චෙතනාවය, සියතින් ඊටකරන ප්‍රයොගය,
තුබූතැනින් පහකිරීමය යනමේ පස සවගසනයෙන් සිදුවන අද
ත්තාදාන කර්මයෙහි අඞ්ගයෝයි.

ආණත්තික කර්මය වනාහී සොරකම්කිරීමට අණකිරීමය,
එලෙසම එම නියොගය පිළිගැණීමය, ප්‍රතිඥාව නොනසා එසෙ
සින්ම කිරීමය, අන්සතුදෙයක්වීමය, අන්සතුයයි දැනීමය, සොර
කම්කරවමි යන සිතය, යනමේ අඞ්ගපස සම්පූර්ණවීමෙන් ආණ
ත්තික අදත්තාදාන අකුසලකර්මය සිදුවන්නේය. (3) කාමමිථ්‍යා
චාරය වනාහි අන්සතු ස්ත්‍රියක්වීමද, අන්සතුය යන දැනීමද,
සේවනයකරමි යන සිතද, මගින්මග සේවනය කිරීමදැයි යන
කාමයෙහි වරදවා හැසිරීමෙහි සතරඅඞ්ගයක් වන්නේය. (4)
මෘෂාවාදකර්මය වනාහි ඇසීම් දැකීම් වශයෙන් තමන් දැනගත්
දෙය සඟවන සිතද, ඊට ඇතුළත් වචනද, එම වචනාර්ථය අසන්
නහු පිළිගැනීමදැයි. මුසාවාදයට අඞ්ගතුනක් ඇත්තේයයි දත
යුතුයි. (5) මද්‍යපානකර්මය වනාහි සුරාවක්බව දැනීමද, පීමට
කැමැතිබවද, බොනු පිණිස කරන ප්‍රයොදයද, පානයකිරීමද යන
අඞ්ගසතරක් වන්නේය. මෙම පඤ්චපාපාදියෙහි යෙදෙන්න
වුන් විසින් ලබන ඝොරතර කටුක භයානක අනන්ත දුක්රාශිය
ලිගන්වයාමෙන් ඉතා විශාල ලිපියක් වනබැවින් පඤ්චපාපයෙහි
අඞ්ග පමණක් සැකෙවින් දක්වා සමාප්තකළෙමු. විස්තර නිම්
ජාතකාදී පොත්වලින් බලා දැනගතයුතුයි.

දශපුණ්‍යක්‍රියාවෝ නම්:– දානය, සීලය, භාවනාය, අන්‍යයන්ට
පින්දීමය, පින්ගැනීමය, ගිලංහට සිල්වත්හට වතාවත්කිරීමය,
සිල්වත් ගුණවත්නට පූජාකිරීමය, බණකීමය, බණඇසීමය,
දෘෂ්ටිය ඍජුකිරීමය, හෙවත් සම්‍යක්දෘෂ්ටිකාව විසීමය, යනමොහු
දශපුණ්‍යක්‍රියාව නම්වේ.

**80. සව්සතට යහපත්-ලෙසට දවසරින නුවණැතියෝ,**
**මියපරලොවගියත්-ලබත් සුරනර සැපත් නිවනුත්.**

**81. බියෙන් තමවෙතපත්-සතන්නොබවා යෙහෙන් රැකියෝ,**
**බියක්නොව කලෙකත්-විඳිති සුරසිරිමොක්ලබනතෙක්***

**82. නිරාදුකටද වැඩි†-දුකෙක් නැත දිවඇසින් බැලුවත්,**
**ඊට අනතුරැවේ**-දෙගුරුන් නොරැක බඩවඩනවා.**

---

80. සව්සතට, සකලසත්ත්වයන්ට; යහපත්ලෙසට, යොග්‍ය වන පරිද්දෙන්; දවස්අරින, දිවසාතික්‍රමණය කරන්නාවූ; නුවණැතියෝ, ප්‍රාඥජනයෝතුමූ; මියපරලොවගියත්, මැරී පරලොකයට ගියාහුනමුත්; සුරනරසැපත්, දිව්‍යමනුෂ්‍යසම්පත්හා; නිවනුත්, නිර්වාණයත්; ලබත්, ලබන්නාහුය.

81. බියෙන්, භීතියෙන්යුක්තව; තමවෙතපත්, තමාකරා පැමිණියාවූ; හෙවත් තමන්ගෙන් පිහිට තකා පැමිණෙන්නාවූ; සතන්, සත්ත්වයන්; නොබවා, භයනොගන්වා; යෙහෙන්, යහපත් සේ; රැකියෝ, රක්ෂාකළජනයෝ; කලෙකත්, කිසිදුකාලයෙක් හිත්; බියක්නොව, (අන්‍යයන්ගෙන්වන) භීතියකට නොපැමිණ; මොක්ලබනතෙක්, මොක්ෂය ලබනතාක්ම; සුරසිරි, දිව්‍යඓශ්වර්‍ය්‍යය; විඳිති, විඳින්නාහුය.

82. නිරාදුකටදවැඩි, නිරයදුඃඛයටද අධිකවූ; දුකෙක්, දුඃඛයෙක්තෙම; දිවඇසින් බැලුවත්, දිව්‍යනෙත්‍රයෙන් නිරීක්ෂණය කරනලද්දේ නමුත්; නැත්, අවිද්‍යමානවේ; දෙගුරුන්, (ස්වීය) මාතෘපිතෘන්; නොරැක, රක්ෂානොකොට; බඩවඩනවා, බඩ වැඩීමතෙම; හෙවත් මව්පියන් පොෂ්‍යනොකොට ජීවත්වීම; ඊට, ඒනිරයදුකටදවඩා; අනතුරුවේ, අනන්තරායදෘයිවන්නේය.

82. භා:- දිවැසින් බැලුවත් නිරය දුඃඛයට අධිකවූ (හෙවත් නරකාදී සතරඅපායෙහි දුකටවැඩිවූ) දුකක් ලොකයෙහි නැත්තේය. ඊටදවඩා අනන්තරායදෘයක දුකනම් සවකීය මව්පියන් පොෂ්‍යනොකොට ජීවත්වීමවේ. මව්පියෝ තමහට බ්‍රහ්මයයිද, පූර්ව දෙවයයිද, පූර්වාචාර්‍ය්‍යයයිද, ආහුනෙය්‍යයයිද කියාතිබෙනබව දෙශනාන්තයින් දන්නාහුනම් මව්පියන් ගැන සලකාත්මය. අටවෙනි අග්බෝ රජතුමානන්ගේ චරිතාදිය බලා මව්පියඋපස්ථානය දැනගතයුතු.

---

81. *මොක්දකිනතෙක්- 82. †නිරාදුකටවැඩී-ඇතැම්.
**ඊටත් අනතුරුවේ-බොහෝ.

**83. සුතනඹු රන්රුවන්-නොමඳ කෙත්වත්හා දැසිදසුන්,**
**මෙසියලු තිබියදී-කළ පවු පිණුසි* යැවිවයන්නේ.**

**84. දියෙහිදු මස්පියුම්-කොඳ උපුල්හි ගඳ වෙනවෙනමෙන්,**
**එකකුසෙහි උපනත්-සතයා ගුණ වෙනවෙනම පවතිත්.**

**85. සියපණ සුතනඹුන්†-සව්සිරි විකුම් පවති නොසිතව,**
**නුවනැසිනි විමසා-බැලුව සිනෙන් ලත් ඉසුරුවැනි.**

---

83. සුතන්, පුත්‍රයෝය; අඹු, භාර්‍ය්‍යාවෝය; රන්, සවර්ණය; රුවන්, රත්නයෝය; නොමඳ, බොහෝවූ; කෙත්වත්හා, ක්‍ෂෙත්‍ර වස්තූන් සහිතවූ; දැසිදසුන්, දාසිදාසයෝය යන; මෙසියලු, මේ සියල්ල; තිබියදී, ශෙෂකොටතබා; යැවිවයන්නේ, තමාහාඑක්ව ගමනයකරන්නේ; කළ, (තමාවිසින්ම රැස්) කරන ලද්දවූ; පව් පිණුසි, පාපය හා කුශලය යන දෙකයි.

83. භා:- සත්ත්වයා පරලොවයනවිට තමාසන්තකවූ පුත්‍ර, භාර්‍ය්‍යා, රුවන්, ක්‍ෂෙත්‍ර, වස්තු,දාසිදාසාදී සියලුදෙයම ඉතිරිකොට තබා තමාවිසින් රැස්කරනලද්දවූ පින්පවුදෙකපමණක් රැගෙන පරලොව යන්නේය.

84. දියෙහිදු, ජලයෙහිහටගන්නාවූද; මස්, මත්ස්‍යය; පියුම්, පද්මය; කොඳ,හෙල්මැලිය; උපුල්හි, උත්පල යනමේ ද්‍රව්‍යයන්හි; ගඳ, ගන්ධය; වෙනවෙනමෙන්,වෙනස්වෙනස්ව පවත්නාක්මෙන්; එකකුසෙහි උපනත්, එකම මවුකුසෙහි උපන්නමුත්; සතන්, සත්වයන්ගේ; ගුණ, ගුණයෝ; වෙනවෙනම, වෙන්වෙන්වම; පව තිත්, පවත්නාහුය.

85. සියපණ, ස්වීය ප්‍රාණයද; සුතන්, පුත්‍රයෝද; අඹුන්, අම්බිකාවෝද; සව්සිරි, සකලසම්පත්තිහුද; විකුම්, වික්‍රමයද; (යන මේ සියල්ල) පවති, (තමාගේ අදහස්පරිද්දෙන්) පවත්නේයයි; නොසිතව්, චින්තනය නොකරව්; නුවණැසිනි, ප්‍රඥාචක්‍ෂුසින්; විමසා, පරීක්‍ෂාකොට; බැලුව, නිරීක්‍ෂණයකළහොත්; සිනෙන් ලත්, සවප්නයෙන් ලද්දවූ; ඉසුරුවැනි, ඓශ්වර්‍ය්‍යයක්වැන්නේය.

85. භා:- තමාගේ සවකීය ප්‍රාණයද, පුත්‍රයෝද, භාර්‍ය්‍යාවෝද, සියලු සම්පත්තිහුද, වික්‍රමයද යනමේ සියල්ල තමාගේ අදහස් පරිද්දෙන් පවතින්නේයයි නොසිතියයුතු. බුද්ධියෙන් විමසා බැලුවහොත් මේ සියල්ලම සිනෙන්දුටු සම්පත්තියක්මෙන් වන්නේය.

---

83. *පිණිසි-නැම. 85. †සුතනඹුවන්-තිසි.

86. දුකක් සැලසුනු සත-තෙදැතියන් නමකියා ගැලවෙත්,
සපුන්සත ඩැහැකල-ගුරුළිඳු අණින් විසබානවැනි.

87. දත්හිවත් හැකිල-නෙත් කෙස් සුදුව ගතරැලිවැටී
එත්ලී එලිගෙණ-සිත්තරුණබව නොයේ මිනිසුන්.

88. රුසිරි යොවුන් ගුණ-නැණ සියල්ලෙන් නොඅඩුවිමුත්,
නොදතොත් සිල්පසත-සුවඳනැති කැලමල් සමවේ.

89. තමා තනිකරමින්-දෙදෙනෙක් සතුරුව වෙසෙත්නම්,
උපදෙසිනි කිසියම්-එකෙකු ඉන්†ගත සිතුව සැදේ.

---

86. දුකක්, දුඃඛයක්; සැලසුනු, සැලසුනාවූ; සත, සත්ත්වයෝ; තෙදැතියන්, තෙජොගුණයුක්තයන්ගේ; නමකියා, නාමමාත්‍රය ප්‍රකාශකොට; ගැලවෙත්, මුක්තවෙති; සපුන්, සර්පයන් විසින්; සත, සත්ත්වයා; ඩැහැකල,දෂ්ටකළකල්හි; ගුරුළිඳුඅණින්, ගුරුළුරාජයාගේ ආඥාබලයෙන්; විසබානවැනි,විෂබස්වන්නාක් මෙනි.

87. දත් දන්තයන්; හී, පතිතව; වත්, වක්ත්‍රය; (මුහුන) හැකිල, සඞ්කුචිතව; නෙත්, නෙත්‍රහා; කෙස්, කෙසයන්; සුදුව, ශ්වෙතවර්ණව; ගත, ගාත්‍රයෙහි; රැලිවැටී, වලිපතිතව; ලී, දණ්ඩක්හි; එලීගෙන අවලම්බිතව; එත්,(මනුෂ්‍යයෝ)එන්නාහුනමුත්; මිනිසුන්, මනුෂ්‍යයන්ගේ; සිත්, චිත්තයෙහි; තරුණබව, තරුණභාවයතෙම; නොයේ, පහනොවන්නේමය

87. භා:- මුඛයෙහි දත්වැටී මුහුනඇකිලී ඇස්නොපෙණී හිසකෙස්සුදුව ශරීරයෙහි රැලිවැටී දණ්ඩක්රැගෙන සත්ත්වයෝ හැසිරෙන්නාහු නමුත් චිත්තයන්හි තරුණභාවය පහනොවන්නේමය.

88. රුසිරි, රූපශ්‍රිය; යොවුන්, තරුණභාවය; ගුණ.ගුණය; නැණ, ප්‍රඥායතමේ; සියල්ලෙන්, සියලුකාරණයන්ගෙන්; නොඅඩුවිමුත්, ඌනනොවන්නේනමුත්; සත, සත්ත්වයා; සිල්පනොදතොත්, ශිල්පයක් නොදත්තේනම්; සුවඳනැති, සුගන්ධහිතවූ; කැලමල්, එනම් පුෂ්පයන් හා; සමවේ, සදෘශවන්නේය.

89. තමා, තමන්; තනිකරමින්, හුදකලාකරමින්; දෙදෙනෙක්, ජනයෝදෙන්නෙක්; සතුරුව, විරුඬව; වෙසෙත්නම්, වාසයකෙරෙත්නම්; කිසියම් උපදෙසින්, යම්කිසි උපදෙශයකින්; ඉන්, ඔවුන්දෙදෙනා අතුරෙන්; එකෙකු, එක්තැනැත්තෙකු; ගත, (තමන්ගේ වසගත්වයට) ග්‍රහණයකළහොත්; සිතුව, චින්තනයකරනලද්ද; සැදේ, සිඬවන්නේය.

---

89. *ඉන්එකෙකු-ඇතැම්.

90. දියතුලෙහිදී මුත්-ගොඩටපත් කිඹුලු* දියනොලබත්,
එමෙනරණවලඋන්†-රුපුන් නොතසත් තැන්පත්තෝ.

91. ඔවාදෙනු පරහට-තමා සම්මතෙකි පිහිටා සිට,
දුසිරිතදනන්දෙන-ඔවා වැද්දන් කියන බණිවැනි.

92. තමහට නොසරිවන-සබාමැද කරබා ඉඳිනුමැන,
සඳදුක කොඳ පුබුදු-වනුදුසා** පියුම් හැකිලෙනමෙන්.

---

90. දියතුලෙහිදීමුත්, ජලාභ්‍යන්තරයෙහිදීමවිනා; ගොඩට පත්, ස්ථලප්‍රදේශයට ප්‍රාප්තවූ; කිඹුලු, කුම්භීලයෝ; දිය, ජයක්; නොලබත්, නොලබන්නාහුය; එමෙන් . එපරිද්දෙන්ම; අරණවල උන්.(බියෙන්පැනගොස්)ආරණ්‍යයෙහි සැඟවිඋන්නාවූ; රුපුන්, ශත්‍රුජනයන්; තැන්පත්තෝ,යොග්‍යස්ථානවාසීජනයෝ; හෙවත් ගරුපදවිදරණ මනුෂ්‍යයෝ; නොතසත්, නොමනසන්නාහුය.

90. භා:- කුම්භීලයා තමහට නියත ස්ථානයවූ ජලයේදීම තමාගේ වික්‍රමය දක්වා සත්ත්වයන් මැරීමට ශක්ති ඇත්තාහු නමුත් ගොඩබිමදී එසේකිරීමට .එපමණ) ශක්ති නැත්තාහුය. එමෙන්ම:- උතුමෝ තමහට ස්ථානයවූ ග්‍රාමනගරාදියෙහිදී වරද කළ සතුරු ජනයන්ට තාඩනපීඩනාදිය කරනනමුත් බියෙන් අරණ්‍යයටවන් සත්ත්වයන්ට එසේ නොකරන්නාහුමය.

91. තමා, තමන්; හෙවත් අවවාදකරන පුද්ගලතෙම; සම්මතෙකි, මහාජනසම්මතාවස්ථාවෙහි; හෙවත් නිර්දෝෂත්වයෙහි; පිහිටාසිට, ප්‍රතිෂ්ඨිතව සිටගෙන; පරහට, අන්‍යයාට; ඔවාදෙනු, අවවාදකරන්නේය; දුසිරිත, දුෂ්ටචරිත ඇත්තාවූ; දනන්, ජනයන්විසින්; දෙන, දෙනුලැබන්නාවූ; ඔවා, අවවාදයතෙම; වැද්දන්, ව්‍යාධපුරුෂයන්විසින්; කියන, කථනයකරනු ලබන්නාවූ; බණවැනි, ධර්මය වැන්නේය.

92. තමහට, තමන්ට; නොසරිවන, සදෘශනොවන්නාවූ; සබාමැද, සභාමධ්‍යයෙහි; කරබා, අධෝමුඛව; ඉඳිනු, ඉඳීමතෙම; මැන,යහපත්වේ (නොබඳුදයත්?) සඳදුක,චන්ද්‍රයා දර්ශනයකොට; කොඳ, කුඤ්ඤපුෂ්පයන්. පුබුදුවනු, ප්‍රබුද්ධවනනියාව; දුසා, දර්ශනය කොට; පියුම්, පද්මයන්; හැකිලෙනමෙන්, සඞ්කුචිතවන්නාක් මෙනි.

92 කුඤ්ඤපුෂ්පයෝ චන්ද්‍රරශ්මියෙන් ප්‍රබොධවන්නෝය පද්මයෝ සූය්‍ර්‍යරශ්මියෙන් ප්‍රබොධවන්නෝය. එම කුඤ්ඤපුෂ්පයන් චන්ද්‍රරශ්මියෙන් ප්‍රබොධවීමට පැමිණෙනවිට පද්මයන්ගේ හැකිලීම වන්නේය. එමෙන්ම තමහට නොසරිවන සභාමධ්‍යයෙහි නිශ්ශබ්දව විසීම යහපත්වන්නේය.

---

90. *ගොඩපත් කිඹුලන්-බොහෝ. † එමෙන් අරණවල-හැම.
92. **සඳදුක-පුබුදුවන් කොඳ දුසා-වැඩි.

93. නොමයව් සබමැදට*-යම්සෙ පැමිණියත් නොදෙව්බස්†
කියත මැදහත්වව්-නිරයෙ අන්නැකියා නොවැටෙව්.**

94. අවිදුන්ට කිසියම්-සලසා පමණකර ඉදිතසත්,
වලන්කරනාමැටි-තබාකරනෙව් බඳුන් වැල්ලෙන්.††

95. සුදන සහ වීමට-වැඩිය යහපති සොරුන් ඉතකම්,
සොරු දනපැහැරගෙන්-සුදන මනතුට රැගෙනයනුවෙත්

---

93. සබමැදට, සභාමධ්‍යයට; නොමයව්, ප්‍රවිෂ්ටනොවව්; යම්සේ, යම්පරිද්දෙකින්; පැමිණියත්, ප්‍රාප්තවූයේනමුත්; බස්, වචනයන්; නොදෙව්, දානයනොකරව්; කියත, (ඉදින්) කියත් නම්; මැදහත්වව්, මධ්‍යස්ථවව්; අන්නැකියා, අයුතුබස් ප්‍රකාශ කොට; නිරයෙ, නරකයෙහි; නොවැටෙව්, පතිතනොවව්.

93. භා:- සභාමධ්‍යයට කිසිවිටෙකත් නොපැමිණියයුතුය. යම්හැටියකින් පැමිණියත් බස් ප්‍රකාශනොකොට ඉදීම යහපත් ය. ඉදින් කථාවක්කෙරේනම් මධ්‍යස්ථව කළයුතුවේ. අයුතු අන්දමේ කථාකොට අපායට නොයව්.

94. අවිදුන්ට, අවිඥපුරුෂයන්ට; යම්කිසි, යම්කිසි කාර්‍ය්‍ය යක්; සලසා, සලස්වා; පමණකර, (එයම) ප්‍රමාණකොට; ඉදින, වාසයකරන්නාවූ; සත්, සත්ත්වයෝ; (කෙබඳුද?) වලන්කරනා, භාජනතැනීමට යොග්‍යවූ; මැටි, මෘත්තිකාවන්; තබා,අත්හැරලා; වැල්ලෙන්, වාලුකායෙන්; බඳුන්, භාජනයන්; කරනෙව්, කරන් නාක් වැන්නෝය.

95. සුදන, සත්පුරුෂයන්හා; සහවීමටවැඩිය, සමගිවීමට වැඩියෙන්; (සභායවීමට වැඩියෙන්) සොරුන්, චෞරයන්ගේ; ඉතකම්, හිතවද්භාවයතෙම; යහපති, මනාවන්නේය; (කුමක් හෙයින්දයත්?) සොරු, චෞරපුරුෂයෝ; දන, වස්තුව; පැහැර යෙන්, ග්‍රහණයකොටයෙති; සුදන, සත්පුරුෂයෝ; මනතුට, චිත්තසන්තුෂ්ටිය; රැගෙණ, ග්‍රහණයකොට; යනුවෙත්, යන්නෝ වෙති.

95. භා:- සත්පුරුෂයන්හා සමගිවීමට වැඩියෙන් සොරුන් හා මිත්‍රධර්මය පැවැත්වීම යහපත්වන්නේය. චෞරයෝ වස්තුව පමණක් පැහැරගෙන යන්නාහ. සත්පුරුෂයෝ චිත්තසන්තුෂ්ටිය පමණක් ගෙනයන්නෝය. එසේ චිත්තසන්තුෂ්ටිය ගෙනයාමෙන් කිසිසෙත් හානියක් නොවන්නේය. වස්තුව ගෙනයාමෙන්ම හානිය පැමිණෙනහෙයින් සොරුහා සමග මිත්‍රවීමෙන් එම හානි ය වළකින්නේය. එබැවින් සොරුන්හා සමග මිත්‍රවීම ශ්‍රේෂ්ඨයයි දක්වනලදී.

---

93. *නොයව් සබමැදයට-හැම. †නොදෙනුබස්-හැම. **අන් නැකියා නිරයේ නොවැටෙව්-හැම. 94. ††තබාබඳුන්කරනෙව් වැල්ලෙන්-හැම.

**96.** **තදරැදු ගුණැතිහට-තදරැදු කෙනෙකි පිහිටවන්නේ,**
**සඳහට වසිරවි-සොරැනට අඳුරැ පිහිටවනමෙන්.**

**97.** **සුරතුරු බඳුරැකල-සිතුමිණි සුරබිදෙනුද සිරිදෙනු***
**තෙරුවන්වැඳ අදර-කලසතට සව්සිරිත් මොක්වේ†.**

---

96. තද, ඝනබද්ධවූ; රුදුගුණැතිහට, රෞද්‍රගුණඇත්තාහට; පිහිටවන්නේ, ප්‍රතිෂ්ඨාස්ථානවන්නේ; තද, ඝනබද්ධවූ. රුදුමකෙනෙකි, රෞද්‍රවූම කෙනෙක්ය; සඳහට, චන්ද්‍රයාට; වසිරවි, ශත්‍රුභූතව; අඳුරැ, අන්ධකාරයතෙම; සොරැනට, චෞරයන්ට; පිහිටවනමෙන්, ප්‍රතිෂ්ඨාස්ථානයක් වන්නාක්මෙනි.

97. සුරතුරු, කල්පවෘක්ෂය; බඳුරැකල, භද්‍රඝටය; සිතුමිණි, චින්තාමාණික්‍යය; සුරබිදෙනුද, සුරභිධෙනුවද යනමොහු; සිරි, (අභීෂ්ට) සම්පත්තිය; දෙනු, දෙනයකරත්; තෙරුවන්, බුද්ධාදිරත්නත්‍රය; වැඳ, ප්‍රණාමයකොට; අදරකල, ගෞරවකළාවූ; සතට, සත්ත්වයාට; සව්සිරිත්, සකලසම්පත්තීහුද; මොක්, මොක්ෂයද; වේ, අත්වන්නේය.

97. භා:- සුරතුරුනම්-දිව්‍යලෝකයෙහි පවත්නා ආශ්චර්‍ය්‍යවූ වෘක්ෂපසෙකි. එනම්:- මන්දාරය, පාරිජාතකය, සන්තානය, කල්පවෘක්ෂය, හරිචන්දනය, යන දිව්‍ය වෘක්ෂපසවෙති. මෙයින් කල්පවෘක්ෂයවනාහි උතුරුකුරුදිවයිනෙහි විද්‍යමානවූද එම දිවයිනෙහි වෘක්ෂයන්ට ප්‍රධානවූද වෘක්ෂයයි. ශක්‍රභවනයෙහි දිව්‍යවෘක්ෂයන්ට ප්‍රධානවූ වෘක්ෂයනම් පාරිජාතවෘක්ෂයයි. මේතෙම විෂ්ණුආදි දිව්‍යයන්විසින් ක්ෂීරාර්ණවය ආලෝලනය කරනුලබන සමයෙහි උද්භූතවූ සුගන්ධ පුෂ්පයෙන් යුක්තවූ වෘක්ෂයවෙයි. භද්‍රඝටය නම්- අභිමතාර්ථසාධනයකරන්නාවූ කුම්භවිශෙෂයෙකි. එයත් දෙව්ලොව පවත්නේයයි දතයුතු. එයින් කොතෙක්කල් කොතෙක් වස්තුව ගනුලැබූවත් වස්තූන්ගේ ඌනත්වයක් නොදක්නාලැබේ. කුම්භජාතකයෙන් විස්තර දතයුතු.

චින්තාමාණික්‍යය නම්:- සිතූ පැතූදෙය ලබාදෙන මාණික්‍ය රත්නයෙකි. මෙය යමෙකුගේ සමීපයෙහි විද්‍යමානවේනම් ඔහට කිසිවිටෙකත් කිසිම වස්තුවකින් ඌනත්වයක් නොවනබව කියාතිබේ. මේ මාණික්‍යරත්නය වනාහී ශ්‍රීවිෂ්ණුදිව්‍යරාජයා ක්ෂීරාර්ණවය ආලෝලනයකරනුලබනකල්හී උද්ගතවූ මාණික්‍ය රත්නයක්බව කාව්‍යසමයෙහි කියාතිබේ.

සුරභිධෙනුව:- මේ සුරභිධෙනුව දිව්‍යලෝකයෙහි කල්පවෘක්ෂය මූල වාසයකරනබවද, සියලු දිව්‍යරාජයන් ඈයට මල් පහන් ආදිය පුදා අභිමතසම්පත් ලබනබවද, යම් දිව්‍යරාජයෙක් ඈයට සත්කාරනොකෙරේනම් ඔහුට ඈ විසින් අපකාරනුලබන බවත් කියාතිබේ. දිලීපරාජයාට දරුවන් නොලැබීමට හෙතුව එම ධෙනුවට සත්කාර නොකිරීමයයි රඝුවංශාදියෙහි දක්නාලැබේ.

---

97. *සුරබිදෙනු සිරිදෙනු-හැම. †සව්සිරින්මොක්වේ-හැම.

**98. සිගජරන්රුවන්-නාලිය තවුස්* සත්දත්,**
**සත්සම් රටෙකයන්-අදරකෙරෙයන්නොමද සතුටින්.**

**99. සිතනැති ගල්ගුහා-පවා තපසුන්ට පිහිටවෙත්,**
**දෙලොවෙහි වැඩදනත්-සතන් නොරකිනු කිම්දවියතුනි†**

**100. මහපින්ඇතිදනෝ-උතුම්වෙත් ඉසුරෙන් සුරන්ටත්,**
**නරවෙසින් සක්පුර-රජයනොකෙළෙද මන්දතුරජ.**

---

98. සී, සිංහයෝය; ගජ, හස්තීහුය; රන්, සවර්ණය; රුවන්, රත්නය; නා, නායකයෝය; හෙවත් ශ්‍රෙෂ්ඨ පුද්ගලයෝය; ලිය, කාන්තාවෝය; නොහොත් නාලිය, ඇතින්නෝය; තවුස්, තාපස යෝය; සත්දත්, ශාස්ත්‍රධාරීහුය; (යන) සත්, (මේ) සත්තවයෝ; යම්රටෙක, යම් රාෂ්ට්‍රයක්හි; යත්, සඞ්වාරණය කෙරෙත්නම්; සත්, අන්‍යසත්වවර්ගීතෙමේ; නොමඳ සතුටින්, බොහෝවූ සන්තුෂ්ටි යෙන් යුක්තව; අදරකෙරේ, (ඔවුන්ට) ගෞරවකරන්නේය.

99. සිතනැති, සිත්නැත්තාවූ; ගල්ගුහා පවා, ශෛලගහ්වර යෝද පවා; හෙවත් ගල්ගුහාපවා; තපසුන්ට, තාපසයන්ට; පිහිටවෙත්, ප්‍රතිෂ්ඨාස්ථානවන්නාහ; වියතුනි!, ව්‍යක්තජනයෙනි!; (තෙපි) දෙලොවෙහි, උභයලොකයෙහි (ම); වැඩ, වෘඩිය; දනත්, ජානනයකොටත්; සතන්, සත්ත්වයන්; නොරකිනු, රක්ෂානොක රන්නේ; කිම්ද?, කිමෙක්ද?.

100. මහපින්ඇති, මහාපුණ්‍යයෙන් යුක්තවූ; දනෝ, ජන යෝතුමූ; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍ය හෙතුකොටගෙන; සුරන්ටත්, දිව්‍යයන්ටත්; (වඩා) උතුම්වෙත්, ශ්‍රෙෂ්ඨවෙති; මන්දතුරජ, මහා මන්ධාතුරජතෙම; නරවෙසිනි, මනුෂ්‍යවෙෂධාරීව සිටගෙන; සක් පුර, ශක්‍රපුරයෙහි; රජයනොකෙළෙද?, රාජ්‍යයනොකෙළේද? (කෙළෙමැයි.)

100. භා:- මහාභාග්‍යවයන් යුක්ත ජනයෝ ඓශ්වර්‍ය්‍ය හෙතුකොටගෙන දෙවියන්ටත් වැඩියෙන් ශ්‍රෙෂ්ඨවන්නාහුය. මහාමන්ධාතුරජතෙම වනාහී මනුෂ්‍යවෙෂයෙන් සිටගෙනම හවුරුදු තුන් කෙළ සැටලක්ෂයක් ආයුෂඇතිව ශක්‍රයින් තිස්හය දෙනෙකුන් චුතවනතුරුත් ශක්‍රභවනයෙහිම දිව්‍යරාජ්‍යයකොට ආයුෂ පිරිහීමෙන් පෙරලා මනුෂ්‍යලොකයට පැමිණ මඟුල්උය නෙහි පතවනලද ආසනයෙහි නොනැගිටින ශයනයෙන් ශයනය කොට කා එරියකෙළේය.

---

98. *නාලියපුවත්-හැම. 99.†ලෙව්නොරකිව්ද වියතුනි-ඇතැම්.

**101. නයගැන්ම ගම්බිම්-විකිණී මහතුන් වෙරද අන්දෙස්,**
**මේපස*කළසතන්-කුලයනස්නේ පසඩසඳමෙන්.**

**102. තෙදැතියහට විරිදු-දනෝගුණැතිය හැරනොවෙත්දුරු†,**
**නුබමිණට ගනඳුර-බිඳෙනසඳ සහ වසන විලසින්.**

**103. ඇතිතෙක්ම කඩතෙල්-අඳුරු දුරහැර පහණබැබලේ,**
**පින්ඇතිතෙක්දනෝ-සව්සිරිනි පරසිඳුව බබලත්.**

---

101. නයගැන්ම, නයගැනීමය; ගම්බිම්විකිණී;(ම) ග්‍රාමභූමි විකුණුමය; මහතුන්වෙරද, උතුමන් හා විරුඬවීමය; අන්දෙස්, අන්‍යයන්ගේ දෝෂ ප්‍රකාශකිරීමය යන; මේපස, මේ පඤ්චකය; කළ, කළාවූ; සතන්, සත්ත්වයාගේ; කුලය, වංශයතෙම; පසඩ සඳමෙන්, කෘෂ්ණපක්ෂයෙහිවූ චන්ද්‍රයාපරිද්දෙන්; නස්නේ,විනාශ වන්නේය.

101. භා:- නයගැනීමද ගම්බිම් විකිණීමය-යන දෙකාර ණය, උත්තමයන් සමග වෛරවීමය, අන්‍යයන්ගේ දොස්කීමය යන කාරණාපස කළාවූ සත්ත්වයාගේ වංශය හෙවත් කුලය නැසෙන්නේවේ.

102. තෙදැතියහට, තෙජොගුණයුක්ත පුද්ගලයන්ට; විරිදු, විරුඬවන්නාවූ; දනෝ, ජනයෝතුමූ; ගුණැතියහැර, ගුණවත් ජනයන්පහකොට; දුරුනොවෙත්,දූරීභූතනොවෙති; නුබමිණට, සූර්‍යයා හෙතුකොටගෙන; බිඳෙන, හෙදයට පැමිණෙන්නාවූ; ගනඳුර, ඝනාන්ධකාරය; සඳසහ, චන්ද්‍රයා හා සමග; වසනවිලසින්, වාසයකරන්නාක්මෙනි.

102. භා:- සූර්‍යරශ්මිය හෙතුකොටගෙන කැඩීබිඳීයන්නාවූ අන්ධකාරයතෙම චන්ද්‍රයාවිසින් ඇසුරුකරනුලැබේ. එමෙන්ම තෙජොගුණයුක්ත උතුමන්ට විරුඬ ජනයෝ ගුණැතියන්විසින් ආශ්‍රයටගෙන සතසනුලැබෙත්.

103. කඩතෙල්, පහන්වැටිය හා තෛලය; ඇතිතෙක්ම, විද්‍යමානවනතාක්ම; පහණ, ප්‍රදීපයතෙම; අඳුරු, අන්ධකාරය; දුරහැර. දූරීභූතකොටයවා; බැබලේ, භ්‍රාජමානවන්නේය; (එමෙන්ම) දනෝ, ජනයෝ; පින්ඇතිතෙක්, පුණ්‍යවිපාකය විද්‍යමාන තාක්ම; සව්සිරිනි, සකල සම්පත්තියෙන් යුක්තව; පරසිඳුව, ප්‍රසිඬව; බබලත්, භ්‍රාජමානවෙත්.

---

101. * මේදෙස-ඇතැම්. 102. † ගුණැතියහැරනොවෙන් **දුරු-වැඩි.**

**104. උතුමෝපවාලොව-නිවැරදි සතස් නමුන් බඳවත්,**
**කළවරදට රවුළු*-දියරම් නොබැඳවිද සමුදුර.**

**105. ඇමසැපමඇතිතැන්-මුලුලොවමනැතිනැණින්බැලුවත්,**
**කප්තුරුපවාඇති-උතුරුකුරුදිව යකුන් බියවේ.**

---

104. ලොව, ලොකයෙහි; උතුමෝපවා, උත්තමයෝදපවා; නිවැරදිසතන් නමුත්, නිර්දොෂ සත්ත්වයන්වුවද; බඳවත්, බන්ධනයට පමුණුවත්; හෙවත් පීඩාවටපත්කරත්; රවුළු, රාවණ රාජයාවිසින්; කළ, කරනලද්දාවූ; වරදට, අපරාධයට; දියරම්, ජගත් රාමරජතෙමේ; සමුදුර, සමුද්‍රය; නොබැඳවිද, බන්ධනය නොකරවීද.

104. භා:- රාමරාජයාගේ මහිෂීභූත සීතාදෙවීතොමෝ රාවණරාජයාවිසින් පැහැරගෙනඑනලද්දී ලඞ්කාවෙහිවූ අශොක වනයෙහි සඟවාතබනලදී. ඈය පෙරලාගෙනයාම පිණිස රාම රාජයාවිසින් මාගීය තනනුලබන්නේ සවකීය පිරිසලවා මහා සමුද්‍රය ගොඩකරවා එහි මාගීය සාදවනලද්දේය. රාමරාජයාගේ පිරිස එම මාගීයෙන් පැමිණ රාවණරජුහා යුදකොට සීතාදෙවි තොමෝ ගෙණයනලද්දීය.

105. ඇමසැපම, සකලසම්පත්තීන්ම; ඇතිතැන්, විද්‍යමාන ස්ථානයන්; නැණින්බැලුවත්, ප්‍රඥාවෙන් නිරීක්ෂණයකළත්; මුලු ලොවම, සමස්තලොකයෙහිම; නැති, නැත්තේය; කප්තුරුපවා ඇති, කල්පවෘක්ෂපවාවිද්‍යමානවන්නාවූද; උතුරුකුරුදිව, උත්තර කුරු ජනපදයෙහි; යකුන්බිය, යක්ෂයන්ගෙන් වන්නාවූ භීතිය; වේ, (විද්‍යමාන) වන්නේය.

105 භා:- වෙසමුණුමහරජුගේ පිරිවරයක්ෂයෝ උතුරු කුරුදිවයින්වැසි ගවදෙනුන් ඒකබුරවාහනකොට ඒ ඒ දිශාවන්හී ඇවිදිත්. එසේම අන්‍ය සිවුපාසතුන්ද එකබුරවාහනකොට නානාදිශාවන්හි ඇවිදිත්. බොහෝසෙයින් ගභිනිසත්‍රීන්ගේපිට නැගී ගමන්කරත්. අනික්සත්‍රීන් යානාවන්හී යොදා ඇවිදිත්. පුරුෂයන්ගෙන යානාවන්හී යොදා නොයෙක් දිශාවන්හි ඇවිදිත්. එසේ අල්ලාගන්නාහු නමුත් සම්‍යක්දෘෂ්ටිකයන් ගනුනොහැකිවෙත්. බෙහෙවින් පිටිසර වැද්දන් අල්ලාගෙන පිටනැගී ගමන්කරත්. කුමරුන්හා කුමාරිකාවන්ද ගෙන රථයානාවන්හි යොදා ගමන්කරත්. යක්ෂයන්විසින් මෙසේ මේ දිවයින්වැසි මිනිසුන් ගවයන්මෙන් යානාවන්හි යොදා වැඩගන්නාහෙයින් උතුරුකුරුදිවයින් වැස්සන්ට යකුන්ගෙන් රුදුරුබිය ඇතිවන්නාහුය.

---

104. *කළුවරදට අසුර-හැම.

**106. සවසිප්දත්වියත්-පඬිවරවෙතට පැමිණි අවියත්,**
**පහන රිවි පහනේ-අබිමුවෙහි පානෙව් නොබබලත්***

**107. පින්පව්කලසතන්-එකතැනදීම හැඳිනගන්නේ†**
**යානවාහනවල-හිඳිනවුන් සමහරෙක් උසුලත්.**

**108. නිතයෝ වැඩබස්-කිවත් නොඅසත් අසත් සුදනෝ,**
**නොඅසත් ගරඬිමතුරු-අසත් උරගිඳු නරන් දපකල.**

---

106. සව්සිප්, සකලශිල්පයන්; දත්, දැනගත්තාවූ; වියත්, ව්‍යක්තවූ; පඬිවරවෙතට, පණ්ඩිතවීරයා සමීපයට; පැමිණි, ප්‍රාප්තවූ; අවියත්, අව්‍යක්තපුරුෂයෝ; (කෙසේද?) පහන, ප්‍රාතඃකාලයෙහි; රිවි, සූර්‍ය්‍යයාගේ; අබිමුවෙහි, අභිමුඛයෙහි; පහනේ, ප්‍රදීපයක්; පානෙව්, ප්‍රකාශකරන්නාක්මෙන්; හෙවත් දක්වන්නාක්මෙන්; නොබබලත්, භ්‍රාජමානනොවෙත්.

106. භා:- සකල ශිල්පයන් දැනගත්තාවූ ව්‍යක්තවූ පණ්ඩිතයාගේ සම්මුඛයට පැමිණියාවූ අව්‍යක්ත (නූගත්) පුරුෂයා කෙසේදැයි යතහොත්? උදයකාලයෙහි සූර්‍ය්‍යයාගේ අභිමුඛයෙහි දල්වනලද පහනක්සෙයින්ම නොබබලන්නේය.

107. පින්පව්කල,පුණ්‍යයහා පාපයන්කලාවූ; සතන්,සත්ත්වයන්; එකතැනදීම, එකස්ථානයෙක්හිදීම; හැඳිනගන්නේ, ජානනය කරන්නේය; (කෙසේද?) යානවාහනවල, යානවාහනයන්හි; හිඳිනවුන්, නිෂණ්ණජනයන්; සමහරෙක්, ඇතැම්කෙනෙක්; උසුලත්, උද්වහනය කෙරෙත්.

207. භා:- කුසල්හා පවුකලාවූ සත්වයෝ එකතැනදීම හැඳිනගත හැකිවෙත්. කෙසේද?) යානවාහනවලින් ගමන්කරන පින්ඇති සත්ත්වයෝ පින්මද සමහර සත්ත්වකෙනෙකුන්විසින් උසුලනු ලබන්නාහුය.

108. නිතයෝ, හීනජනයෝතුමූ; වැඩබස්, වෘඞිදායකතෙපුලක්; කිවත් (උතුමෙකුවිසින්) කථනයකරනලද්දේනමුත්; නොඅසත්, ශ්‍රවණය නොකෙරෙත්; සුදනෝ, සාධුජනයෝතුමූ; අසත්, ශ්‍රවණයකෙරෙත්; ගරඬි, එනම් ප්‍රාණීහු; නරන්, මනුෂ්‍යයන් විසින්; දපකල, ජල්පනය කරනලද්දාවූ; මතුරු, මන්ත්‍රය; නොඅසත්, ශ්‍රවණයනොකරත්; උරගිඳු, නාගරාජයෝ; අසත්, ශ්‍රවණය කෙරෙත්මැයි.

---

106. *පහනෙව් නොබබලත්-හැම. 107. †බලාගන්නේ-ඇතැම්

**109.** **සබාබීරුකවූ-නැණැතිය උගත් නොමඳ සොඳසිප්,**
**රුපුඅබිමුවටපත්-දුබලයෙකු අත අනගි අවිවැනි.**

**110.** **කිසියම්කම්කරව-නුවණින් බලා විමසා,**
**එකකට පටන්ගෙණ-පසුවිඳැ තැවෙනුවෝ අවිදුවෙත්.**

**111.** **නුපුළුවන් කිසියම්-කරලා සැපෙන අවියත්,**
**තමාම තමකරට*-නැගෙනු සඳහා විරියකරනෙව.**

**112.** **පිණින් පැමුණුනු දෙය-සිතාමදයයි පතනුවෝ සැප†**
**උවදුරු ඇතිගඟේ-පීනුම්නොදන පනිනවුන්මෙනි.**

---

109. සබාබීරුකවූ, සභාවට භයවන්නාවූ; නැණැතිය, ප්‍රාඥයාවිසින්; උගත්, උද්ග්‍රහණය කරනලද්දවූ; නොමඳ, අමඳවූ; සොඳ, සුන්දරවූ; සිප්, ශිල්පයතෙම; රුපු, ශත්‍රුන්ගේ; අබිමුවට පත්, සම්මුඛයට පැමිණියාවූ; දුබලයෙකු, දුර්වල පුරුෂයෙකුගේ; අත, හස්තයෙහි; (ස්ථාපිතවූ) අනගි, අනඝවූ; අවිවැනි, ආයුධය වැන්නේය.

110. යම්කිසි, යම්කිසි ප්‍රකාරවූද; කම්, කර්‍මයන්; හෙවත් යම්කිසි කාර්‍ය්‍යයක්; නුවණින්, බුද්ධියෙන්; බලා, නිරීක්ෂණයකොට; විමසා, පරීක්ෂණයකොට; කරව්, කරණුමැනවි; එකකට, එක් කාර්‍ය්‍යයකට; පටන්ගෙන, ආරම්භකොට; ඉඳ, සිටිනව; පසුව, පශ්චාත්කාලයෙහි; තැවෙනුවෝ, තැවීමට පත්වන්නෝ; අවිදු වෙත්, විඥයෝ වෙති.

111. නුපුළුවන්, කළනොහැක්කාවූ; කිසියම්, යම්කිසි කට යුත්තක්; කරලා, තමාපිට තබාගෙන; සැපෙන, ගැටෙන්නාවූ; අවියත්, අව්‍යක්තපුරුෂතෙම; (කෙසේද?) තමාම, තමන්ම; තම කරට, තමාගේම කරමත්තට; නැගෙනුසඳහා, නැගීමප්‍රිස; වීරිය, වීර්‍ය්‍යය; කරනෙව, කරන්නාක්මෙනි.

112. පිනින්, (තමාකළ) කර්‍මවශයෙන්; පැමුණුනු, ලබ්ධවූ; දෙය, විපාකය; මඳයයි, මන්දයයි; සිතා, චින්තනයකොට; සැප, (අධිකවූ) ඓශ්වර්‍ය්‍යය; හෙවත් සෞඛ්‍යය; පතනුවෝ, ප්‍රාර්ථනා කරන ජනයෝ; උවදුරුඇති, උපද්‍රවයන්ගෙන් යුක්තවූ; ගඟේ, ගඞ්ගාවෙක්හි; පීනුම්නොදන, පීනීමෙහි අදක්ෂවසිට; පනිනවුන් මෙනි, පනින්නවුන් වැන්නෝයි.

---

111. *තමාතමකරටම-කිසි.
112. †මදයසිතා ඉසුරුපතනුවෝ-වැනි.

113. උසරුකට නොනැගෙව්-තමබලවිතරටම වදන්දෙව,
නුවණැතියන්වදන්-ගණිව්නොගණිව් නොමිනිසුන්බස්

114. රෑදින දිවාමැද-තනිමග* පරගතන් සොරුන්පසු,
නොයව් ගිය අවැඩක්-පැමිණේය දනු සතුනි! සැකනැත්

115. දුටත් රත්රන්ඇණ-රණැසිනස්නාවිනා නොදනෙත්,
නිමලවනෙත් ඇතත්-රුවන්නොපෙණේ දිනමිණෙන්
මෙන්.

116. දනවත්තැනට ලගු-වත්දීමෙනුත් ලබත් දන දන,
ලොවඳුරුහල හිරුට-කරන පුදයෙහි පහන්ලනමෙනි.

---

113. උස, උත්තුඞ්ගවූ; රුකට, වෘක්ෂයට; නොනැගෙව්, ආරූඪනොවව්; තම, තමාගේ; බලවිතරටම, ශක්තිප්‍රමාණයටම; වදන්, වචනයන්; දෙව්, දූනයකරව්; නුවණැතියන්, ප්‍රාඥජන යන්ගේ; වදන්, වචනයන්; ගණිව්, (සිතට) ගණුමැන; නොමිනි සුන්, ප්‍රමාණනොවන මිනිසුන්ගේ; බස්, කීමක්; නොගණිව්, පිළිනොගනු.

114. සතුනි!, සත්ත්වයෙනි!; රෑදින, රාත්‍රිදවසෙහිද; දිවා මැද, දහවල්මධ්‍යයෙහිද; තනිමග,හුදකලාමාර්ගයෙහි; පරගතන්, පරස්ත්‍රීන්ගේද; සොරුන්, චෞරපුරුෂයන්ගේ; පසු, පශ්චාද් භාගයෙහි; නොයව්, ගමණයනොකරව්; ගිය,(ඉදින්)ගියහොත්; අවැඩක්, අනභිවෘඩියක්; පැමිණේය, ප්‍රාප්තවන්නේයයි; දනු, ජානනයකරනු; සැකනැත්, ශඞ්කාරහිතය.

114. රත්රන්ඇණ, සවර්ණමය ආණින්; දුටත්, දර්ශනය කළත්; රනැසි, සවර්ණය යන භෙදයතෙම; නස්නාවිනා, උරගෑ මෙන්නොරව; නොදනේ, ජානනයනොවේ; නෙත්, නෙත්‍රයෝ; නිමලව ඇතත්, නිර්මලව ඇත්තාහු නමුත්; රුවන්, රත්නසමූහය තෙම; දිනමිණෙන්මෙන්, සූර්‍ය්‍යාගෙන්වාගේ; හෙවත් සූර්‍ය්‍යා ලෝකයෙන්වාගේ; නොපෙණේ, දෘශ්‍යමානනොවන්නේය.

116. දනවත්තැනට, ධනවන්තනැත්තාට; ලගු, සවල්ප වූ; වත්, වස්තුව; දීමෙනුත්, දීමහෙතුකොටගෙනද; දන,ජනයෝ; දනලබත්, ධනලාභීහුවෙත්; ලොව, ලොකයෙහි; අඳුරුහල, අන්ධ කාරය පහකළාවූ; හිරුට, සූර්‍ය්‍යාට; කරනපුදයෙහි, කළයුතු පූජායෙහි; පහන්ලනමෙනි, ප්‍රදීපදල්වන්නාක්මෙන්වෙති.

---

114. *තනිවම—තනියම—හැම.

117. තවුසන් ගුරුන් තම-දෙගුරුන් පඬිවරන් සුරන්හට
නොම කොට බැතිඅදර-නිගාකළහට නොමෑවියවැඩ*

118. කුළුදෙස්ද කේලම්-බොරු උඩගුබස් සතටනිස්ද
අනගය මුසුකතා-කුරිරුබස් නොමකියව් නැසෙතත්.†

119. නොමඳ අකුසල්කොට-අවිදුසත කරනා පින් ×
දුගඳ මුවලෙහි සිට-සුවඳ ඇඟපිට අලෙව් කරනව.**

---

116. භා:- ධනවතනවූ උතුමන්ට සුළුවස්තුවක් නමුත් දෙන පුරුෂයාහට ඒ ධනවතාගේ පැහැදීමෙන්ම දෙවතු වස්තුව ලැබීමට හෙතුවේ. උදරතර තෙජසින්යුක්තවූ සූර්‍යයාට කළයුතු පූජාවෙහිදී ප්‍රදීප දැල්වීමෙන් සූර්‍යයාට ප්‍රයොජනනැතත් සූර්‍යයාගේ ප්‍රසාදමාත්‍රයෙන් පුරුෂයාහට ශාන්තිය ලැබෙන්නාක්මෙනි.

117. තවුසන්, තාපසයන්ටද; ගුරුන්, ආචාර්‍යවරයන්ටද; තම, තමාගේ; දෙගුරුන්, මාතෘපිතෘන්ටද; පඬිවරන්, පණ්ඩිතොත්තමයන්ටද; සුරන්හට, දිව්‍යයන්ටද; බැතිඅදර, භක්ත්‍යාදරය; නොම කොට, නොපවත්වාම; නිගාකළහට, නින්දාකළජනයාට; වැඩ, වෘඩියක්; නොමවේය, නොවන්නේමය.

118. කුළුදෙස්ද, කූටසාක්ෂිද; හෙවත් බොරුසාක්ෂිද; කේලම්, පෛශුන්‍යබස්ද; උඩගුබස්, උඩඟුවචනයන්ද; සතටනින්ද, සත්ත්වයන්ට නින්දාබස්ද, අනගයමුසුකතා, රාගනිඃශ්‍රිත වචනයන්ද; කුරිරුබස්, කෲරවචනයන්ද; (යනාදීන්) නැසෙතත්, තමන් නැසෙන්නාහු නමුත්; නොමකියව්, කථනය නොකරව්.

118. භා:- බොරුසාක්ෂිකීමද, උනුනුන් බිඳුවීමට කේලාම් කීමද, ඇත්තවසා බොරුබස්කීමද, උඩඟුබස්කීමද, යම්යම් අය වලුන්ට නින්දාබස්කීමද, රාගවැඩීමට හෙතු කථාපැවැත්වීමද, පරුෂවචනකීමද යනමේ වැරදි සියල්ලම තමාගේ දිවියනත් නොකරව්.

119. අවිදූ, අඥනවූ; සත, සත්ත්වයන් විසින්; නොමඳ අකුසල්කොට, නානාවිධපාපයන් සිඩකෙරෙමින්; කරනා, කරන්නාවූ, පින්, පුණ්‍යයතෙම; (කෙබඳුද?) දුගඳවූ, දුර්ගන්ධවූ; මලෙහි, ආචාටයෙක්හි, සිට, ස්ථිතව; ඇඟපිට, ශරීරය මතුයෙහි; සුවඳ, සුගන්ධයක්; අලෙව්කරනෙව්, ආලෙප කරන්නාක්වැන්නේය.

---

117. *නින්දාකරනුහට නොවේවැඩ-වැඩි. 118. †කුරිරුබස් නොකියව් නැසෙතත්-හැම.

119. × අවිදුවිදුසතකරණපින්-හැම. 119. **ඇඟපිට සුවඳ ලෙව් කරණවැනි-හැම.

120. නොකා නොදී* ඉසුරු-තැබුව පැමිණේ පිණැති
හටත්†
ගොදුරෙහි රසයෙදූ-දසන් හැර දිවරසවිඳිනමෙන්.

121. සව්ඉසුරු අඩුවැඩි-වේය ගුණනැණැති උතුමන්ටත්
සතඅදනද කරන+-සුපුන්සඳ අඩුවැඩිදවනමෙන්×

122. දහම් දන විදුසොඳ-අබයවත් බත්බුලත්කරපෙම්
දෙන මෙකී දනදන-දනයයි ලෙව්කියති පඬුවෝ.

---

120. නොකා, (තමාවිසින්) භක්ෂණයනොකොට; නොදී, (අන්‍යයන්ටද) දානයනොකොට; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය; තැබුව, තබනලද්දේනම්; (ප්‍රවේසම්කරතලද්දේනම් එය) පිණැතියන් හට, පුණ්‍යවන්තයන්ට; පැමිණේ, ප්‍රාප්තවේ; හෙවත් ලැබේ; ගොදුරෙහි, ගොචරයෙහි; රස,රසය; යෙදූ,යුක්තකළාවූ; හෙවත් විකීමෙන් රසය ඉපදවූ; දසන්, දන්තයන්; හැර, පගකොට; දිව, ජිහ්වාව; රසවිඳිනමෙන්, රසාස්වාදය කරන්නාක්මෙනි.

120. භා:– ආහාරය මුවතුළ තැබූවිට දන්තයන් කරණකොට ගෙන විකීමෙන් එහිරසය ඇතිවේ. එසේ ආහාර රසය ඇති කළ එම දන්තයෝ එහි රසයවිඳ නොගනිත්. කොතකසිටි දිව එම රසයවිඳ සතුටුවෙයි. එමෙන්ම නොකා නොදී වස්තුව සප යන පුරුෂයා එය ප්‍රවේසම්කොට තබා මියගියකල්හි එම වස්තුව අනිකෙකුට අයිතිවේ. ඔහු එහිරසය අනුභවකරන්නේය.

121. ගුණනැණැති, ගුණයෙන් හා ඥණයෙන් යුක්තවූ; උතුමන්ටත්, උත්තමයන්ටදපවා; සව්ඉසුරු, සකලෛශ්වර්‍ය්‍යය; ඇඩුවැඩිවේය; ඌනවෘධිවන්නේය; සත, සත්ත්වයන්ගේ; අද, චිත්තය; නද කරන, ආනන්දකරන්නාවූ; සුපුන්සඳ, සම්පූර්ණචන්ද්‍රයා; අඩුවැඩිදවනමෙන්, ඌනවෘධියද වන්නාක්මෙනි.

122. දහම්, ධර්මයද; දන, ධනයද; සොඳ, යහපත්වූ; විදු විද්‍යාවද; අබය, නිර්භයභාවයද; වත්, වස්ත්‍රයන්ද; බත්,භක්තයද; බුලත්, තාම්බූලද (යන): මෙකීදන, මෙකපීතවූ ධනය; දන, ජනයා; පෙම්කර, ප්‍රේමයකොට; දෙන, දනයකරනකල්හි; (එම දීමනාවට) ලෙව්, ලොකයෙහි; පඬුවෝ, පණ්ඩිතයෝ; දානයයි කියති, දානයනම් වන්නේයයි කියත්.

---

120. *නොබී–හැම. †තැබුවොත් පිණැතිහට පැමිණේ–හැම
121. +නදකරත–හැම ×අඩුවැඩිවනමෙන්–හැම.

**123.** **රාජවිල් නෙත්තන්-කෙළනදනහා දූත අඟනන්**
**සොරුන් රා සොඬුනුත්-මොවුන් සෙව්වන් නැසෙති**
**නියතයි.**

**124.** **නුවණැසෙකි සුවියත්-සත සමගවනු ඇසෙකි දනහා**
**නොනැසෙන මෙඇස්දෙක-නැතිසත නොම්ගයනු**
**වරද කොද?**

**125.** **දුදනසඟ මිතුරුව-ඉදිනු නොදැනුම්කමෙහි පමණට***
**ගුණනැණැති සුදනන්-සමග සතුරුව උනත් වැඩවේ.**

---

123. රාජ, රජුන්ද; විල්, තඩාගයන්ද; නෙත්තන්, නෘත්‍ය. කාරයන්ද; කෙළනදනහා, ක්‍රීඩාකරන ජනයන්ද; දූතඅඟනන්, ධූර්තස්ත්‍රීන්ද; සොරුන්, චෞරපුරුෂයන්ද; රාසොඬුනුත්, සුරා ධූර්තයන්ද (යන); මොවුන්, මේ කියනලද්දවුන්; සෙව්වන්, සෙව නයකළජනයෝ; නැසෙති, නැසෙන්නාහුය; නියතයි,(මේ කාර ණය) නිශ්චයවේ.

123. භා:– රජුය, තඩාගය,නෘත්‍යකාරයෝය,(නානාප්‍රකාර) ක්‍රීඩාකාරයෝය, ධූර්තස්ත්‍රීහුය, සොරුය, රාසොඬුය යන මොවුන් සෙවනයකළ ජනයෝ ඒකාන්තයෙන්ම විනාශවන්නාහුය.

124. සුවියත්, ඉතාව්‍යක්තවූ; සතසමගවනු, සත්ඣයා හා එක්වීමතෙම; නුවණැසෙකි, ප්‍රඥානමැති නෙත්‍රයකි; දනහා, (සෙසු) ජනයන් හා එක්වීමතෙම; ඇසෙකි, (අන්‍ය) චක්ෂුවෙකි; නොනැසෙන, (කිසිවිටෙකත්) නෂ්ටනොවන්නාවූ; මෙඇස්දෙක, මේ නෙත්‍රවය; නැතිසත, අවිද්‍යාමානසත්ඣයා; නොම්ගයනු, අමාර්ගීයෙහියාම; කොදවරද?, කිනම්වද්‍යයෙක්ද?.

124. භා:– පණ්ඩිතජනයන් හා සමග එක්වීම ඥානනමැති ඇසකිම්වේ. සෙසු ජනයන් හා එක්වීම එක්තරා ඇසක්වන්නේය. කිසිකලෙකත් වෙනස්නොවන්නාවූ මේ ඇස්දෙකනැති සත්ඣයා නොමඟයාමේ වරදෙක්නම් කොයින්ද? නැත්තේමැයි.

125. දුදනසඟ, දුර්ජනයන්හා සමග; මිතුරුව, මිත්‍රව; ඉදිනු, ඉඳීමතෙම; නොදැනුම්කමෙහිපමණට, (ලොකවාසීන්ගේ) නොදැනීමේ ප්‍රමාණයටමය; (යමහෙයකින්) ගුණනැණැති, ගුණය යා ප්‍රඥාව ඇත්තාවූ; සුදනන්සමග, සාධුජනයන් හා සමගින්; සතුරුව උනත්, ශත්‍රුව උන්නේද; වැඩවේ, අභිවෘධියක්වේ.

---

125. *ඉදිනුනොදැනුම්විතරට–බොහෝ.

126. නොමඳ පිරිවරයස-ඇතත් වලකත්ව බැරිවනදෙය
තරුසෙන් පිරිවැරූ-සුපුන්සඳ රහු ගහණනොකෙරෙද

127. අදමින්ලත් ඉසුරු-නොපවති සොරුන්සෙවුදනමෙන්*
දැහැමින්ලත්ඉසුරු-පවතිසුරනිඳුලත් ඉසුරුසේ†

128. වැව්අමුණුපිරිදිය-පිටවාසහැර සුරැකිකලමෙන්
දනවත් නැණැතියෙනි-දෙලෝවැඩසිදුකරව් දන්දී +

---

125. නොමඳ, බොහෝවූ; පිරිවර, පරිවාරයද; යස, කීර්ති යද; (යනමොහු) ඇතත්, විද්‍යමානවන්නාහුනමුත්; වනදෙය, සිඩවියයුත්ත; වලකන්වබැරි, වැලැක්විය නොහැක්කේය; තරුසෙන්, තාරකාසේනාවවිසින්; පිරිවැරූ, පරිවෘතකලාවූ; සුපුන් සඳ, පූර්ණචන්ද්‍රයා; රහු, රාහුග්‍රහතෙම; ගහණනොකෙරේද?, ග්‍රහණය නොකරන්නේද? (කෙරේමය.)

126. භා:- අසඞ්ඛ්‍යසඞ්ඛ්‍යාත තාරකාසමූහයවිසින් පිරිවරණ ලද්දවූද, ඉතා යහපත්වූ රශ්මිමාලාවෙන් ලෝකය බබුලුවන්නාවූද, පූර්ණචන්ද්‍රයා රාහුවිසින් ගිලගනුලැබේ. එමෙන්ම බොහෝවූ පිරිවර හා යසස් ඇත්තාවූ සත්ත්වයාටද වියයුතු විපාකය පැමිණිකල එය වලක්වාලිය නොහැකිවන්නේමය.

127. අදමින්, අධර්මයෙන්; ලත්, ලද්දවූ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය තෙම; සොරුන්, චෞරයන්විසින්; සෙවූ, සේවනයකරනලද්දවූ; හෙවත් රැස්කරනලද්දවූ; දනමෙන්, වස්තුව පරිද්දෙන්; නොපවති, නොපවත්නේය; දැහැමින්, ධාර්මිකභාවයෙන්; ලත්, ලද්දවූ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යයතෙම; සුරනිඳු, ශක්‍රයාවිසින්; ලත්, ලද්දවූ; ඉසුරුසේ, ඓශ්වර්‍ය්‍යයමෙන්; පවති, පවත්නේවේ.

128. වැව්, වාපිය; අමුණු, ක්ෂෙත්‍රබන්ධන යනමොවුන්ගේ; පිරිදිය, (අධික) පූර්ණජලය; පිටවාන, ජලොච්ඡවාසය; හැර, විවෘතකොට (යවා); සුරැකිකලමෙන්, (ප්‍රමාණජලය) සුරක්ෂිතකලාක්මෙන්; දනවත්, ධනවන්නවූ; නැණැතියෙනි!, ප්‍රාඥජනයෙනි!; දන්දී, (දියයුත්තන් විෂයෙහි දෙයද්‍රව්‍යය) ප්‍රදානයකිරීමෙන්; දෙලෝවැඩ, උභයලොකාභිවෘද්ධිය; (ලෞකික ලොකොත්තර සම්පත් සාධාදීමට සමර්ථවූ කුසලක්‍රියාවන්) සිදුකරව්, සිඩකරනු මැනවි.

---

127. සෙව්දනයමෙන්-බොහෝ †සැපත් සුරනිඳු ඉසුරුවැනි වේ-වැඩි. 128. + දන්දී දෙලොවැඩ සිදුකරව්-හැම.

129. ගුරුනිරිඳු මිතුරන්-ලියලිය මව් මෙකිවන්
තම මව්ලෙස සිතා-පවතිත් නැණැති සුදනෝ.

130. නිදනහට දෙනදෙය-උතුම්වේමැයි ලොවේ වියතුනි*
ඉසුරුමත්හටදෙන-දෙය කෙතෙහිකුබිජුවපුරණවැනි†

131. තරසරව වැටකල-කෙතට සිව්පා නොවදිනාමෙන්
පිරිසිදුව පින්කල-සතන්හට දුක්නොවේ කලෙකත්.

---

128. භා:- වැව් අමුණුවල පිරී අධිකව ඉතිරියන ජලයට වාරිමාර්ගයක් නොමැත්තේනම් ඉවුරු කඩා බිඳගෙනයාමෙන් වැව් අමුණුවලට අන්තරායවේ. අන්තරායක් නැතිව රඳන ජලය ආරක්ෂාවීමටද අධිකජලය පිටවීයාමටද ප්‍රධානාධාරය ඇලක් දැමීමවේ. එම අධිකජලය ඊටද අන්තරායක් නොකොට බැස යාමට ඇලම් ප්‍රමාණවත්තේය. එමෙන්ම ධනය සපයන්නහුගේ ධනයෙන් (කාලානුරූපව) දන්දීමෙන්ම තමාගේ ධනයෙහි ආරක්ෂාවද පරලෙව්හි සැප විපාකදෙන අනුගාමික නිධානයද තබාගතයුතුවන්නේය. යම්හෙයකින් දන්නුදුන්නේනම් ධනය නෂ්ටවන්නටද පිළිවන්මය. දෙන ධනය හෙතුකොටගෙනම නොදෙන ධනයද රැකේ.

129. ගුරු, ආචාර්ය්‍යයෝය; නිරිඳු, නරෙන්ද්‍රයෝය; මිතුරන්, මිත්‍රයෝය යනමොවුන්ගේ; ලිය, කාන්තාවෝද; ලිය, ස්වකීය කාන්තාවගේ; මව්, මාතෘවද; (යන) මෙකිවන්, මෙකපිතස්ත්‍රීන්; තම, තමාගේ; මවුලෙස, මාතෘව හා සමකොට; සිතා, චින්තනය කොට; නැණැති, ඥානය ඇත්තාවූ; සුදනෝ, සාධුජනයෝ; පව තිත්, පවතින්නාහුය.

130. වියතුනි!, ව්‍යක්තයෙනි!; නිදනහට; ධනශූන්‍ය පුද්ගල යාට; දෙනදෙය, දෙනුලබන වස්තුව; ලොවේ, ලොකයෙහි; උතුම්වේමැයි, ශ්‍රෙෂ්ඨවන්නේමය; ඉසුරුමත්හට, ඓශ්වර්ය්‍යමත්ත යාට; හෙවත් ධනවතාට; දෙනදෙය, දානයකරන වස්තුව; කෙතෙහි, ක්ෂෙත්‍රයෙක්හි; කුබිජු, නොමනා බීජයන්; වපුරණ වැනි, වාපනයකරන්නාක්මෙනි.

131. තරසරව, අතිශයින් ස්ථිරව; වැටකල, වෘත්තියුක්ත කලාවූ; කෙතට, ක්ෂෙත්‍රයට; සිව්පා, මෘගයන්; නොවදිනාමෙන්, ඇතුල්නොවන්නාසේ; පිරිසිදුව,පරිශුද්ධව; පින්කල,කුසල්කලාවූ; සතන්හට, සත්ත්වයන්ට; කලෙකත්, කිසිමකාලයෙක්හිදු; දුක් නොවේ, දුකක් නොවන්නේය.

---

130. *මයලොවෙහි උතුම වියතුනි- බොහෝ †දෙයවපුරනවැනි කෙතෙහි කුබිජු-කිසි.

**132. දල අත්නිසවිසැති-සත දුදන ලිය රදුන් සිඟුගං**
**කෙලෙනම් කාකිවත්-කෙරේ අපදපමණ නොකරව.**

**133. ලොබ දෙස් මොමදමත්-සතහට තපස්කම්නැත්**
**මෙකි සිව්ගුණ නොමැති-සතහටත් තපස්කම්**
**නොමඇති.**

132. දල, දංෂ්ට්‍රාද; අත්නිය, හස්තයෙහි (දීඝ) නබයෝද; විස, විෂද යනමොවුන්; ඇති, ඇත්තාවූ; සත, සත්ත්වයෝය; දුදන, දුර්ජනයෝය; ලිය, කාන්තාවෝය; රදුන්, නරේන්ද්‍රයෝය; සිඟු, අංඇත්තෝය; ගං, ගඞ්ගාය යනමොවුන් හා; කෙලෙනම්, ක්‍රීඩාකෙරේනම්; කාකිවත්, (යහපතැයි) කවරෙක් කීයේද; අපද කෙරේ, අනතුරායක්මකරයි; පමණ නොකරව, (ඔවුන්) ප්‍රමාණ නොකල මැනවි.

133. ලොබ, ලොභය; දෙස්, වෙෂය; මෝ, මෝහය; මද, පුරුෂමදාදී සත්විසිමදය; *(යනමෙයින්) මත්,මත්තභාවප්‍රාප්තවූ; සතහට, සත්ත්වයාට; තපස්කම්, තාපසකර්මයක්; නැත්, නැත්තේය; මෙකිසිව්ගුණ, මේ කපිත කාරණචතුෂ්කය; නොමැති, අවිද්‍යමානවූ; සතහටත්, සත්ත්වයන්ටද; තපස්කම්, තාපසකර්මයක්; නොමඇති, අවිද්‍යමානමැයි.

133. භා:- ලොභ, වෙෂ, මොහ,මද යනමේ කෙලශධර්මයන් ගෙන් මත්වූ සත්ත්වයන්ට වනාහි කර්මස්ථාන අරමුණක පිහිටා සිටිය නොහැකිබැවින් තාපසකර්මයක් නැත්තේයයිද මේකියන ලද ලොභ,වෙෂ,මොහ,මද යන කෙලශධර්මසතරින් තුරන්වූ සත්ත්වයාටද, කමටහන් අනුව පිළිපැදීමෙක් වුවමනානැති බැවින් තාපසකර්මයක් නැත්තේයයිද කියනුලැබේ.

*සත්විසිමදයනම්

| | | |
|---|---|---|
| 1. ජාතිමදය | 10. පරිවාරමදය | 19. ඉඩ්ඩිමදය |
| 2. ගොත්තමදය | 11. භොගමදය | 20. යසමදය |
| 3. ආරොග්‍යමදය | 12. වණ්ණමදය | 21. සීලමදය |
| 4. යොබ්බනමදය | 13. සුතමදය | 22. ඣානමදය |
| 5. ජීවිතමදය | 14 පටිභාණමදය | 23. සිප්පමදය |
| 6. ලාභමදය | 15. රත්තඤ්ඤූමදය | 24. ආරොහමදය |
| 7. සක්කාරමදය | 16. පිණ්ඩපාතිකමදය | 25. පරිනාහමදය |
| 8. ගරුකාරමදය | 17. අනවඤ්ඤතමදය | 26. සණ්ඨානමදය |
| 9. පුරෙක්ඛාරමදය | 18. ඉරියාපථමදය | 27. පාරිපූරීමදය |

ධම්ම සඞ්ගණී විභඞ්ගාදියෙන් මෙහි විස්තර දැනගතයුතු.

**134.** **බෝදරුවදති දිවි-එකාදරුවදනගවවගාවෙත්**
**සත්කැල නසනුවන්-කුලනැසෙත් සත්වගවගාවෙත්.**

**135.** **සුරාපානයකල-පවිටුන්වදෙනු බවාමුදුබස්**
**දියතුලවන්එකෙකු-පුලුස්සනවැනි ගිනිසුලක්ලා.**

**136.** **සුරාසොඬකනොවී-මිනිස්ගුණැතිව උන්විටෙකවත්**
**අනිකෙකු සුරාබී-විඳිනදුක් නුදුටුද වරෙකවත්***

---

134. දිවි, දිවිදෙන්නු; බෝදරු, බොහෝවූපුත්‍රයන්; වදති, ප්‍රසූතකෙරෙති; එකාදරු, එකමදරුවා; වදන, ප්‍රසූතකරන්නාවූ; ගව, ගවයෝ; වගාවෙත්, වෘඩියට පැමිණෙන්නාහුය; සත්කැල, සත්ත්වසමූහයා; නසනුවන්, නෂ්ටකරන්නවුන්ගේ; කුල, කුල යෝ; නැසෙත්, විනාශයට යන්නාහුය; සත්වග, සත්පුරුෂයන් ගේ කුලයෝ; හෙවත් සත්පුරුෂසමූහයෝ; වගාවෙත්, වැඩීමට පැමිණෙන්නාහුය.

134. භා:- දිවිදෙන්නු බොහෝ දරුවන් වදත්තමුත් ඔවු න්ගේ කුල පරම්පරාව නොවැඩේමය. එකාදරුවා වදන ගවයා ගේ පරම්පාව වනාහි වැඩේමය. එමෙන්ම අන්‍යයන්ට අන්තරාය කරන මනුෂ්‍යයාගේ කුල පරම්පරාවද නැසේ නොහොත් නො වැඩේ. සත්පුරුෂ උතුමන්ගේ කුලයම වැඩීමට යන්නේය.

135. සුරාපානයකළ, සුරාපානයකළාවූ; පවිටුන්ට, පාපිෂ්ට යන්ට; මුදු, මෘදුවූ; බවාබස්, අවවාද තෙපුලන්; දෙනු, ප්‍රදානය කිරීමතෙම; (කෙසේද?) දියතුලවන්, ජලාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටවූ; එකෙකු,යම්සත්ත්වයෙකු; ගිනිසුලක්ලා,ගිනිසුලක්දමා; පුලුස්සන වැනි, පිලිස්සීමකරන්නාක් වැන්නේය.

135. භා:- සුරාපානයෙහි නියැලිවූ පුද්ගලයාට මෘදු මො ලොක් වදන් කියා හික්මවීමට උත්සාහදැරීම කෙලෙසදැයි යත හොත්? දියතුළ ගිලීසිටින පුරුෂයෙකු ගිනිසුලකින් පුලුස්සන් නට නැත්කිරීමමෙන් නිෂ්ඵලවන්නේය.

136. සුරාසොඬකනොවී, සුරාසොඬක්නොව; හෙවත් සුරාපානයනොකොට; මිනිස්ගුණැතිව, මනුෂ්‍යගුණයෙන් යුක් තව; උන්විටෙකවත්, ඉන්නාවූකාලයෙක්හිවත්; අනිකෙකු,අන්‍ය පුරුෂයෙකු විසින්; සුරාබී, සුරාපානයකොට; විඳිනදුක්,විඳිනය කරන දුඃඛයන්; වරෙකවත්, එක්වාරයෙක්හිවත්; නුදුටුද?, නො දුක්කෙහිද?.

---

136. නුදුටුවොද වරෙකත්-බොහෝ-

**137. නොකා නොදී* ඉසුරු–තබා දිවිරකින අය අවියත්**
**කෙත රැකවලට බැඳි–මිනිස්රූවැනි නැණින්බැලූකල.**

**138. සැප යමෙකු යමෙකුගේ†–හඬව හඬවා ගතොත් බලයෙන්**
**හඬව හඬවා ඔහු‡–ගණිතිසුරු පන්සියපණස්වර.**

---

137. නොකා,(තමාද)අනුභවනොකොට; නොදී,(පරහටද) දනයනොකොට; ඉසුරුතබා, ඓශ්වය්‍ය්‍යන්වියනොකොට; දිවි රකින, ජීවිතරක්‍ෂණය කරන්නාවූ; අවියත් අය, අවිඥපුරුෂ තෙම; (කෙවැනිද?) නැණින් බැලුකල, බුඩියෙන් බැලූකල්හි; කෙත, ක්‍ෂෙත්‍රයෙක්හි; රැකවලටබැඳි, රක්‍ෂාවරණයපිණිස බඳින ලද්දවූ; මිනිස්රූවැනි, (තෘණමය) මනුෂ්‍යරූපයක් වැන්නේයි.

137. භා:- තමනුත් නොකා අන්‍යයන්ටද නොදී වස්තුව රකිමින් ප්‍රවෙසම්කරන පුරුෂයා වනාහි කෙතකට බඳිනලද පඹයකු හා සමානවන්නේය. පඹයානම් කෙත රැක්මට යොදන ලද තෘණරූපයකි. එම තෘණරූපයට කෙතෙන් කිසිත් ප්‍රයො ජන නොවන්නේය. නමුත් කෙතරකින්නා ඔහුය. එමෙන්ම තමන්ගේ ශරීරසැප පමණකටවත් නොකා නොබී ධනය ප්‍රවෙ සම්කරන පුරුෂයාටද ධනයෙන් කිසිවැඩක් නැත්තේය. හෙ තෙම ධනය ප්‍රවෙසම්කොට අන්‍යයන්ට ප්‍රයොජනගැනීම පිණිස තබා මියයනබැවින් තෘණයෙන් කරනලද මනුෂ්‍යරූපයක් සමානවන්නේයි.

138. යමෙකු, යම්පුරුෂයෙක්තෙම; යමෙකුගේ, යම්කෙ නෙකුන්ගේ; සැප, සම්පත්තියක්; හඬව හඬවා, (යම්පත්හිමියන්) පෙළ පෙළා; බලයෙන්, බලාත්කාරයෙන්; ගතොත්, ගත්තේ නම්; ඔහු, ඒ සම්පත් පැහැරගත් පුරුෂයා; හඬව හඬවා, පෙළ පෙළා; පන්සියපණස්වර, පන්සියපණස්වාරයෙක්හි; ඉසුරු, සම්පත්තීන්; ගනිති, (ලොකවාසීහු) පැහැරගන්නාහුය.

138. භා:- යමෙක්තෙම අන්‍යයන් පෙළපෙළා දුකට පමු ණුවා ඔවුන්ගේධනය පැහැරගනීනම් භවාන්තරයෙහිදී ඔහුගේද සම්පත්තීන් පැහැරගන්නන්විසින් ඔහුට නොයෙක් වධ පීඩා පමු ණුවා ආංතම පන්සියයකටත් අධික වාරයෙක්හි ඔහුගේ සම්පත් පැහැරගනු ලබන්නේය.

---

137. *නොකානොබී–හැම.

138. †සැපයක් යමෙකුගේ–හැම. ‡හඬව හඬවා ඔහුත්–හැම.

**139. ලොවට ඉත නොවනා-දෙය කෙරෙති ඉසුරට පැමිණියෝ,**
**ලොවට උතුම් ගොවිඳු-පවා නසියහන සැතපෙනුයේ.**

**140. නිසල නොමවනසත-නොමද උගතත් මනාසව්සිප්***
**සසල ගුණ නොහරිත්-දියෙහි පිළිබිඹුපෙණෙන සඳමෙන්.**

**141. මසුරුවූදනෝදන්-දෙන්ට නොකියති ඇතත් යදිනට†**
**ගොළුවන්ට මුළුදිව‡-ඇතදනොකියනමෙන්බසක්වත්+**

---

139. ඉසුරට පැමිණියෝ, ඓශ්වර්‍ය්‍යයට ප්‍රාප්තඋත්තමයෝ; ලොවට, ලෝකයාට; ඉතනොවනාදෙය, ප්‍රියනොවන්නාවූදේ; කෙරෙති, (කර්මවශයෙන්) කරන්නාහුය; ලොවට, ලෝකයට; උතුම්, ශ්‍රෙෂ්ඨවූ; ගොවිඳුපවා, විෂ්ණුදිව්‍යරාජයාපවා; නසියහන, සර්පයානාවෙක්හි; සැතපෙනුයේ, සයනය කරන්නේයි.

139. භා:- සම්පත්විඳින උත්තමයෝද පෙර කර්මවශයෙන් ලෝකයාට අප්‍රියවන ක්‍රියාවන් කරන්නාහුය. ලෝකයාට ශ්‍රෙෂ්ඨවූ විෂ්ණුදිව්‍යරාජයා වනාහි අප්‍රියජනකවූ සර්පයානාවෙක්හි සයනයකරයි.

140. නිසලනොමවනසත, නිශ්චලනොවන්නාවූම සත්වයෝ; හෙවත් චපලගතිඇති සත්වයෝ; මනා, මනොඥවූ; නොයෙක්, අනෙකවිධවූ; සව්සිප්, සියලුශිල්පය; උගතත්, උද්ග්‍රහණයකළාහු නමුත්; දියෙහි, ජලයෙහි; පිළිබිඹුපෙණෙන, ප්‍රතිබිම්බිතව දෘශ්‍යමාණවන්නාවූ; සඳමෙන්, චන්ද්‍රයාපරිද්දෙන්; සසලගුණ, චඤ්චල (ගතිය) භාවය; නොහරිත්, පහනොකෙරෙත්.

140. භා:- ජලාභ්‍යන්තරයෙහි චන්ද්‍රබිම්බය නිතරම සැලෙමින් පවතියි. කිසිවිටෙකත් නිශ්චලව නොපෙණෙයි. එමෙන්ම චඤ්චල ස්වභාවඇති මිනිස්තෙම අගනා නොයෙක් ශිල්පශාස්ත්‍රයන් බොහෝකොට උගත්තාහු නමුත් ඔවුන්ගේ චපලස්වභාවය නොහරනේමය.

141. මසුරුවූදනෝ,මාත්සර්‍ය්‍යයුක්තජනයෝ; ඇතත් (දෙය්‍ය ධර්මය) ඇත්තාහුනමුත්; යදිනට, යාචකයන්ට; දන්දෙන්ට, දිය යුතුදෙය දානයකිරීමට; නොකියති, කථනය නොකෙරෙත්; ගොළුවන්ට, මූගජනයන්ට; මුළුදිව, අනූනවූ ජිහ්වාව; හෙවත් සම්පූර්ණදිව; ඇතද, විද්‍යමානවන්නේද; බසක්වත්, වචනමාත්‍රයක්වත්; නොකියනමෙන්, ප්‍රකාශනොකරන්නාක්මෙනි.

---

140. *නොමද සව්සිප් නොයෙක් උගතත්-බොහෝ.

141. †යදිනට-හිඟි. ‡මුළුදිය-හැම. +ඉසුරුතත් කතා නොකියනමෙන්-වැඩි.

142. මසු බෝ වටිමුතු-සිපි නොමවටි මුතුලකක්වත්,
එමෙන් ලුහුදනපුත්-පෙරකල පිණෙන් බබලයි*

143. කම්මැලිහට ශිල්ප-නොසිදුවේ එබැවින් නිදනවේ,
නිදනහට මිතුරැනැත්-එහෙයින් සිතට සැපනැත්.

144. කිරිසමුදුර ඉඳත්-උවිඳු පිමට ඉන්නොපත්මෙන්†
මසුරුවුදනන්වෙත-උනත් දෙලොවම ඇතිවැඩෙක්
නැති.

---

142 මුතු, මුක්තාඵලය; බෝමසුවටී, බොහෝ මසුඅගනේය; (ඒමුක්තාඵලහටගත්) සිපි, සිප්පිකටු (වනාහි); මුතුලකක් වත්, මුක්තාඵලවලින් ලක්‍ෂයෙන් කොටසක්වත්; නොමවටී, නොවටනේමය; එමෙන්, එපරිද්දෙන්ම; ලුහුදන,ලඝුජනයාගේ; පුත්, පුත්‍රතෙම; පෙරකල, පූර්වජන්මයෙහි කරනලද්දාවූ; පිණෙන්, පුණ්‍යමහිමයෙන්ම; බබලයි, භ්‍රාජමානවෙයි.

142. භා:- මුතුඇට ඉතා අගනාහුය. එම මුතුඇට හටගත් සිප්පිකටුවනාහි මුතුවලින් ලක්‍ෂයෙන්කොටසක් පමණවත් නො අගනාහුය. එමෙන්ම පින්මඳපුරුෂයාට දාව උපදින පෙරකල පින්ඇති පුරුෂතෙම තම පියාටවඩා අධික ධන්‍යපුණ්‍යමහිමාදියෙන් බබලන්නේවේ.

143. කම්මැලිහට, (ක්‍රියායෙහි) අලසපුද්ගලයාට; ශිල්ප, (කිසිත්) ශිල්පයක්; නොසිදුවේ, සිඩනොවන්නේය; එබැවින්, ඒ හෙතුකොටගෙන; නිදනවේ, (කම්මැලියා) වස්තුනැත්තෙක්වේ; නිදනහට, වස්තුනැති පුරුෂයාට; මිතුරැනැත්, මිත්‍රයෝ නැත්තාහුය; එහෙයින්, ඒ මිත්‍රයන්නැතිබව හෙතුකොටගෙන; සිතට, (වස්තුව හා මිත්‍රයන්ද නැත්තහුගේ) චිත්තයට; සැපනැත්, සැප නොත් නැත්තේය.

144. කිරිසමුදුර, ක්‍ෂීරසාගරයෙහි; ඉඳත්, වාසයකොටත්; උවිඳු, උපේන්‍ද්‍රයාගේ; හෙවත් විෂ්ණුහුගේ; පිමට, පානයකිරීම පිණිස; ඉන්, ඒසාගරජලයෙන්; නොපත්මෙන්, (ජලයක්) අසම්ප්‍රාප්තවූවාක්මෙන්; මසුරුවුදනන්, මාත්සර්‍ය්‍යයුක්තජනයන්ගේ; වෙත, සමීපයෙහි; උනත්, වාසයකොළේද; හෙවත් විසීමෙන්; දෙලොවම්, උභයලොකයෙහිදීම; ඇතිවැඩෙක්, සිඩවන්නාවූ වෘඩියෙක්; නැති, නැත්තේය.

---

142. *පෙරද කලපිණෙන්ම බබලත්-ඇතම්
144. †උවිදු නොබොනුව ගනු නොමැතිවත්-හැම

**145.** සිව්පාසතුන්ගේ-දුරැරදුවදුරු* කොතරකිණමෙන්,
දසදම්හි පවතින-නිවේ සතදුක්වෙතින් නිරිඳුන්†

**146.** බාලරිවිවැදගිම-ශමකුළෙන් අඳුරු දුරුවනමෙන්
මැදහත්නිරිඳුවෙත‡-පැමිණි සතුරෝ බිඳි දුරුවෙත්

**147.** ලෝරකිණ නිරිදෙදා්-සතට දුක්වන්ට ඉඩනොහරින්×
ලොවරකිණ මේරදු-කලටවැසිවස්වනවිලස්මෙන්.

---

145. සිව්පාසතුන්ගේ, චතුස්පදිකසත්ත්වයන්ගෙන් වන්නාවූ; උවදුරු, උපද්‍රවයන්; දුරැර, දුරීභූතකොට; කෙත, ක්ෂෙත්‍රය; රකිණමෙන්, (ගොවියන්) රක්ෂාකරන්නාක්මෙන්; දසදම්හි, දසවිධරාජධර්මයන්ගෙන්; පවතින, පවතින්නාවූ; නිරිඳුන්, නරෙන්ද්‍රයන්ගේ; මෙතින්, මෛත්‍රිය හෙතුකොටගෙන; සත, සත්ත්වයන්ගේ; දුක්, දුඃඛය; නිවේ, නිවාරණයවේ.

දසරාජධර්මය නම්.

දානය, ශීලය, පරිත්‍යාගය, ඍජුභාවය, මෘදුභාවය, තපනය, ක්‍රොධරහිතභාවය, හිංසාරහිතභාවය, ක්ෂාන්තිය, අපිරධර්මභාවය, යනමේ දසයයි. මෙසින් දානය පරිත්‍යාගය යන දෙකෙහි විශෙෂය නම් මහණ බමුණු දුගී මගී යාචකාදීන්ට (කම්පලඅදනා) අන්නපානාදියෙන් කරනුලබන සඞ්ග්‍රහය(දානයනම්)වේ. ලැබීමට සුදුසුවූවන් පැමිණිකල ඔවුන් විෂයෙහි ධනප්‍රතිෂ්ඨාපනය පරිත්‍යාගය නම්වේ-

146. බාලරිවි, තරුණසූර්‍ය්‍යයාගේ; ගිම,රශ්මිය; සමකුළෙන්, යුගන්ධරපර්වතයෙන්; වැද, (ලොකධාතුවෙහි) ප්‍රවිෂ්ටව; අඳුරු, අන්ධකාරය; දුරුවනමෙන්, දුරීභූතවන්නාක්මෙන්; මැදහත්, මධ්‍යස්ථවූ; නිරිඳුවෙත, නරෙන්ද්‍රයන්කරා; පැමිණි, ප්‍රාප්තවූ; සතුරෝ, ශත්‍රුජනයෝ; බිඳී, (ඔවුනොවුන්) භෙදයට පැමිණ; දුරුවෙත්, දුරීභූතවන්නාහුය

147 ලෝරකිණ, ලොකයරක්ෂාකරන්නාවූ; නිරිඳෝ, නරෙන්ද්‍රයෝ; සතට, සත්ත්වයාට; දුක්වන්ට, දුක්පීමට; ඉඩනොහරින්, අවකාශනොතබන්නාහ; ලොවරකිණ, ලොකයරකින්නාවූ; මේරදු,මෙඝරාජයා; කලට,යොග්‍යකාලයට; වැසිවස්වනවිලස්මෙන්, වර්‍ෂාවවස්වනාකාරයමෙනි.

---

145 *උවදුරුදුරැම-ඇතැම් †නිරිදුන්වෙතින් සතදුක්නිවේ-තැම
146 ‡මැදහත්සිරිදුන්ට-තැම

148. වනදවනගිනිකඳ-සිහිල්තල වසගව නිවෙනමෙන්*
තදතෙදැති තිරිඳෝ-ගුණැතිමැතිවරවදන පිහිටන්.

149. සිනෙන් ගැලවෙන්ට-නොපිළිවනි කොතැනක
සැඟවුනත්,
එමෙන් නිරිඳුන්හට-වරදකලවුන් වදිනතැන්නැත්.

150. නිරිඳුන්ට දෙලොවැඩ-සිදුවෙ නුවණැති ඇමැති
යන්ගෙන්,
මහඔසුපඬිනැණින්-රදුටවූවැඩ අසව දහමින්.

151. පබඳබෝ†සත්ගුණ-යුත් කොලෙහිගුණදත් රජුන්හා
සතුරෝ මිතුරුවෙත්-ඔවුන්වග පිළිවෙළින් පවතිත්

148. වන, අරණ්‍යය; දවන, භස්මකරන්නාවූ; ගිනිකඳ, වහ්නිස්කන්ධය; සිහිල්තල, සීතලමාරුතයට; වසගව, වසඟවී; හෙවත් සීතලමාරුතයෙන්යටවී; නිවෙනමෙන්, නිවීයන්නාක්මෙන්; තදතෙදැති, ඝනබඩතෙජස්ඇත්තාවූ; තිරිඳෝ, නරෙන්ද්‍රයෝ; ගුණැති, ගුණවත්තවූ; මැතිවර, මන්ත්‍රීශ්වරයන්ගේ; වදන, වදන්හි; පිහිටත්, පිහිටන්නාහුය.

149. කොතැනක, කවරස්ථානයෙක්හී; සැඟවුනත්, නිලීනව සිටියත්; සිනෙන්, ස්වප්නයෙන්; ගැලවෙන්ට, මුක්තවන්ට; නොපිළිවනි, නොහැක්කේවේ; එමෙන්, එපරිද්දෙන්ම; නිරිඳුන්ට, නරෙන්ද්‍රයන්ට; වරදකලවුන්, අපරාධකල ජනයන්; වදින තැන්, (ආරක්ෂාව පිණිස) ප්‍රවිෂ්ටවන ස්ථානයක්; නැත් අවිද්‍යමානවේ.

150. නුවනැති, බුඩිමත්වූ; ඇමැතියන්ගෙන්, අමාත්‍යවරුන්ගෙන්; නිරිඳුන්ට, නරෙන්ද්‍රයන්ට; දෙලෝවැඩ, උභයලෞකාභිවෘඩිය; සිදුවේ, සිඩවන්නේය; මහඔසුපඬි, මහෞෂධපණ්ඩිතයාගේ; නැණින්, ඥානමහිමයෙන්; රජුට, චූලනීබ්‍රහ්මදත්තනම් රාජයාට; වූවැඩ, සිඩවූ අභිවෘඩිය; දහමින්, ධර්මයෙන්; අසව්, ශ්‍රවණයකරව්. (උම්මග්ගජාතකයෙන් විස්තර දතයුතුයි.)

151. පබඳ, උදාරවූ; බෝසත්ගුණයුත්, බොධිසත්ත්වගුණයෙන් යුක්තවූ; නොහොත් බෝසත්ගුණයුත්, බොහෝවූ සාධුගුණයෙන් යුක්තවූ; කොලෙහිගුණදත්, කෘතගුණදන්නාවූ; රජුන්හා, රාජයන්හා සමඟින්; සතුරෝ, ශත්‍රුජනයෝ; මිතුරුවෙත්, මිත්‍රවන්නාහුය; ඔවුන් එම උතුමන්ගේ; වග, කුලපරම්පරාව; පිළිවෙළින්, පටිපාටියෙන්; පවතිත්, පවතින්නාහුය.

148. *නිවෙනුමෙන්-ගැම. 151. †මෙබඳුබෝ-ගැම.

152. නුවණැති මැතිවරන්-කීමෙහි යෙදෙනු රජුට නියමයි
සිතැති කම්සිදුවේ-සත්කෙත්වැවෙයි කුළුණුවැස්සෙන්

153. ලොවරකිණ තිරිඳුන්-කිපුන පවකලදනෝ වැනසෙත්
*සස්කෙත්වත්වවන-මේනොමදවැස සස්නසනමෙන්

154. පරහටනොදීදුක්-දුදනන්වෙතට නොගොස් දූහැමෙන්
දවස්පසුවේනම්=මහත් ඉසුරකි වැඩිවියත්හට

---

152. නුවණැති, ප්‍රඥයෙන් යුක්තවූ; මැතිවරන්, මන්ත්‍රීවරයන්ගේ; කීමෙහි, අනුශාසනයෙහි; යෙදෙනු, යෙදීම; රජුට, රාජයාට; නියමයි, නිශ්චයවන්නේය; (එහෙතුකොටගෙන) සිතැතිකම්, හිතාර්ථය; සිදුවේ, සිද්ධවන්නේය; කුළුණු, (රජහුගේ) කරුණා නැමැති; වැස්සෙන්, වර්ෂාජලයෙන්, සත්කෙත්, සත්ත්වයන් නැමැති ක්‍ෂෙත්‍රයතෙම; වැවේ, වෘද්ධියට පැමිණේ.

152. භා:- ප්‍රඥසම්පන්න මන්ත්‍රීවරයන්ගේ අනුශාසනාවන් පිළිගැණීමෙන් ඊට අනුව පිළිපැදීම රජුට නියමයවන්නේය. මන්ත්‍රිමණ්ඩලයේ අනුශාසනා අනුව පිළිපැදීම හෙතුකොටගෙන රටවාසීන්ගේ හිතාර්ථසාධනය වන්නේමය. එම රජහුගේ කරුණා නැමැති වර්ෂාජලයෙන් සත්ත්වනමැති ක්‍ෂෙත්‍රය වෘද්ධියට පැමිණෙන්නේමය.

153. ලොවරකිණ, ලොකය රක්‍ෂාකරන්නාවූ; තිරිඳුන්, නරේන්ද්‍රයන්; කිපුන, කුපිතවූකල්හි; පවකල, පාපයන්කලාවූ; හෙවත් අපරාධකාරීවූ; දනෝ, ජනයෝ; වැනසෙත්, විනාශවෙත්; (කෙසේද?) සස්කෙත්, සස්‍යක්‍ෂෙත්‍රය; වත්, වාස්තුයන මොවුන්; වවන, වර්ධනයකරන්නාවූ; මේ, මේඝයතෙම; නොමද, බොහෝසේ; වැස, වර්ෂාකොට; සස්නසනමෙනි, සස්‍යයන්නසන් නාක්මෙනි.

154. පරහට, අන්‍යයන්ට; දුක්නොදී, දුඃඛදනයනොකොට; දුදනන්වෙතට, දුර්ජනාශ්‍රයට; නොගොස්, ගමනයනොකොට(ම ; දූහැමින්, ධර්මිෂ්ටභාවයෙන්; දවස්පසුවේනම්, දිවසාතික්‍රමණය වන්නේනම්; වියත්හට; ව්‍යක්තයන්ට; වැඩි, වර්ධනයවන්නාවූ; මහත් ඉසුරකි, මහත්වූ සම්පත්තියෙකි.

---

153. *සස්කෙත්වවනමේ-නොමද වැස්සෙන්නසනවිලසින්-හැම

**155. පසිදුපිරිසුදුකුල-විදුමන්වුවොත් එක්දුදනයෙක්***
**පිරිහියේසෙදින්-අමාවිසදුනු† නසන විලසියි**

**156. මහපොළොවටවඩා-මහත්වත්නැති මෙමුලුලෙව්හි×**
**ඊටත් මහත්වෙ-තමාඉසුරුව වරද ඉවසුම්.**

---

155. පසිදු, ප්‍රසිඬවූ; පිරිසුදු, (උභයවංශයෙන්) පරිසුඬවූ; කුල, වංශයෙක්හි; එක්දුදනයෙක්, එකම දුර්ජනයෙක්; විදුමන් වුවොත්, විද්‍යමානවුවොත්; සෙදින්, ශීඝ්‍රව; පිරිහීයේ, (එම කුලය) පරිහානියට පැමිණෙන්නේය; (කුමක්මෙන්ද?) අමාදුනු, අමෘත යෙන් ජනිතවූ; විස, හලාහලනම්විෂය; නසනවිලසින්, (සපශී කරන්නහු) වනසන්නාක්මෙනි.

155. භා:- ප්‍රසිඬවූ පරිසුඬකුලයෙක්හි නමුත් එකම දුර්ජන යෙක් ඇතිවන්නේනම් ඔහුනිසා එමකුලය පිරිහීමට යන්නේය. කුමක්මෙන්ද? අමෘතයෙන් අටගත්තාවූවිෂය සපශීකරන්නහු එම විෂවේගබලයෙන් වනසෙන්නාක්මෙනි. පෙරකලෙක අමෘ තරසය ලබාගැන්මෙහි ආශාඇතිවූ දිව්‍යසමූහයන් කිරිසමුදුර කලඹනකල්හි එසින් නැංගාවූ අමෘතය හා සමගම උද්ගතවූ හලාහලයනම්විෂය සපශීකරන පුද්ගලයා විනාශවනබැවින් ඊට අනුකම්පාවෙන් එම විෂය ගිලගත්ඊශ්වරදෙවයාගේ ග්‍රීවය නිලවණිවීමෙන් මහානුභාවසම්පන්න ඊශ්වරදෙවයාට කැලලක් ඇතිවිය. ඊශ්වරදෙවයාහැර අන්කවරෙක්නමුත් එමවිෂය සපශී කළානම් මුලුමනින්ම විනාශවන්නේමය. අමෘතය සමග අටගත් විෂයෙන් ඊශ්වරදෙවයාටවූ අභාග්‍යතාවමෙන්ම ප්‍රසිඬ පරිසුඬ කුලයකනමුත් දුර්ජනයෙක් ඇතිවීමෙන් මුලුකුලයේම පිරිහීම වන්නේය. (විෂපානයකලතැන්පටන් ඊශ්වරදෙවයාට නීලකණ්ඨ යයසිද්ද නම්විය.)

156. මහපොළොවටවඩා, මහාපෘථිවියටවැඩිවූ; මහත්වත්, මහත්වූ වස්තුවක්තෙම; මෙමුලුලෙව්හී, මේ සියලුලොකයෙහි; නැති, අවිද්‍යමානවේ; තමා, තමන්; ඉසුරුව, නායකව; හෙවත් ශ්‍රේෂ්ඨපුද්ගලයෙක්ව (සිට); වරදඉවසුම්, (අන්‍යාන්‍යයන්ගෙන් වන්නාවූ) වැරැද්ද ඉවසීම; ඊටත් මහත්වේ, එම මහාපෘථිවිය වද වඩා මහත්වන්නේය.

---

155. *පසිදුපිරිසිදුකුලෙ-මුත් මැදදුදනයෙක්පැමිණියොත්-හැම
155. †අමාවිසදුන් හැම. 156. ×මුලුලොවේහී-හැම.

157. බබලන මහමෙරක්-කුලපව්වලින් තෙවුන විලසින්
ලොවැති නිරිඳුන්වත්-ඇමැතිවර* ඇතහොතින්
හොබනේ

158. දිවා රෑ බබලන-රිවිසඳුගෙ පෙණෙන දෙවියෝනැති
මෙබඳු දෙවියන්වත්†-අතරතුරදී පලගබියවේ

---

157. බබලන, (සවර්ණකාන්තියෙන්) භ්‍රාජමානවන්නාවූ; මහමෙරක්, මහාමෙරුපර්වතයද; කුලපව්වලින්, කුලපර්වත කරණකොටගෙන; තෙවුනවිලසින්,උද්දීපනවන්නාක්මෙන්; ලොවැති, ලෝකයෙහි ඇත්තාවූ; හෙවත් පෘථිවිය අයත්කොට වසන්නාවූ; නිරිඳුන්වත්, නරේන්ද්‍රයන්වද; ඇමැතිවරු ඇතහොතින්,අමාත්‍යයෝ විද්‍යමානවෙත්නම්; හොබනේ, බැබලීමක්වන්නේය.

157. භා:- මහාමෙරුපර්වතයතෙම සවර්ණවර්ණයුක්තවූ ලෝකයෙහි සියලු පර්වතයන්ටම වඩා ශ්‍රෙෂ්ඨපර්වතයෙකි- එම මහමෙර පවා බබලන්නේ අවට පිහිටියාවූ කුලපර්වතපඞ්ක්තිය කරණකොටගෙනය- එමෙන්ම පෘථිවිය අයත්කොටගෙන වසන්නාවූ රජතෙමේද- අමාත්‍යමණ්ඩලය කාරණකොටගෙනම බබලන්නේය. මෙහි විස්තර දෙවෙනිගීයේ විස්තරයෙන් දැනගතයුතුයි.

158. දිවාරූ, දහවල් හා රාත්‍රියෙහි; බබලන, භ්‍රාජමානවන්නාවූ; රිවිසඳුසෙ, සූර්‍ය්‍යචන්ද්‍රදෙදෙනා පරිද්දෙන්; පෙණෙන, දෘශ්‍යමාණවන්නාවූ; දෙවියෝ, (අන්‍ය) දෙවතාවෝ; නැත්, (ලොකයෙහි) නැත්තාහුය; මෙබඳු, මේ ආකාරවූ; දෙවියන්වත්, (චන්ද්‍රසූර්‍ය්‍ය) දිව්‍යයන්වදපවා; අතරතුරදී, අනන්තරාන්තරයෙහිදී; පලග, රාහුනම් ග්‍රහයාගෙන්; බියවේ, භයක්(ම) වන්නේය.

158. භා:- දිවාභාගයෙහි බබලන්නාවූ සූර්‍ය්‍යයාද, නිසාභාගයෙහි බබලන්නාවූ චන්ද්‍රයාද යනමේ ග්‍රහයන් දෙදෙනාට සමව පෙණෙන අන්‍යදෙවතාවෝ නැත්තාහුය- මෙබඳු ශ්‍රෙෂ්ඨ දෙවියන්ටද පවා අතරතුරදී රාහුනම් ග්‍රහයාගෙන් භයපැමිණීමට තරම් තෙජස්රහිතව දුර්වලභාවයට පැමිණෙන්ට සිඩවන්නේය. චන්ද්‍රසූර්‍ය්‍යදිව්‍යයන්වැනි උතුමන්ටද අතරතුර පැමිණෙන සතුරුඋවදුරු මෙසේනම් අතිශයින්ම දුර්වලවූවන්ට පැමිණියහැකි සතුරුඋවදුරු මෙතෙක්යැයි පමණකල නොහැකිබැවින් විපතෙහිදී කම්පානොවිය යුත්තේමය.

---

157. *ඇතිහොතින්-ඇහැම්
158. †අතරතුරරාහුගෙන් බියවේ-හැම .

159. පව්බැඳි සිත්නොමැති-දනහට යම්දෙසක් පැමුණුනත්
*වණනොමැති අල්ලෙහි-විසයනොනැගෙණ†මෙන්
නොවේදුක්

160. නලසිළුතුලටවැද-සිසිලනලනොනැසී පවතිනමෙන්
සමත්නැණ මැතිවරු-රදුන්වෙත නිතිවැසත්+
නොනැසෙත්

161. නිරිඳුන්ගෙසිතඉඟි-නොදත්මැතිවර නොදත්ගිජිදෝ
තෙසක් සිව්පායුත්-මැතිඇතිරජුට සිතුවසැදේ.

---

159. පව්බැඳි, පාපයෙහිබද්ධවූ; සිත්, චිත්තය; නොමැති' නැත්තාවූ: දනහට, ජනයාහට; යම්දෙසක්, (පමාවැරැද්දේන් සිදුවූ) යම්බඳුපාපයක්; පැමුණුනත්, සිද්ධවූයේද; හෙවත් ප්‍රාප්ත වූයේවේද; (ඒහෙතුවෙන්)වණනොමැති,ව්‍රණනොමැත්තාවූ; අල් ලෙහි, හස්තතලයෙහි; (තැවරුණාවූ) විසය, විෂද්‍රව්‍යයක්; නො නැඟෙතමෙන්, (ශරීරයෙහි) ධාවනය නොකරන්නාක්මෙන්; දුක්නොවේ, දුක්විපාකයක් නොවන්නේය.

159. භා:- යම්සේ අල්ලෙහි ව්‍රණයෙක් නැත්තහුවිසින් අතින්ගත් 'විෂය ඔහුගේ ශරීරයෙහි ව්‍යාප්තනොවේද. එපරිද් දෙන්ම කායාදි වාරත්‍රය පාපයෙහි යොමුනොකළාවූ පුද්ගලයා හට වරදසහිත යම්ක්‍රියාවක් කරන්නට සිදුවූයේද ඒහෙතුවෙන් කටුකවිපාක නොවන්නේය.

160 නලසිළුතුළට, වහ්නිශිඛාභ්‍යන්තරයට; සිසිලනල, ශීතල මාරුතය; වැද, ප්‍රවිෂ්ටව; නොනැසී, නෂ්ටනොවී; පවතිනමෙන්, ප්‍රවෘත්තවන්නාක්මෙන්; සමත්, (කාර්‍ය්‍යකරණයෙහි) දක්ෂවූ; නැණ, ප්‍රඥව ඇත්තාවූ; මැතිවරු, මන්ත්‍රිවරයෝ; නිති, නිත්‍ය යෙන්; රදුන්වෙත, රාජයන්සමීපයෙහි; වැසත්, වාසයකොටත්; නොනැසෙත්, නෂ්ටනොවන්නාහුය.

161. නිරිඳුන්ගේ, නරේන්ද්‍රයන්ගේ; සිත, චිත්තය සම්බන්ධවූ; ඉඟිනොදත්, අදහස්නොදත්තාවූ; මැතිවර, මන්ත්‍රිවරයෝ; නො දත්, දළනැත්තාවූ; ගිජ්දෝ, හස්තිරාජයන් වැන්නෝය; තෙ සක්, + ත්‍රිශක්තියද; සිව්පා, × චතුරුපායද යනමෙයින්; යුත්, යුක්තවූ; මැතිඇති, මන්ත්‍රීන් ඇත්තාවූ; රජුට, රාජයාට; සිතුව, අභිප්‍රේතාර්ථය; හෙවත් සිතනලද්ද; සැදේ, සිද්ධවන්නේය.

---

159. *වනනොවැකි-හැම. †විසනොනැගෙනා-හැම.

160. +නිතිවැදත්-හැම. +ත්‍රිශක්තියනම්-ප්‍රභාවය-උත්සාහය-මන්ත්‍රණය-යනතුනයි·

×චතුරුපායනම්-භේදය-දණ්ඩය-සාමය-දානය=යනසතරයි.

162. නිරිඳුන් ඉදිරියෙහි-අකාරණකන්කෙඳිරි නොකරව්
රද අදහස්ලෙසට-වදන්දෙව්දෙව සැබැවනමෙන්.

163. ලොවනැවදනාබඩු-නැව්නානිරිඳු මෙඇමසමගින්
වියත්මැතිමාලිමි—උගත්සත්බෙලෙන් පවතිනුයේ

164. කිසිකාරියනැතත්—රදුන්හා මැතිවරන් නිතියෙන්
සෙව්නාදනන්ගේ—දනට රැකවරණයෙකි සුරකිණ

---

162. නිරිඳුන්, නරේන්ද්‍රයන්ගේ; ඉදිරියෙහි, අභිමුඛයෙහි; අකාරණ, නිකරුණේ; කන්කෙඳිරි, කර්‍ණාන්තයෙහි බැගෑවචන කීම; නොකරව්, නොකළමැනවි; රද, රජහුගේ; අදහස්ලෙසට; චිත්තානුකූලපරිද්දෙන්; සැබැවනමෙන්, සත්‍යවතපරිද්දෙන්, දෙව්වදන්, (ශුබවූ) විනිශ්චයවචනයන්; දෙව්, දුනයකරව්; හෙවත් දුනමැනවි.

163. දනා, නානාවිධ ජනයින් නමැති; බඩු, භාණ්ඩයන්ද; නිරිඳු, නරේන්ද්‍ර නමැති; නැව්නා, පඬව්නායකයාද (නැවේස්වාමියාද) යන; මෙඇමසමගින්, මෙකීසියල්ල හා සමගින්; ලොව නැව, ලෝකනමැති නෞකාතොමෝ; වියත්, ව්‍යක්තවූ; හෙවත් දක්‍ෂවූ; මැති, මන්ත්‍රීන් නමැති; මාලිමි, නියමුනායකයා (නැව් පදින්නා) විසින්; උගත්, උද්ග්‍රහණයකළාවූ; සත්බෙලෙන්, ශාස්ත්‍රබලය කාරණකොටගෙන; පවතිනුයේ, ප්‍රවෘත්තවන්නේය.

163. භා:- නානාවිධ ජනයන් නමැති භාණ්ඩයන්ගෙන්ද රජුන් නමැති නැවියාගෙන්ද යුක්තවූ ලොක නමැති විචිත්‍ර නෞකාතොම ව්‍යක්තවූ දක්‍ෂ මන්ත්‍රින් නමැති නැව්පදින්නා (කප්පිත්තා) විසින් දනගත් මහාශාස්ත්‍රබලය කාරණකොට ගෙන චිරායුෂ්කව පවතින්නේය.

16.. කිසිකාරිය, (අන්‍යවූ) කිසිත් කාර්‍යයක්; නැතත්, නැත්තේනමුත්; රදුන්හා, රාජයන්හා; මැතිවරන්, මන්ත්‍රිවරයන්; නිතියෙන්, නිත්‍යයෙන්; සෙව්නා, සෙවනයකරන්නාවූ; දනන්ගේ, ජනයින්ගේ; දනට, (සවිඤ්ඤාණක අවිඤ්ඤාණක සංඛ්‍යාත) ධනයට; සුරකිණ, අතිශයින් ආරක්‍ෂකවූ; රැකවරණයෙකි, (ඒරාජමන්ත්‍රිදෙපක්‍ෂයතෙම) රක්‍ෂාවරණයෙක්වෙත්.

165. රදුන්සෙව්නාදන—නොලං නුදුරුව ගිනිතපිනමෙන්
සිහිනුවණින්යෙදී—සප්රජෙකුමෙන් සිතා වැජඹෙව්

166. රජුන් උදහස්වුව—පෙරවූව උතුරු,වදන්*දෙන්නෝ
ගිනිලගඉවිසිරෙණ—ලෙසින් තමසිරින් පිරිහියෙත්

167. රදුන්තිළිණෙන්මුත්-අන්සතෙකුගෙන්නොයේදුක්ගිම්
වැසිවැසම්සගිමන—යේද පිනිබවුවසි සතන්ගේ

168. රදුන්ලොබැතිදෙයට—ලොබයනොකරව්පණට
සිතැතොත්
ගොදුරුලොබපලහැපි†වැටුපුමැදවැද නැසෙනලෙසවේ

165. රදුන්, රාජයන්; සෙව්නා, සෙවනයකරන්නාවූ; දන, ජනයෙනි!; [නොපි] නොලං, සමීපස්ථනොවී; නුදුරුව, දූරස්ථ නොවී; ගිනි, වහ්නිය; තපිනමෙන්, තපින්නාක්මෙන්; සිහිනුවණින්,සමෘතිඥනයෙන්; යෙදී, යුක්තව: සප්රදෙකුමෙන්, සපිරාජයෙකුසේ; සිතා, චින්තනයකොට; වැජඹෙව්, විජෘම්භමාණවව්.

166. රජුන්, රාජයන්; උදහස්වුව, උදහස්වූකල්හී; පෙරවූව, ඉදිරියෙහි(සිට); උතුරුවදන්,උත්තරවචනයන්; දෙන්නෝ, දනයකරනජනයෝ; ගිනිලඟ, වහ්නිසමීපයෙහි(වූ); ඉවි, සික්ථය; ඉසිරෙණලෙසින්,(උනුවී) විසිරයන්නාක්මෙන්; තම, තමන්ගේ; සිරින්, සම්පත්තියෙන්; පිරිහීයෙත්, පරිහීනභාවයට පැමිණෙත්.

167. රදුන්, නරේන්ද්‍රයන්ගේ; තිළිණෙන්මුත්, පරිත්‍යාගය කින්මිස; අන්සතෙකුගෙන්, අන්‍යසත්ත්වයෙකුගෙන්; දුක්ගිම්, (ලොකයාගේ) දුඃඛලක්ෂණ ග්‍රීෂ්මයතෙම; නොයේ, බැහැරනොයන්නේය; (එමෙන්ම) සතන්ගේ, සත්ත්වයන්ගේ; ගිමන, ඝර්මය තෙම; වැසිවැසම්ස, වර්ෂාකොටම්සක්; පිනි, තුෂාරය; බටුවයි, බැස්සාහුයයිකියා; හෙවත් පිනිබැසීම්හෙතුවෙන්; යේද, පහවන්නේද; (පහනොවන්නේමැයි.)

168. පණට, (ජීවිත ප්‍රාණයට; සිතැතොත්, ආශාඇත්තේ නම්; රදුන්, රජවරුන්ගේ; ලොබැතිදෙයට, ආශාවඇති ද්‍රව්‍යයන්ට; ලොබයනොකරව්, ආශානූපදවව්; (ඉදින්ආශාකරව්නම්) ගොදුරුලොබ, ගොචරයෙහි ලොභයෙන්; පලහැපි, පතඟතෙම; හෙවත් පලහැපියා; වැටුපුමැද, ප්‍රදීපමධ්‍යයට; වැද, ප්‍රවිෂ්ටව; නැසෙනලෙසවේ, නැසෙන්නාක්වැනිවේ.

166. *අතුරුවදන්=හැම 168. †පලහැපී ගොදුරුලොබින්=හැම

**169.** රන්බරණැසුරුකල*-කදවත්නමුත් ලොවේබබලත්
රන්මෙර ඇසුරුකල-හැමසතන් එමපැයවනමෙන්†

**170.** තිරිඳුකිපුනොනැනින්-පහවගැලවෙති නැනැතිසුදියෝ
එනසැරපහරදක-ඉවතපැන ගැලවුනෝසමත්වෙත්

**171.** රදුනදින බඳිනා-සැරහෙන බුදින ඉඳිනා
රජසිරිති ×නකකුත්-නොකරව් සිතැත ඉඳිනා

---

169. රන්බරණ,සුවර්ණාභරණයන්; ඇසුරුකල,ආශ්‍රයකලාවූ; කදවත්නමුත්, කදුමැටිද්‍රව්‍යයනමුත්; හෙවත් විදුරුආභරණය නමුත්; ලොවේ, ලොකයෙහි; බබලත්, දීප්තිමත්වන්නේය; රන් මෙර,සුවර්ණමේරුව; හෙවත් මහමෙර; ඇසුරුකල, ආශ්‍රයකලාවූ; හැමසතන්, සකල සත්ත්වයන්ගේ; (ශරීරයෙහි) එම පැය, තද්වර්ණය; වනමෙන්, වන්නාක්මෙනි.

170. තිරිඳු, නරේන්ද්‍රයා; කිපුන, කොපයුක්තවූකල්හි; නැණැති, ප්‍රාඥවූ; සුදියෝ, පණ්ඩිතජනයෝ; එතැතින්, එම ස්ථානයෙන්; පහව, නිෂ්ක්‍රාන්තව; හෙවත් නික්ම; ගැලවෙති, නිදහස්වන්නාහුය; එන, පැමිණෙන්නාවූ; සැරපහර. ශරප්‍රහාරය; හෙවත් ඊතලපහර; දක, දර්ශනයකොට; ඉවතපැන, බැහැරව; ගැලවුනෝ, මිදීගියජනයෝ; සමත්වෙත්, සමර්ථයෝවෙති.

171. ඉඳිනා, ජීවත්වීමෙහි; සිතැත, ආශාවවන්නේනම්; රදුන්, රාජයාවිසින්; අඳින, ආච්ඡාදනයකරන්නාවූද; බඳිනා, බන්ධනයකරන්නාවූද; සැරහෙන, අලඞ්කාරකරන්නාවූද; බුදින, අනුභවකරන්නාවූද; ඉඳිනා, නිෂණ්ණවූද; (යන) රජසිරිතින්, රජහුගේ චාරිත්‍රයන් අතුරෙන්; එකකුත්, එකක්වත්; නොකරව්, (තමන්පුරුදු) නොකළමැනවි.

---

169. *රන්බඳුනැසුරුකල-හැම †එමරුවයවනමෙන්=හැම.

171. ×රදුඅඳින—හැම.

**172. රදුන්සිතතුළකාම්-නොදැන නොමදව වදන්දෙන්නෝ**
**නොහඳින සිව්සැටක්-බරණලා විල්කෙළනවුන්වැනි**

**173. තෙදවිකුම් ගුණනැණ-ඉසුරුමත්රජුටනැති සතුරෝ**
**තුබමිණ උදුවිට-අඳුරුදිව අන්දිවට යනමෙනි.***

172. රදුන්, රාජයන්ගේ; සිතතුළ, චිත්තාභ්‍යන්තරයෙහි; කාම්නොදැන, අදහස් උදහස් දැනනොගෙන; නොමදව, බොහෝ සෙයින්; වදන්දෙන්නෝ, වචනප්‍රකාශකරන පුද්ගලයෝ; (කෙබඳුද?) නොහඳින, (තඩාගක්‍රීඩනයෙහි) නොහැඳියයුතුවූ; සිව්සැටක්බරණ, චතුඃෂෂ්ට්‍යාභරණයන්† ලා, බහාගෙන; විල් කෙළනවුන්වැනි, තඩාගක්‍රීඩනයකරන්නවුන් වැනිය.

173. තෙද, තෙජසය; විකුම්, වික්‍රමය; ගුණ, ගුණය; නැණ, බුඩිය; ඉසුරුමත්, ඓශ්වර්‍ය්‍ය යනමොවුන් ඇත්තාවූ; රජුට, රාජයාහට; සතුරෝනැත්, ශත්‍රුහු නැත්තාහුය; තුබමිණ, සූර්‍ය්‍යා; උදුවිට, උද්ගතවූකල්හි; අඳුරු, අන්ධකාරය; දිව, ධාවනයකොට; අන්දිවට, අන්‍යවිෂයකට; යනමෙනි, නික්මෙන්නාක්මෙනි.

*චතුඃෂෂ්ට්‍යාභරණනම්:—

| | | | |
|---|---|---|---|
| සිඩඔටුණු | පාඩගම් | පටෝඩම් | කකුදපාද |
| ව්‍යාඝ්‍රඔටුණු | පාසළඹ | නාගවඩම් | පාදඇඟිලි |
| සිංහඔටුණු | පාදජාලා | කාදු | පාදතබ |
| රසනා | පාදනූ | කාපපු | හස්තමුද්‍රිකා |
| අවුල්හර | පාදාභරණ | රන්පට | කෙයූරාභරණ |
| නූපුර | සිරොජාල | රුවන්සොළු | රන්සළු |
| තාඩඞ්ග | කර්ණාභරණ | මුතුපට | කසීසළු |
| වලය | තැලිවැල් | මිණිවළලු | කර්ණකුණ්ඩලා |
| තිසරපට | පට්ටකාර | ගිගිරිවළලු | මිණිමෙවුල්දම |
| උදරබන්ධන | කෛපෝට්ටු | කෛවඩම් | තිගිරිපිළී |
| හැටතිමුල්හර* | ග්‍රිවාලඞ්කාර | රන්සවඩි | තොඩු |
| පස්රු | ස්වර්ණජාලා | පාදසංබලා | පලස් |
| පස්වළලු | හස්තිකුන්ත | පාදකිංකිනික | හර |
| එක්වැටි | අගදාභරණ | පාදජඞ්ඝා | පෙරොදු |
| පේරුස් | රන්මාලා | ඔරවළුං | ඉන සැඩ |
| පාමුද්‍ර | රන්මිරිවැඩි | චීජවස්ත්‍ර | රක්තනීලාදි පට්ටවස්ත්‍ර. |

තවත් නොයෙක්තැන්වල මීට වෙනස්වද. ඌනවද, චතුඃෂෂ්ට්‍යාභරණ දක්නටලැබුන නමුත් එක්තැනක සම්පූර්ණව දක්නාලද චතුඃෂෂ්ට්‍යාභරණම ප්‍රමාණවෙතැයි හැඟීයනබැවින් එහි තිබුනලෙසම මෙහි දැක්වීමු. මිණිඔටුණු රුවන්ඔටුණුයයි තවත් ඔටුණුදෙකක් ඇතැම්තැන දක්නටලැබේ. සුධීහු විමසා දැන ගනිත්වා

173. *අන්දිවටවත්මෙනි—හැම

174. සැබෑබසදෙවියන්-වෙතපවතිබොරුදනන්තුඩවේ
එහෙයින්දනන්ගෙන්-තිබොරුසතලොවසුරන්සුරුවෙත්

175. තිවත්සත්වුවත්-සත්පුතෙකුලදහොත්සුපින්වත්
නොමඳසව්සිරිවේ-සිතුමිණක්ලත්කලක්විලසින්

176. බත්පැසෙනතෙක්මුත්-නොමදගිනිකලබතින්වැඩනැති,
එලෙසින්* දසුන්කල-වරදපමණටමුත්නොවවනද

---

174. සැබෑබස, සත්‍යවචනයතෙම; දෙවියන්වෙත, දිව්‍යයන්විෂයෙහි; පවති,පවත්නේය; බොරු,අසත්‍යවචනය(වනාහී); දනන්, ජනයන්ගේ; තුඩවේ,මුඛයෙහි (පවත්නේ) වන්නේය; එහෙයින්, එසේහෙයින්; දනන්ගෙන්, ජනයන් අතුරෙන්; තිබොරුසත, සත්‍යවචන තෙපලන සත්ත්වයෝ; ලොව, ලෝකයෙහි; සුරන්සුරුවෙත්, දෙවතාවන්වැනි වෙති.

174. භා:- දෙවියන්ගේ මුඛයෙහි සත්‍යවචනයමමිස අසත්‍ය වචනයෙක් නැත්තේය. මනුෂ්‍යයන්ගේ මුඛයෙහි අසත්‍යවචනය ද වන්නේය. එබඳු මනුෂ්‍යයන් අතුරෙන් යමෙක් සත්‍යවචනය ප්‍රකාශකෙරේනම් එම පුරුෂතෙම මනුෂ්‍යදෙවතායයි ප්‍රකාශ කටයුතුවේමය.

175. තිවත්,තිඨිනවූ; සත්වූවත්, සත්ත්වයෙක්වූවත්; සුපින්වත්, මනාපින්ඇත්තාවූ; සත්පුතෙකු, සත්පුරුෂපුත්‍රයෙකු; ලද හොත්, ලද්දේනම්; (ඔහට) සිතුමිණක්, චින්තාමාණික්‍යයක්; ලත්කලක්විලසින්, ලැබූකාලයක් පරිද්දෙන්; නොමඳ, අමඳවූ; සව්සිරි, සකලඓශ්වර්‍ය්‍යය; වේ, වන්නේය.

175. භා:- වස්තුබලයනැති පුරුෂයාහට වුවත් පින්ඇති පුතෙක්වේනම් හෙතෙම මහ පින්ඇත්තෙක්වේමය. කෙලෙසද? චින්තාමාණික්‍යයක් ලැබූකාලයෙක්හිමෙන් එම පුරුෂතෙම විශෙෂ පුණ්‍යවන්තයෙක් වන්නේමය.

176. බත්පැසෙනතෙක්මුත්, බතපැසෙන ප්‍රමාණයටමමිස; නොහොත් බතපැසෙනතාක්මිස; (ඊටවැඩිව) නොමඳ, බොහෝකොට; ගිනිකල, ගිනිදූල්වූවහොත්; බතින්,(එම) භොජනයෙන්; වැඩනැති, කාර්‍ය්‍යයක් නැත්තේය; එලෙසින්, එපරිද්දෙන්ම; දසුන්, දුසයන්විසින්; කල, කරනලද්දාවූ; වරදපමණටමුත්, අපරාධයෙහි ප්‍රමාණයටමිස; (වැඩියෙන්) තදනොවව්, සනබඩනොවවී; හෙවත් අධිකදඬුවම් නොදෙව්.

---

176. *ඒමෙන්—හැම.

177 කුල නැණ ගුණ ඇතත් - නොතකත් ලෙව්හි තෙදැතියන් මෙන්
සඳ මසැ *වරෙක වැඳ - වඳිත් නිතිරිවි පුදෙන් සැරසී

178 පව්කළවුන්ගෙ පණ - නොනැසැ ඇවිදී බවක්පාසා
පින්කළසතන් පණ - නිවේ මොක්දූක × කපුරුපහනෙව්

179 පරපණ නසනුහට - නොදූනේය මඳකුත් පවෙහි තද
+මළකඳට ඇවිලගත් - ගින්නකඳ තදයයි නොදන්නෙව්

---

177. කුල, කුලය, නැණ, ඥානය; ගුණ, ගුණයනමොවුහු; ඇතත්,ඇත්තාහුනමුත්; ලෙව්හි, ලොකයෙහි; තෙදැතියන්මෙන්, තෙජොගුණයුක්තවූවන්සේ; නොතකත්, (මනුෂ්‍යයෝ) තර්කනය නොකරත්; හෙවත් නොසලකත්; සඳ, චන්ද්‍රයා(ට); මසැ, මාස යෙක්හි: වරෙක, එක්වාරයක්; හෙවත් ශුක්ලපක්‍ෂාරම්භ ප්‍රථම දිනයෙහි පමණක්ම; වැඳ, වන්දනයකොට; නිති, නිත්‍යයෙන්; හෙවත් සියලුදවස්හි; සැරසී, (සූර්‍ය්‍යපූජාවිධියෙන්) සජ්ජිතව; පුදෙන්, පූජාකිරීමෙන්; රිවි, සූර්‍ය්‍යයා(ට), වඳිත්, වඳිත්නාහුය.

177. භා:- චන්ද්‍රයාට ලොකයා මසකට වරක් නමස්කාරකෙරේ. සූර්‍ය්‍යාට පූජාකරමින් නිතරවඳිත්නේය. චන්ද්‍රයාට එසේ කරන්නේ තෙජොගුණවිරහිත සිහිල්ගුණයුත් හෙයිනි. සූර්‍ය්‍යාට නිරතුරුම වඳින්නේ තෙජස් අධිකහෙයිනි. එමෙන්ම කුලපරම්පරාවද ප්‍රඥාවද ගුණයද ඇතත් තෙජස්නැත්තහුගැන ලොකයා නොතකන්නේය

178. පව්කළවුන්ගේ, පාපකර්‍මකළාවූ ජනයන්ගේ; පණ, ප්‍රාණයතෙම; නොනැසැ, නෂ්ටනොවී; බවක්පාසා,භවයක්පාසා; හෙවත් භවයෙක් භවයෙක්හි; ඇවිදී, (උත්පත්තිවශයෙන්) සැරිසරන්නේය; පින්කළසතන්,පුණ්‍යකර්‍මකළාවූ සත්ත්වයන්ගේ; පණ, ප්‍රාණයතෙම; මොක්දූක, මොක්‍ෂදර්‍ශනයෙන්; කපුරුපහනෙව්, කපුරුදූවූ ප්‍රදීපයමෙන්; හෙවත් ස්කන්ධපරිනිර්‍වාණවිසින්; නිවේ, නිවීමටයේ.

179. පරපණ, අන්‍යයාගේ ප්‍රාණය; නසනුහට, වනසන සත්ත්වයාට; පවෙහි, පාපයෙහි (විද්‍යමාන)වූ; තද, දුඃඛභාවය; මඳ කුත්, ස්වල්පයකුත්; නොදූනේය, ජානනයනොවේමය; මළ කඳට, මෘතශරීරයට; නොහොත් වියලිකාෂ්ඨයට; ඇවිලගත්, ආවිෂ්ටවූ; හෙවත් ඇවිලීගියාවූ;ගින්න, වහ්නියතෙම; කඳ, තත් මෘතදෙහය හෝ වියලිකාෂ්ඨය; තදයයි, ස්තබ්ධයයි; නොදන් නෙව්, නොදන්නාක්මෙනි.

179. භා:- අන්‍යයාගේ ප්‍රාණය නසන පුද්ගලයාහට පාප යෙහි ආදීනවයක් කිසිසේත් නොදූනේ. එය කුමක්වැනිදූයි යතහොත්?මෘතදෙහයට ඇවිලගන්නා ගින්නතෙම එම මෘතදේහය තදයයි නොදන්නේය. එමෙනි.

---

177. *සඳවස-හැම. 178. ×මොක්දූකනිවේ-වැඩි. 179. +මළ කඳටගත්ගිනි-කඳතදූයි නොදූනෙතවිලස්මැයිහැම.

180 බෙරහඬයොදන × කම-ඇසෙස් සෙනහඬදෙලොස් යොදනෙක
දන්දෙනතුමන්ගේ-දනසදඇසේ සියල් තිලොවට

181 සව්කුසුමෙහිසුවඳ-නලඅනුවමුත්නොයේ පෙරවූව
සත්ගුණ × සිල්සුවඳ-දසදෙසම නිරතුරෙන් පවතියි +

182 නුවණැති මැදහතුන්-නොපත්සබමැදටපත්‡සුදනෝ
අඳුරුගෙතුළට**වැද-අනුන්තිබූ බඩු සොයනුවෝවෙත්

183 අමයුරුවදන්හැර-තද කුරිරුබස් දෙන දදනයෝ
විලිකුම්පලදමා-නිරසපලබුදින්නන් සුරුවෙත්

---

180. බෙරහඬ, හෙරිනාදයතෙම; යොදනකට, යොජන ප්‍රමාණතන්හිද; සෙනහඬ, අසනීශබ්දයතෙම්; දෙලොස්යොද නෙක, චාදසයොජන ප්‍රමාණතන්හිද; ඇසේ, ශ්‍රවණයවේ; දන් දෙන තුමන්ගේ, දන්දෙන උතුමන්ගේ; දනසද, දන්දීමෙන් ජනිත කීර්ත්තිඝොෂය; සියල්තිලොවට, සකලජගත්‍රයට; ඇසේ, ශ්‍රවණයවන්නේය.

181. සව්කුසුමෙහි, සකලපුෂ්පයන්හි; සුවඳ,සුගන්ධයතෙම්; නලඅනුවමුත්, වාතයට අනුවම්ස; හෙවත් යටිසුලඟටම්ස; පෙර වූව, ඌර්ධවගතව; නොයේ, නොයන්නේය; සත්, සත්පුරුෂ ජනයන්ගේ; ගුණසිල්සුවඳ, ගුණශීලාදිසුගන්ධය තෙම; දසදෙසම, දශදිශායෙහිම; නිරතුරෙන්, නිරන්තරයෙන්; පවතියි,පවත්නේ වේ.

182. නුවණැති, සප්‍රාඥවූ; මැදහතුන්, මධ්‍යස්ථජනයන්; නොපත්, අප්‍රාප්තවූ; හෙවත් නොපැමිණියාවූ; සබමැදට, සභා මධ්‍යශට; පත්, ප්‍රාප්තවූ; සුදනෝ, සාධුජනයෝ; අඳුරුගෙතුළට. අන්ධකාරගෘහාභ්‍යන්තරයට; වැද, ප්‍රවිෂ්ටව; අනුන්තිබූබඩු, අන්‍ය යෙකුවිසින් තබනලද භාණ්ඩයන්; සොයනුවෝවෙත්, පරීක්ෂා කරන්නන් සදෘශවෙති.

183. අමයුරු, අමෘතාකාරවූ; වදන්, වචනයන්; හැර, පහ කොට; තද, ස්තබ්ධවූ; කුරිරුබස්, ක්‍රෑරවචනයන්; දෙන, දනය කරන්නාවූ; හෙවත් ප්‍රකාශකරන්නාවූ; දුදනයෝ, දුර්ජනයෝ; (කෙසේද?) විලිකුම්පල, (මනාව) පැසුනුඵලයන්; දමා, අත්හැර; නිරසපල, රසශුන්‍ය (නොපැසුනාවූ) ඵලයන්; බුදින්නන්සුරු වෙත්, අනුභවකරන්නන් වැන්නෝය.

---

181. × සතගේ-වැඩි. + දසදෙසම පවතියි නිරතුරෙන්—වැඩි.
182. ‡සබමැදපැමිණි=කිසි **ගෙයතුල-හැම

184 සුරාබොන දනහට-කොතෙක්කිවත්සුබස්නොහසත්
මදුතුටසත්කලත්-තමායනඅතකටම යනමෙනි

185 නොහගවසුරාබී*-සබාමැදගොස් උතත් කරබා
මුවවිසිරිනොමොම-කතාකරවා සතටඅගවා

186 පරපණනසාපණ-රකිනාපවිටුඅවියත්**
ලෙවිසාවැනිදිවින්-විසගඅතවකවකාකා මී ×

---

184. සුරාබොන, සුරාපානයකරන්නාවූ; දනහට, ජනයන්ට; සුබස්, යහපත් අවවාදයන්; කොතෙක්කීවත්, කොපමණ කීයේනමුත්; නොහසත්, (එය ඔවුහු) නොපිළිගණිත්; මදුතුට, මත්තහස්තියාට; සත්කලත්, සංඥකරනලද්දේනමුත්; තමා යන අතකටම, තමන් ගමනයකරනදිශාවකටම; යනමෙන්, ප්‍රයාණය කරන්නාක්මෙනි.

185. නොහගව, (කිසිවෙකුටත්) නොදන්වා; සුරාබී, සුරාපාණයකොට; සබාමැද, සභාමධ්‍යයට; ගොස්, ගමනයකොට; කරබා, ග්‍රීවාව නම්නකොට; හෙවත් බිමබැලූ මූහුනුඇතිව; උතත්, හුන්නාහුනමුත්; මුව, මුඛය; විසිරී, විශිණීව; නොමොම, එමසුරා නොමෝම; කතාකරවා, වචනප්‍රකාශකරවා; සතට, සත්වයාට; අගවා, (මද්‍යපානයකළබැවි) වැටහීමකරවයි.

186. පරපණ, අන්‍යයන්ගේ ප්‍රාණය; නසා, විනාශකොට; පණරකිණ, (තමාගේ) ප්‍රාණයරකින්නාවූ; අවියත්, අඥානජනයෝ; (කෙසේද?) විසග, විෂවගීයක්; කා, භක්ෂණයකොට; මී, මධුව; අත, හස්තයෙහි; වකවකා, තවරතවරා; දිවින්, ජිහ්වායෙන්; ලෙවියාවැනි, (හස්තය) ලෙවනාක්මෙනි.

187. භා:= අන්‍යසත්වයන්ගේ ජීවිතවිනාශකොට තමාගේ ජීවිතය රැකගන්නා පාපිෂ්ට අඥානයෝ කෙබඳුදයත්? යම්කිසි විෂවගීයක් අනුභවකොට අනතුරුව මීපැණි අතෙහි තවරතවරා දිවින් ලොවින්නන්මෙනි. යම්කිසි දරුණු විෂවගීයක් අනුභව කළ කෙනෙකුන්ගේ දිවෙහි මීපැනි තැවරූ පමණකින් එමවිෂය පහනොවන්නාක්මෙන්ම දුශ්චරිතකරමින් මෙලොව ජීවත්වන පමණකින්ම පරලෙව්හි සතරඅපායෙන් මිදීමට කර්මවශයෙන් නියමවූ කටුකදුක් විපාකයෙන් නොමිදුන බැවින් දුශ්චරිතයන් හි හැසිරෙන පුද්ගලයෝ අතිශයින්ම අඥානයෝ වන්නාහුය.

---

185. *සුරාබීනොගගවා-නැම 186. **රකිණඅවියත් පවිටුදුදනෝ
වැහි. +කාබී—කිසි.

187. සිරුර උසුලාගෙන-තැනඇවිදපරපණ නසනලෙස්,
උතුරුකුරුදිවසින-යකුන්නරවාහනකලාමෙනි.

188. සුරාපුරාබිබී-පරලෙව්හිවිඳිනනොමදදුක්,
තිබෙදීමේලොවම-විඳිතිදුක්පෙරනිමිතිපානෙව්.

189. උගනත්මුනිදහම්-නොඇලෙපවිටුන්ගෙසිත්මදකුත්,
සිඳුමස්ලුණුබිබී-එහිම්වැසගතලුණුනොපත්මෙන්.

---

187. සිරුරඋසුලා, ශරීරය උද්වහනයකොට; නෙකතැන ඇවිද, නානාස්ථානයන්හි සඤ්චාරණයකොට; පරපණ, අන්‍යයන්ගේ ප්‍රාණය; නසනලෙස්,විනාශකරනආකාරය; (කෙසේද?) උතුරුකුරුදිවසින, උත්තරකුරුරාෂ්ට්‍රයෙහිදී; යකුන්, යක්‍ෂයන්විසින්; නරවාහනකලාමෙනි,මනුෂ්‍යවාහනකරගත්තාක්වැන්න.

187. භා:– තමන් ශරීරය උසුලාගෙන තැනින්තැන ඇවිදිමින් අන්‍යප්‍රාණයක් නැසීම කෙවැනිද්දැයි යතහොත්? උතුරුකුරුදිවයිනෙහි පිරිසරවැසි මනුෂ්‍යයෝ යක්‍ෂයන්විසින් ඔසවාගෙන ඇවිදිනාලද්දේය එමෙනි. එම උත්තරකුරුවීපයෙහි යක්‍ෂයෝ වැදී එක්කලෙක්හි මනුෂ්‍යයන් වාහනකොට පිටනැඟී ඔවුන්ට පීඩාකරමින් සිතූ පැතූ පරිද්දෙන් ඇවිද්දෝයයි දක්නාලැබේ. නමුත් නිතර පන්සිල්රකිණ නාගරික මනුෂ්‍යයන් වාහනකල නොහැකිවූහ

188. සුරා, සුරාව; බිබී, පානයකොටකොට; (සුරාපානය කලහෙතුවෙන්) පුරා, සම්පූර්ණව; පරලෙව්හි, පරලොකයෙහිදී; විඳින, වින්දනයකරනුලබන්නාවූ; නොමඳදුක්, අමන්දදුඃඛය; තිබෙදී, ජීවියදීම; මේලොවම, ඉහාත්මභාවයෙහිම; පෙරනිමිති පානෙව්, (කරනලද ක්‍රියාවට) පූර්වනිමිති දක්වන්නාක්මෙන්; දුක්විඳිති, දුක්විඳින්නාහුය.

188. භා:– සුරා (මත්පැන්) පානයකරන පුරුෂයා මෙලොව දීම අප්‍රමාණ දුක්විඳින්නේය. ඒ දුක්විඳීමවනාහී මියපරලොව ගියකල්හී මත්පැන්පානයෙහි විපාකවශයෙන් විඳිනුලබන ඝෝරවූ මහාවිපාකයට පූර්වනිමිත්තකැයි දක්වන්නාක්මෙනී.

189. මුනිදහම්, සම්බුඬධර්මය; උගනත්, උද්ග්‍රහණයකෙලේ නමුදු; පවිටුන්ගෙසිත්, පාපීජනයන්ගේ චිත්තය; මඳකුත්, ස්වල්පයකුත්; නොඇලේ, (බුඬධර්මයෙහි) ආසක්තනොවන්නේය; (කෙවැනිද?) සිඳුමස්,සමුද්‍රසථ (සමුද්‍රජලයෙහි) මත්ස්‍යයෝ; ලුණුබිබී, ලවණජලය පානයකොට; එහිම, එමසමුද්‍රයෙහිම; වැස, වාසයකොටත්; ගත, (ඔවුන්ගේ) ශරීරයට; ලුණු, ලවණය; නොපත් මෙන්, අප්‍රාප්තමෙනි.

---

189. *පවිටුන්ගේ සිත් මදකුත් නොඇලේ. කිසි

190 විරිඳුන්මුල්සිඳිනු-නිරිඳුටතබාබැරිසුරන්වත්,
නුබමිණසතරදිව-දිවත්තමරුපුගතනුහුනුමෙනි.

191 සම්බරණින්සැදී-මැතිසෙන්මැදෙහිඋන්රජුන්ගේ,
බැබලීමටත්වැඩි-නිරිඳුන්ගෙසෙන්සහයුදටපත්.

102 සත්රැකුමටපිහිට-අහරදියගිනිලුණුදවත්සව්,
මේහැමපිහිටමුත්-පිහිටමැදහත්රජුන්ගෙන්මැයි.

198 බැබලෙනසෙරිවිසද-අඳුරුබැබලිමෙක්දියතනැති,
ලොවරකිණනිරිඳුන්=ලෙසටසෙසුරජහු‍නොමබබලත්.

---

190. විරිදුන්, වෛරිජනයන්ගේ; මුල්සිඳිනු, මූලොච්ඡේදන කිරීම; නිරිඳුටතබා, නරේන්ද්‍රයෙකුටතබා; සුරන්වත්, දිව්‍යයන් වද; බැරි, නොහැක්කේවේ; නුබමිණ, සූර්‍ය්‍යා; සතරදිව, සතර මහදිවයිනෙහි; දිවත්, ධාවනයකොටද; තම, අන්ධකාරනැමැති; රුපු, ශත්‍රූන්; ගතනුහුනුමෙනි, ගනුනොහැකිවූවාක්මෙනි.

191. සම්බරණින්, සම්භරණයෙන්; සැදි, සජ්ජිතව; මැති සෙන්මැදෙහි, මන්ත්‍රිසේනාමධ්‍යයෙහි; උන්, උපවිෂ්ටවූ; රජුන් ගේ, රාජයන්ගේ; බැබලීමටත්වැඩි, භ්‍රාජමානත්වයටත් අධිකවූ යේ; සෙන්සහ, සේනාව හා සමගින්; යුදටපත්, යුඬයට පැමිණි යාවූ; නිරිඳුන්ගේ, නරේන්ද්‍රයන්ගේ (බැබලීම) වේ.

192. සත්රැකුමට, සත්ත්වයන්ගේ රැකීමට; පිහිට, ප්‍රතිෂ්ඨා ස්ථානවූ; අහර, ආහාරය; දිය, ජලය; ගිනි, වහ්නිය; ලුණුදු, ලව ණද; සව්වත්, (උපභොගපරිභොගාදී) සියලු වස්තූහුදයන; මේ හැම, මේ සියල්ලම; පිහිටමුත්, ආධාරවන්නේනමුත්; පිහිට (යොග්‍යතර)ප්‍රතිෂ්ඨාවනම්; මැදහත්,මධ්‍යස්ථවූ; රජුන්ගෙන්මැයි, නරේන්ද්‍රයන්කෙරෙන්මය.

193. රිවිසඳ, සූර්‍ය්‍යචන්ද්‍රදෙදෙන; බැබලෙනසේ, බැබලෙන් නාක්මෙන්; අඳුරු, අන්ධකාරය; දියත, ජගත්හී; බැබලීමෙක්, භ්‍රාජමානවීමෙක්; නැති, අවිද්‍යමානයි; ලොවරකිණ, ලොකය සංරක්ෂණයකරන්නාවූ; නිරිඳුන්ලෙසට, නරේන්ද්‍රයන්පරිද්දෙන්; සෙසු, අවශෙෂවූ; රජහු, (මහරජවරුන්ගේ යටත්වැසිප්‍රදෙශ) රාජයෝ; නොමබබලත්, භ්‍රාජමානනොවත්නාහුය.

194 පින්මඳහටඉසුරු-දුනත්ගත්දුක්සිතානිරිඳුන්,
තෙල්මඳපියල්ලෙන්-ගත්පහනනොපවතිනලෙසවෙ.

195 නිරිඳුන්ගෙමෙත්සිත්=සැබවසිසිතාඋඩඟුවන්නෝ
තිමදඇතුදළඅග=මුතුගණුවඅතදිගුකරනවැනි,*

196 නිරිඳෙනමරටමුත්-අන්රටටදිවාසඳවැන්නෝ,
පඬිවරුඅන්රටක-ගියත්රෑයපුන්සඳසෙබබලත්.

197 සව්වත්දකිනනෙත=තමානොදකීකැඩපතින්මුත්,
නිරිඳුටනැණැතියන=මැතිඳුදපණින්දැකුමසිදුවෙ.

---

194. ගත්දුක්, (තමාතිසා) ගත්තාවූ දුඃඛයන්; සිතා, චින්තනයකොට; නිරිඳුන්, නරේන්ද්‍රයන්විසින්; පින්මඳහට, පුණ්‍යවන්තභාවයෙන් ඌන පුද්ගලයාහට; ඉසුරුදුනත්, සම්පත්දුන් නමුත්; තෙල්මඳ, තෛලමන්දවූ; පියල්ලෙන්, පහන්කබලෙන්; ගත්,ග්‍රහණයකළාවූ; පහණ,(ශෛලශූන්‍ය) පහන්වැටිය; (ආලෝකය) නොපවතිනලෙසවේ, නොපවතින්නාක්මෙන් වන්නේය.

195. නිරිඳුන්ගේ, නරේන්ද්‍රයන්ගේ; මෙත්සිත්, මෛත්‍රීචිත්තය; සැබවසි, සත්‍යයසි; සිතා, චින්තනයකොට; උඩඟුවන්නෝ, උඩතවනජනයෝ; (කෙබඳුද?) තිමද, ත්‍රිමදගලිතවූ; ඇතු, හස්තිහුගේ; මුතු, මුක්තාඵලයන්; ගණුව, ග්‍රහණයකරනු පිණිස; දළ අග, දන්තාග්‍රයට; අත, හස්තය; දිගුකරනවැනි, දික්කරන්නාක් මෙනි.

196. නිරිදෝ, නරේන්ද්‍රයෝ; තමරටමුත්, ස්වීයරාෂ්ට්‍රයට මිස; අන්රටට, අන්‍යරාෂ්ට්‍රයකට; දිවාසඳවැන්නෝ, දහවල් චන්ද්‍රයා වැනිවෙති; පඬිවරු, පණ්ඩිතවීරයෝතුමූ; අන්රටක, අන්‍යරාෂ්ට්‍රයකට; ගියත්, ගමනයකළාහුනමුත්; රෑය, රාත්‍රියෙහිවූ; පුන්සඳසෙ, පූර්ණචන්ද්‍රයා පරිද්දෙන්; බබලත්, භ්‍රාජමානවන්නාහුය.

197. සව්වත්, සකල වස්තූන්; දකින, දර්ශනයකරන්නාවූ; නෙත, නේත්‍රයතෙම; තමා, තමන්, කැඩපතින්මුත්, දර්පණතලයෙන්විනා; (අනිකකින්) නොදකී, නොදක්නේය; (එමෙන්ම) නිරිඳුට, නරේන්ද්‍රයාට; මැතිඳුදපණින්, මන්ත්‍රීන්ද්‍රනැමැති දර්පණ තලය කාරණකොටගෙන; නැණැතියන, ඥානයුක්තසත්වයන්ගේ දැකුම, දර්ශනයතෙම; සිදුවේ. සිද්ධවන්නේය.

198. නිසපියනිසාචී*-නිසාගණඳුරුදුරුවයනමෙන්,
නිසාවැදහත්රදු—වෙතින්සතදුක්අඳුරුදුරුවේ.

199. නිරිඳුටඔවාදෙන-ගුණනැණැතිමැතිවරහුනැතහොත්,
අපමණඉසුරුඇතත්-නැතක්විරිදුන්අවැඩපැමිණෙණ්.

200. නිරිඳුවදනව්ගම්-සව්සිරිඇතත්නැතොත්බලසෙන්,
තරුපිරිවරනොමැති-නිසපියනිසාපෙණෙනවැනිවේ.

201. නිරිඳුන්ගෙන්ඉසුරු-ලත්සත්නැසෙත්එමරදුන්ගෙන්,
දියෙන්ඉපදුනලුණ-දියටපත්දියවනවිලස්වේ.

---

198 නිසපිය, චන්‍ද්‍රයාගේ; නිසාචී, ආශ්‍රයඇතිව; නිසා, රාත්‍රියෙහි; ගනඳුරු, ඝනාන්ධකාරය; දුරුවයනමෙන්, දූරීභූතවන්නාක්මෙන්; මැදහත්රදු, මධ්‍යස්ථරජහුගේ; නිසා, ආශ්‍රය හෙතුකොට ගෙන, සතවෙතින්, සත්‍වයන්කෙරෙන්; දුක්අඳුරු, දුඃඛාන්ධකාරය තෙම; දුරුවේ, දූරීභූතවන්නේය.

199. නිරිඳුට, නරෙන්‍ද්‍රයාට; ඔවාදෙන, අවවාදදෙන්නාවූ; ගුණනැණැති, ගුණහා ඥානය ඇත්තාවූ; මැතිවරහු, මන්ත්‍රීවරයෝ; නැතහොත්, අවිද්‍යමානවෙත්නම්; (එබඳුරජහට) අපමණ අප්‍රමාණවූ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය; ඇතත්, ඇත්තාහුනමුත්; විරිදුන්, වෛරීජනයාගෙන්; නැතක්, අනෙකවිධවූ; අවැඩ, අනර්‍ථවෘද්ධිය; පැමිණේ, ප්‍රාප්තවන්නේය.

200. නිරිඳුව, නරෙන්‍ද්‍රයාට; දනව්, ජනපදද; ගම්, ග්‍රාමද; සව්සිරි, සකලශ්‍රියද; ඇතත්, විද්‍යමානනමුත්; බලසෙන්, භටසේනාවෝ; නැතොත්, අවිද්‍යමානවෙත්නම්; තරුපිරිවරනොමැති, තාරකාපරිවාරරහිතවූ; නිසපිය, චන්‍ද්‍රයා; නිසා, රාත්‍රියෙහි; පෙණෙනවැනිවේ, දෘශ්‍යමානවන්නාක්මෙන්වේ; හෙවත් තෙජස්රහිතයෙක්ව දක්නාලබන්නේවේ.

201. නිරිඳුන්ගෙන්, නරෙන්‍ද්‍රයන්වෙතින්; ඉසුරුලත්, ඓශ්වර්‍ය්‍යයලද්දාවූ; සත්, සත්‍වයෝ; එමරදුන්ගෙන්, එමරාජයාගෙන්ම; නැසෙත්, විනාශවෙත්; දියෙන් ඉපදුන, ජලයෙන් හටගත්තාවූ; ලුණ, ලවණයතෙම; දියටපත්, ජලයටපැමිණ; දියවනවිලස්වේ, දියවන්නාක්මෙනි.

---

198. *නිසාපියවිනිසා-නැම.

**202.** **මැදහත්රජඉසුරු-වැඩිවැඩිසෙලොවටත්වැඩේ වැඩ*,**
**සඳවැලඳිසාවා-දිනෙන්දිනකැටුවමවැඩෙනමෙනි.**

**203.** **පින්පව්කලසතන්-දිවසින්දුටුසෙදකිති නිරිඳෝ,**
**වැඩඅවැඩ මෙදෙකම†-උන්උන්ට+පමුණුවත්**
**නිසැකින්. ×**

**204.** **නිරිඳුට විරිදුවූ**-දනන්හා දවසරින අවියත්,**
**මරහටතමකරා-අත්සන්කොට කැඳවනවිලස්වේ.**

**205.** **බෝකල් පුරුදුවූ-රදුයසි සිතා අලසනොසිතව,.**
**කිරිදෙමිනැතිකලත්††-උරගඇතිවිසනොවෙවෙනසක්.**

---

202. මැදහත්, මධ්‍යස්ථවූ; රජ, රජහුගේ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය; වැඩිවැඩිසෙ, වැඩිවැඩිවූපරිද්දෙන්; ලොවටත්, ලොකයටත්; වැඩවැඩේ, වෘඩිවඩිනයවේ; (කෙසේද?) සඳවැළඳි, චන්ද්‍රයා වැලඳගත්තාවූ; සාවා, ශශකයා; දිනෙන්දින, දවසක්දවසක්පාසා; කැටුවම, (චන්ද්‍රයාහා) සමගම; වැඩෙනමෙනි, වෘඩියට පැමිණෙන්නාක්මෙනි.

202. භා:- ද හපත් සාධාරණවූ (රජුන්ගේ) ඓශ්වර්‍ය්‍යය වැඩිවූ ප්‍රමාණයට ලොකයට අභිවෘඩියක්ම වන්නේය· කෙබඳුද? චන්ද්‍රයා දිනෙන්දින වැඩෙනවිට චන්ද්‍රමණ්ඩලය ඇසුරුකරන ශශ රූපයද ඒහාසමග දිනෙන්දිනම වැඩෙන්නාක්මෙනි.

203. පින්පව්කල, යහපත හා අයහපතකලාවූ; සතන්,සත්ත්වයන්; නිරිඳෝ, නරෙන්ද්‍රයෝ; දිවසින්දුටුසෙ, දිව්‍යචක්ෂුවෙන් දක්නාසේ; දකිති, දක්නයකෙරෙත්; වැඩඅවැඩමෙදෙකම, අර්ථඅනර්ථයනමේ දෙකාරණයම; උන්උන්ට, ඒ ඒ ජනයන්ට; නිසැකින්, නිසැකින්ම; පමණුවත්, ප්‍රාප්තකරත්.

201. නිරිඳුට, රජහට; විරිදුවූ,විරොධීවූ; දනන්හා,ජනයන්හා සමග; දවසරින, දිවසාතික්‍රමණය කරන්නාවූ; අවියත්, අව්‍යක්තජනයෝ; (කෙවැනිද?) අත්සන්කොට; හස්තසංඥකොට; හෙවත් අත්පිඩුගසා; තමකරා, තමන්ගේ සමීපයට; (පැමිණෙන පිණිස] මරහට, මාරයාට; කැඳවනවිලස්වේ, ආමන්ත්‍රණයකරන්නාක්මෙන්වේ.

205. බෝකල්, චිරකාලයක්ම; පුරුදුවූ, (ඇසුරුකිරීමෙන්) පරිචිතවූ; රදුයසි, රාජයායයි; සිතා, චින්තනයකොට; අලසනොසිතව්, ආලස්‍යයුක්තනොවව්, හෙවත් කාර්‍ය්‍යවිෂයෙහි අපරීක්ෂාකාරීනොවව්; කිරිදෙමින්, ක්ෂීරදානයකරමින්; ඇතිකලත්, වර්ධනය කරනලද්දේනමුත්; උරග, සර්පයාගේ; ඇතිවිස, විද්‍යමානවූ විෂයතෙම; වෙනසක්නොවේ, වෙනස්නොවන්නේය.

---

202. *වේයවැඩ-හැම. 203. †දෙකටම-හැම. සැනෙකින්ම-හැම.
204 **නිරිඳුන්ට විරිදුවූ-හැම. 205. බෝකල් පුරුදුයයි-සිතාමද
කුත් අලසනොසිතව්-හැම 205. කිරිබී ඇතිකලත්-හැම

**206. සිප් අබය බත්දෙන-මෙතුන් උතුමෝ තමාපියපිය,**
**පියතමගෙ සියපිය-සමග පස්දෙනම පියපියවෙත්*.**

**207. අදහම්නොලාසිත-දහම්නිති මෙනෙහිලා සතරැක,**
**දවසරිනාදනෝ†=දෙලොව සැපවිඳ නිවන්පුරයෙත්.**

**208. වැඩකට ගතනොහැකි+-දනන් එක්කෙරෙත්නම් කමකට,**
**වැඩකට නොගන්නා-අබියුත්නකතඑක්කරනමෙනි.**

**209. තපසත්වයසකුල-ගුණනැණවිකුම් ඇමින්වැඩුනත්,**
**මෙඇමටම × වැඩියෙන්-දනවත්දනෝලෙව්හිබබලත්.**

---

206. සිප්, සිල්පයන්ද; අබය, (භයක්පැමිණිකල්හි) නිර්භය භාවයද; බත්, ආහාරයන්ද; (යනමොවුන්) දෙන, දානයකරන් නාවූ; මෙතුන්උතුමෝ, මේ ත්‍රිවිධඋත්තමයෝද; පිය, ප්‍රියවූ;තමා පිය, සවකීයපිතෘහුද; පියතමගෙ,ප්‍රියභාර්‍ය්‍යාවගේ; සියපියසමග, සවකීය පියාහාසමග; පස්දෙනම, (මේ) පඤ්චවිධජනයෝම; පිය පියවෙත්, ප්‍රියවූ පිතෘහුවෙති.

207. අදහම්, අධර්මය; සිතනොලා, මනස්හිනොබහා; හෙ වත් චිත්තයෙහි නොපිහිටුවා; දහම්, ධර්මය; නිති, නිත්‍යයෙන්; මෙනෙහිලා, චිත්තයෙහි පිහිටුවා; සත, සත්වයන්; රැක, රක්‍ෂා කොට; දවසරිනා, දිවසාතික්‍රමණයකරන්නාවූ; දනෝ, ජනයෝ තුමූ; දෙලොව, උභයලොකයෙහිම; සැපවිඳ, සුඛානුභවයකොට; නිවන්පුර, නිර්වාණපුරයට; යෙත්, පැමිණෙන්නාහුය.

208. වැඩකට, (යම්කිසි) කාර්‍ය්‍යයකට; ගතනොහැකි, ග්‍රහ ණයකටනොහැක්කාවූ; දනන්, ජනයන්; කමකට, (යම්කිසි) කාර්‍ය්‍යයකට; එක්කෙරෙත්නම්, එක්කරගනිත්නම්; හෙවත් රූස් කරගනිත්නම්; වැඩකට, (කිසිත්) නක්‍ෂත්‍රයොගයකට; නොගන් නා, ග්‍රහණයනොකරන්නාවූ; අබියුත්නකත, එනම් නක්‍ෂත්‍රය; එක්කරනමෙනි, යුක්තකරන්නාක්වැනි.

209. තපසත්, තාපසකර්මයද; වයස, වයස්ද; කුල, කුලයද; ගුණ, ගුණයද; නැණ, ඥානයද; විකුම්ඇ, වික්‍රමාදීවූ; මින්, මේ ගුණයන්ගෙන්; වැඩුනත්, වර්ධනයවුවත්; මෙඇමටමවැඩියෙන්, මේ සියල්ලටම වැඩිකොට: දනවත්, ධනවත්තවූ; දනෝ, ජන යෝතුමූ; ළෙව්හි, ලොකයෙහි; බබලත්, භ්‍රාජමානවන්නාහුය.

---

206. *සිල්පඋපදෙස්බස්-අබය මේ සතරදෙන උතුමෝ
පියතමගෙ පියඞ්-සමග පස්දෙනම පියපියවෙත්-ඇතැම්
†දවසරිනදනෝලෙව්-බොහෝ +මිනිසුන්-හැම+මේඇමට-හැම

210. නික්මෙනෙකබිලෙකින්-පිපිලිකානම් සතුන්ගණනට*
දඹදිවදනෝ-නොසරිවෙත් දිවඇසින්බැලුවත්,

211. කෙතරම්තරමැතත්-කිසි ඉල්ලුසඳ දනෝලගුවෙන්
උවිඳු මහබලිගෙන්-බිම් දන්ගනුව කුඩාවූමෙනි.

212. එකයහපතක්කළ-සුදනො සියයක්වරද ඉවසත්†
දුදනෝ නොමඳවැඩ-කළත් එකවරදක බිඳියෙත්,

---

210. එකබිලෙකින්, එකමගුලකින්; නික්මෙන, නිෂ්ක්‍රාන්ත වන්නාවූ; පිපිලිකානම්, එනම්වූ; සතුන්, සත්වයන්ගේ; (කුහුඹුවන්ගේ) ගණනට, සඞ්ඛ්‍යාවට; දඹදිව, සකලජම්බුද්වීපයෙහි; දනෝ, ජනයෝ; දිවඇසින්, දිව්‍යචක්ෂුසින්; බැලුවත්, නිරීක්ෂණය කරනලද්දාහුනමුදු; නොසරිවෙත්, සදෘශනොවෙත්.

211. කෙතරම්, කතිප්‍රකාරවූ; හෙවත් කොපමණවූ; තර මැතත්, ශක්තිඇත්තාහුනමුදු; හෙවත් ධනයඇත්තාහුනමුදු; කිසි, මඳක්; ඉල්ලුසඳ, යාඥාකළකල්හි; දනෝ, ජනයෝ; හෙවත් යාචකයෝ; ලගුවෙන්, ලඝුවන්නාහුය; [කෙබඳුද?] උවිඳු, උපෙන්ද්‍රතෙම; මහබලිගෙන්, ×මහාබලිනම් අසුරයාගෙන්; බිම්, භූමි භාගයක්; දන්ගනුව, දන්වශයෙන් ගැණීමසඳහා; කුඩාවූමෙනි, කුඩාවූවාක්වැන්නේය.

111. භා:– පෙර එක්කලෙක්හී මුළුලොව මහත්බලයක් පතුරුවා යාගකිරීම් ආදියෙහි හා පරිත්‍යාගකිරීම් ආදියෙහිත් නිරතව මහාතෙජෝබල ඇත්තෙක්ව වැජඹුනු බලිනම් අසුරරාජයාගෙන් භූමිප්‍රදෙශයක් ලබාගැණීම පිණිස බලසම්පන්න ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයා යනු කැමැත්තේ තමන් ලොකයාවිසින් සම්මානිත බලසම්පන්න දෙවියෙක්ව සිට ඉල්ලීම අමනොඥයයි සංකාවාමන අවතාරයෙන් හෙවත් මිට්පුරුෂයෙකුගේ විලාසයෙන් ගොස් අභිමතභූමිභාගය ලබාගත්තේය. යමෙකුගෙන් යමක් ඉල්වන තැනැත්තා හීනාවස්ථාවට පැමිණෙනබැව් මෙයින් ප්‍රකටයි.

212. එකයහපතක්, එකමශොභනක්‍රියාවක්; කළ, (අන්‍යජනයන්විසින්) කරනුලැබූකල්හි; සුදනෝ, සාධුජනයෝ; වරද සියයක්, (ඔවුන්විසින් කරනලද) අපරාධ සියගණනක් [නමුත්] ඉවසත්, ඉවසන්නාහුය; නොමඳ, අමන්දවූ; වැඩ, ංඑසිඩිය; කළත්, (අන්‍යයන්විසින්) කරනලද්දාහුනමුත්; දුදනෝ, දුර්ජනයෝ; එක වරදක, එකමවරදක්ඇතිකල්හි; බිඳියෙත්, (ඔවුන්හා) භෙදයට පැමිණෙත්.

---

211. *එකබිලයකින් නික්මෙන පිපිලිකාවුන්ගෙ ගනනට-හැම

212. †සුදනෝ වැරදිසියයක් ඉවසත්-හැම

213. ලුහුදන නොදනිතත්-සුදන දූනගණීති සුදනන්ගුණ,
අකුරෙහිමැද තිබුන* රුවන්දන් නෙව්නැණැති යම්සේ†

214. දුන්දේ මේලොවම-ලැබේවියතුනි! නැගීපෙරළි,
දුන් ලුණඹවැස්සෙන ලෙව්රැක නැවත සිඳුවදීනමෙන්.

215. උතුමන් සෙවුම්කල ×-නොමඳවසව් ඉසුරු ලැබෙතිනිති,
මෙරහැසිරුගියසැම-සතුන් එම්පැහැයවනවිලසෙව්, +

---

213. ලුහුදන, ලඝුජනයෝ; නොදනිතත්, (සත්පුරුෂයන්ගේ ගුණය) නොදන්නාහුනමුත්; සුදන, සත්පුරුෂජනයෝ; සුදනන්ගුණ, සත්පුරුෂජනයන්ගේ ගුණ(විශෙෂ)ය; දූනගණීති, ජානනයකරන්නාහුය; (කෙසේද?) අකුරෙහිමැද, පාෂාණාභ්‍යන්තරයෙහි; තුබුන, පැවැත්තාවූ; රුවන්, රත්නයන්; නැණැති, බුද්ධිමත්ජනයන්; යම්සේ, යම්ආකාරයකින්; දන්නෙව්, දූනනන් නාක්මෙති.

213. භා:- ගුණහීනජනයෝ ගුණවතුන්ගේ ගුණය නොදනිතත් ගුණවන්තයෝම නිසිසේ දූනගන්නාහුය. එපරිද්දෙන්ම පාෂාණයන්හි පවත්නාවූ රත්නවිශෙෂයදන්නෝම යම්කිසි ආකාරයකින් දූනගණීත් නොදන්නෝ නොදකිත්මය.

214. වියතුනි!, ව්‍යක්තයෙනි!; දුන්දේ, දෙනලද්ද; මේලොවම, මේලොකයේදීම; පෙරළී, පරිවර්තිතව; නැගිලැබේ, පරිත්‍යාගයක්ව පැමිණේ; ලුණඹ, ලවණජලයෙන්; දුන්, ජාතවූ; හෙවත් හටගත්තාවූ; වැස්සෙන්, වර්ෂාජලයෙන්; ලෙව්රැක, ලොකය රක්ෂාකොට; නැවත, අනතුරුව; සිඳුවදිනමෙන්, සමුද්‍රයට ප්‍රවෙස වන්නාක්මෙති.

214. භා:- දෙනලදදෙය මෙලොවදීම පරිත්‍යාගවශයෙන් ආපසුනැරී තමාට ලැබෙන්නේය. කෙලෙසද? සමුද්‍රජලයෙන් හටගත් වර්ෂාජලයනෙම ලොකයා සතුටුකරවා ආපසු සමුද්‍රයටම පැමිණෙන්නාක් වැන්නේය.

215. උතුමන්, උත්තමයන්; සෙවුම්කල, ආශ්‍රයකලහොත්; නොමඳව, අමන්දව; සව්ඉසුරු, සකලසම්පත්තීහු; නිති, නිත්‍යයෙන්; ලැබෙති, ලැබෙන්නාහුය; (කෙබඳුදයත හොත්?) මෙර, මෙරුපර්වතයාගේ; හැසිරුගිය, ආශ්‍රයට පැමිණියාවූ; හැමසතුන්, සකලසත්වයන්ට; එම්පැහැය, එම මෙරුපර්වතරාජයාගේ ස්වර්ණකාන්තිය; වනවිලසෙව්, ඇතිවන්නාක්මෙති.

---

*තුබු-හැම †රුවන්දූනගත්නැණැතියන්සේ-හැම
×සෙවුන්-හැම +විලස්සේ-බොහෝ-විලස්වේ-ඇතැම්

216. තදරුදුගුණැතියන්-සමගවිසුවත්සුදනෝනොනැසෙත්,
කුරිරුගිනිමැදපත්-පවනසිහිලස නොනස්නාමෙනි.*

217. තමහටවරදකල-දුදනන්ට වෙරනොබැඳ කරමෙත්,
සිදුකරව් වැඩිවැඩ†-ඔවුන් විළිබියට+ පැමිණෙනසේ.

218. කුසුම්හි නොපවති-නොමඳ තදසුවඳ රිසිවනදන,
එමෙන් දන සුසිරිත-නොමැතතුනු ගරඬිකුණුවැනිවේ.

219. පෙරපින්නොකොටදූන්-සැපතටසැපෙනදනෝඅවියත්,
නොවපුටබිජුකෙතේ-පසුවසස්පලපතනවුන්වැනි. ×

---

216. තඳ, ඝනබඩවූ; රුදුගුණැතියන්සමග, රෞද්‍රගතිඇත්තවුන්හාසමගින්; විසුවත්, වාසයකලත්; සුදනෝ, සත්පුරුෂජනයෝ; නොනැසෙත්, විනාශනොවන්නාහුය; කුරිරු, කෲරවූ; ගිනිමැද, වහ්නිමධ්‍යයට; පත්, පැමිණියාවූ; පවන,මාරුතය සම්බන්ධවූ; සිහිලස, ශීතලස්පර්ශය; නොනස්නාමෙනි,නොනසින්නාක් වැන්න.

217. තමහට, තමාට; වරදකල, අපරාධකලාවූ; දුදනන්ට, දුර්ජනයන්ට; වෙරනොබැඳ, වෛරබන්ධනයනොකොට; මෙත් කොට, මෛත්‍රීකොට; ඔවුන්, ඒ දුර්ජනයන්; විළිබියට, ලජ්ජාභය දෙකට; පැමිණෙනසේ, ප්‍රාප්තවනපරිද්දෙන්; වැඩිවැඩ, අභිවෘද්ධියට හෙතුකාර්‍ය්‍යයන්; සිදුකරව්, සාධනයකරව්.

218. කුසුම්, පුෂ්පයන්; හි, (පරව) පතිතවූකල්හි; නොමඳ, බොහෝවූ; දනරිසිවන, ජනයාරුචිවන්නාවූ; තදසුවඳ, දෘඪතර සුගන්ධයතෙම; නොපවතී, නොපවත්නේය; එමෙන්, එපරිද්දෙන්ම; දන, ජනයාගේ; සුසිරිත, සුචරිතධර්මයක්; නොමැත, නැත්තේනම්; තුනු, ඔහුගේ ශරීරයතෙම; ගරඬිකුණුවැනිවේ, ගරඬිකුණපයක් හා සදෘශවන්නේය.

219. පෙර, පූර්වජන්මයෙහි; පින්නොකොට,කුසල්නොකර; දූන්,මේ ආත්මභාවයෙහි; සැපතට,සම්පත්විඳීමට; සැපෙන,සැපෙන්නාවූ;හෙවත් සැරසෙන්නාවූ;අවියත්දනෝ, අව්‍යක්තජනයෝ; (කෙබඳුද?) කෙතේ, ක්ෂේත්‍රයෙහි; බිජුනොවපුට, (තමන්) බීජයන්නොවපුරා (සිට); පසුව, පශ්චාත්කාලයෙහි; සස්පල, ශස්‍යඵලයන්; පතනවුන්වැනි, ප්‍රාර්ථනාකරන්නවුන් වැනිවේ.

---

*පවනනොනසිනවිලසමෙන්වේ-වැඩි. †වැඩිවැඩසිදුකරව්-කිසි.
+ඔව්හු විළිබියට-හැම. ×දනමඩිනවුන්දූකතැවෙනුවෝ-ඇතැම

220. ලොවකලමනාදෙය-නොදන කලහොත් යමෙක් නොපණත්*,
වැනසෙනු නියතමයි-කැටක් අහසටදමූ හෙතමෙන්.†

221. නැණමඳදනෝලද+-තොමඳඉසුරෙන්වහාවැනසෙත්,
දුඹුලුදියදිටනැගි-මසුන්වනසටපත්වනාමෙනි. ×

222. කල අල්පපිණෙනුත්-තොමඳ සුරනරසැපත්පැමිණේ,
නුගබිජුවටින්නැගි-විසල්තුර සාමඩුලුවනාමෙනි.

219. භා:- පූර්වභවයන්හි දානශීලභාවනාදී කුසලකර්මයන්රැස් නොකොට සිට මේආත්මභාවයෙහි සුවඅනුභවකිරීමට මූග්ධජනයෝ උත්සාහවඩන්නාහුය. ඔවුන්ගේ එම ව්‍යාපාරය කෙබඳුදැයි යතහොත්?මතුජීවිකාවෘත්තියසඳහා කෙතෙහි තමන්ධාන්‍ය නොවපුරා හෝ නොවපුරවාසිට පසුකාලයෙහි ශස්‍යඵලයන් ප්‍රාර්ථනා කරන්නවුන් වැනිවෙති. සුදුසු කාලයෙහි වස්තුරැස්නොකල පුද්ගලයා දිළිඳුවන්නාක්මෙන්ම කුසල්නොකල පුද්ගලයාද උපනුපන්නන්හිම දිළිඳුව බැගෑපත්ව දුක්විඳින්නෙක්ම වන්නේය.

220. යමෙක්, යම්කිසිපුද්ගලයෙක්; ලොව, ලොකයෙහි; කලමනාදෙය, කටයුතුදෑ; නොදන, ජානනයනොකොට; නොපණත්,අකතීව්‍යකර්මයන්; කලහොත්,කරනලද්දේනම්; අහසටදමූ, ආකාශයට දමනලද්දාවූ; කැටක්, පාෂාණයක්; (ගල්කැටයක්) හෙතමෙන්, භූමියට පතිතවන්නාක්මෙන්; වැනසෙනු, ඔහුගේ විනාශවීම; නියතමයි, ඒකාන්තමැයි.

221. නැණමඳ, මන්දබුද්ධිකවූ; දනෝ, ජනයෝතුමූ; ලද' (තමන්විසින්) ලද්දාවූ; තොමඳ, අමන්දවූ; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යය හෙතුකොටගෙන; වහා, ශීඝ්‍රව; වැනසෙත්, විනාශවෙත්; (කෙලෙසද?); දුඹුලුදිය, අභිනව ජලප්‍රහාරය; දිට, දශීනයකොට; නැගි, උද්ගතවූ; මසුන්,මත්ස්‍යයන්; වනසට,විනාශයට; පත්වනාමෙනි, ප්‍රාප්තවන්නාක්මෙනි.

222. කල, තමාවිසින් කරනලද්දාවූ; අල්පපිණෙනුත්, සවල්පවූ පුණ්‍යයෙනුත්; තොමඳ, සවල්පනුවූ; සුරනරසැපත්, දිව්‍ය මනුෂ්‍යසම්පත්තිය; පැමිණේ, සම්ප්‍රාප්තවේ: හෙවත් ලැබේ; නුගබිජුවටින්, න්‍යග්‍රොධබීජයෙන්; හෙවත් නුගඇටයෙන්; නැගි, උද්ගතවූ; හෙවත් පැනනැංගාවූ, තුර, වෘක්‍ෂයතෙම; විසල්, විශාලවූ;හෙවත් මහත්වූ; සාමඩුලුවනාමෙනි, ශාඛාමණ්ඩල යුක්තවන්නාක්මෙනි.

* කලහොත් නොපනත්-බොහෝ. † අහසදමූකැටක්හෙත විලසින්-හැම.

× අවසෙසුදනෝලද- තොමඳ ඉසුරක් අමුත්තක්වේ,
දුඹුලුදියටනැගි-මසුවැනසෙනලෙසටවැනසෙති.

223\. තිරසරගුණැතිසත-සව්සතට මැදහත්ව පවතී,
මහමෙර සුරඅසුර*-දෙලොවට මැදිව සැදිසිටිනෙව්.

224\. සහසික පව්වුදන-මලකෙනෙහි† ගෙනයේය තිරයට,
පහණිනිවිසදෙහිම-මුලුගෙය අඳුරුවැසෙන විලසිනි.

225\. නොතලාකුසුම්රොන්-ගන්න අයුරෙන් බිගුන්මීපා,+
නොතලාලෙව්සතන්-ගණුත්අයබදු × දෙලෝවැඩවේ.

226\. සුදනෝ ඇසිරුවන්-සතට දුක්වියනොදෙත්නැසෙතත්,
රාමරාවණමලු-මනෙහිඅලකොතපලන් තැබුමෙනි. ×

---

223\. තිරසර, සථිරසාරවූ; ගුණැතිසත, ගුණඇත්තාවූ සත්ව යෝ; සව්සතට, සකලසත්වයන්ට; මැදහත්ව, මධ්‍යස්ථව; පවතී, පවත්නෝවේ; මහමෙර, මහාමේරුපර්වතය; සුරඅසුරදෙලොවට, සුරලොක අසුරලොකවයට; මැදිව, මධ්‍යගතව; සැදී, සජ්ජිතව; සිටිනඑව්, සිටින්නාක්මෙනි.

224\. සහසික, සාපරාධවූ; පව්වුදන, පාපිෂ්ටජනයන්; මල කෙනෙහි, කළුරියකලක්ෂණයෙක්හී; හෙවත් මලඇසිල්ලකින්ම; තිරයටගෙනයේය, නරකයට ගෙනයන්නේය; (කෙබඳද?) පහණනිවිසදෙහිම, ප්‍රදීපයනිවුණුඇසිල්ලෙහිම; මුලුගෙය. සියලු ගෘහාභ්‍යන්තරයහෙම; අඳුරු, අන්ධකාරයෙන්; වැසෙනවිලසිනි, ප්‍රතිච්ඡන්නවන්නාක්මෙනි.

225 බිගුන්, භෘඞ්ගයන් (මිමැස්සන්) විසින්; කුසුම්, පුෂ්ප යන්; නොතලා, තාඩනයනොකොට; රොන්, පරාගය; හෙවත් රේණු; ගන්නඅයුරෙන්, ග්‍රහණයකරන්නාක්මෙන්; මීපා, මහී පාලතෙමේද; ලෙව්, ලොකයෙහි; සතන්, සත්වයන්; නොතලා, තාඩනයනොකොට; හෙවත් පීඩාවිට නොපමුණුවා; අයබදුගණු ත්, සුංකම්(අයබද්ද)ගන්නේනම්; දෙලෝවැඩවේ, උභයලොකාභි වෘද්ධිය වන්නේය.

226\. සුදනෝ, සත්පුරුෂජනයෝ; නැසෙතත්, (තමා) නැ සෙත්තමුත්; ඇසිරුවන්සතට, ආශ්‍රිතවූ සත්වයන්ට; දුක්වියනො දෙත්, දුක්වීමට අවකාශනොදෙන්නාහුය; රාම, රාමරාජයා විසින්; රාවණමලු, රාවණරාජයාගේ භ්‍රාතෘවූ විභීෂණයාගේ; මනෙහි, ශීඝ්‍රයෙහි; අලකොතපලන්, එනම් ආභරණය; (පලඳ නාව) හෙවත් ඔටුන්න; තැබුමෙනි, පලඳවනලද්දක්වැන්න.

---

*දෙලොවටසැදි-හැම. †මලකල-කිසි. මැරුණුකල-වැඩි.
\+ගන්නබිගුන් අයුරෙන්-හැම.

× ඇසුරුවන්සතහට-දුක්වියනොදෙත්තමනැසෙතත්
රාවණතමමලුට-අලකොතපලන්මතදුරුමෙහි-හැම.

226. (කථාප්‍රවෘත්තිය) උත්තමයන් විසින් ආශ්‍රය කරනු ලබන සත්ත්වයාට විපත් පැමිණිවිටද එම සත්ත්වයා උත්තමයා විසින් අත්නොහැර රැකගනුලැබේ. රාමරාජයාට පක්ෂව විසූ විභීෂණ දෙවයා රාවණරජු මැරුණුකල්හිද රාමරාජයාවිසින්ම ආරක්ෂා කොටගෙන වාසයකරනකල්හි ලඞ්කාරාජ්‍යයටද පත්කරනු ලැබිය. හේ කෙසේද? රාමරාජයාගේ මහිෂිවූ සීතාප්‍රමෙශ්වරී තොමෝ එක්කලෙකදී රාවණරාජයා විසින් බලාත්කාරයෙන් ගෙනවුත් ලඞ්කාවීපයෙහි සඟවා තබාගන්නාලද්දේය. එකල්හි රාවණරජු එසේ කළබැව් දැනගත් රාමරාජයාවිසින් මහත්වූ බල සෙන් පිරිවරාගෙන අවුත් රාවණරාජයා සමග යුඬයට සූදානම් විය. මේ බලසම්පන්නවූ රාම රාවණ දෙදෙන අතර සඞ්ග්‍රාමයක් කෙරෙන්ට වුවහොත් එයින් අප්‍රමාණවූ පරිහානියක් වන්නේ යයි සැලකූ විභීෂණතෙම තමසොහොයුරුවූ රාවණරාජයාවෙත ගොස් සහෝදරයාණෙනි! පරස්ත්‍රිහරණාදී සාහසික ක්‍රියාවෝ වනාහි නින්දිතතරය. පරිහානිකරය. තමහටම අනර්ථකරමාර්ගයෙක. එහෙයින් ජගත් පූජ්‍යතර ධාර්මිෂ්ඨගුණයෙන් හා පවිත්‍ර කීර්ත්තියෙන්ද යුක්තවූ රාමරාජයාහට සීතාප්‍රමෙශ්වරිය පෙරලා දීමෙන් රාම රාවණ දෙපක්ෂය සමගියෙහි පිහිටියයුතුයයි කාරණාසහිතව කියනලද්දේද. එය කිසිසේත් පිළිනොගත් රාවණ රාජයා දපියෙන් ඉල්ප රාමරාජයාහා සමග යුඬයට එළඹියේය. යුක්තියෙහි නොපිහිටා අධර්මපරවශව ක්‍රියාකරන රාවණරාජයා කෙරෙහි අතිශයින්ම කලකිරුණු විභීෂණදෙවයා අධාර්මිෂ්ඨවූ තමසොහොයුරු වෙත නොරඳා ධාර්මිෂ්ඨගුණඇති රාමරාජයා කෙරෙහිම පැහැද ඔහටම පක්ෂව විසුයේය. එකල්හි තෙජෝබල පරාක්‍රමයෙන් යුක්තවූ රාමරාජයා හා රාවණරාජයාද අතර අති භයානක මහා සඞ්ග්‍රාමයක් අටගැණීමෙන් එම දෙපක්ෂයෙහිවූ දෙපිරිස විෂමයජනකලෙස සඞ්ග්‍රාමයයොලෝය. එම සඞ්ග්‍රාමයෙහිදී රාමරාජයා විසින් රාවණරාජයා මරණු ලැබිය. අනතුරුව රාමරජතෙම විභීෂණයා ලවාම රාවණරාජයාගේ මෘතදෙහය පිළිබඳ කටයුතුකරවා නිමවූපසු දිව්‍යසේනාව මධ්‍යයෙහිදීම විභීෂණයාට ඔටුණුපළඳවා ලඞ්කාරාජ්‍යය පාවාදුන්නේය

“රාමො විභීෂණං මිත්‍රං ලඞ්කෛශ්වර්‍යෙභ්‍යෂෙචයත්”

යනු රාමායණයි.

---

අපට ලැබුනු සන්නපොත්කොපි සියල්ලෙහිම අලකොත පලන් යන්නට-ගෘහශෘඞ්ගාභරණයයි අමුදීතිබුනුබැව් සඳහන් කරමු. හේ විමසත්වා.

**227. දුරුකරම දුදනන්-සුදන සමගව කරව ලෝවැඩ,***
**අපමණිඉසුරුතෙද-විකුම් නැණැතත්මැකේමරණින්.**

**228 තෙදැතිනිරිඳුන්දික්-විජයනොකලත් පවති අණසක,**
**සුරපුරඉඳත්ඉඳු-දසදිගතඑකසේතෙවුනමෙනි.**

**229. සරාකලපුන්සඳ-කිරණින් ගුවන බබලනා†මෙන්,**
**නිරිඳෝමැතිවරන්-මැදහත් කමින් ලෙව්හි බබලත්.**

---

227. දුදනන්,දුර්ජනයන්; දුරුකරම,දූරීභූතකොටම; සුදන සමගව, සත්පුරුෂජනයන් හා සමගින්; ලෝවැඩ, ලොකාභිවෘද්ධිය; කරව්, සිඩකරව්; (කුමක්හෙයින්දයත්?) අපමණ, ප්‍රමාණරහිතවූ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යයද; තෙද, තෙජසද; විකුම්, වික්‍රමයද; නැණ,ඥානයද; (යනමොවුහු;) ඇතත්, විද්‍යමානනමුත්; (ඒසියල්ලම) මරණින්මතු, (එම ඓශ්වර්‍ය්‍ය-තේජස්-වික්‍රමාදියෙන් යුක්තවූ සත්ත්වයාගේ) මරණයෙන්මත්තෙහි; මැකේ, නෂ්ටවේ; (එහෙයිනි)

228. තෙදැති, තෙජොගුණයුක්තවූ; නිරිඳුන්, නරෙන්ද්‍රයෝ; දික්විජයනොකලත්, දිශාජයග්‍රහණය නොකරත්නානුනමුත්; අණසක, (ඔවුන්ගේ) ආඥාචක්‍රය; පවතී,පවත්නේය; ඉදු,ශක්‍රයා; සුරපුරඉදත්, දිව්‍යපුරයෙහි වාසයකොටත්; දසදිගත, දශදිශාගතයන්; එකසේ,එකාකාරයෙන්; තෙව්නමෙති,(ආඥාචක්‍රයෙන්) බබුලුවන්නාක්මෙනි.

229. සරාකල, ශරත්කාලයෙහි; පුන්සඳ, පූර්ණචන්ද්‍රයා; කිරණින්, (ස්වීය) රශ්මිය කරණකොටගෙන; ගුවන,ගගනතලයෙහි; බබලනමෙන්, භ්‍රාජමානවන්නාක්මෙන්; නිරිඳෝ, නරෙන්ද්‍රයෝ; මැතිවරුන්, මන්ත්‍රීවරයන්ගේ; මැදහත්කමින්, මධ්‍යස්ථභාවය හෙතුකොටගෙන; ලෙව්හි,ලොකයෙහි; බබලත්,භ්‍රාජමානවෙත්.

---

* දුරුකර දුදනයන්-සුදනඅනුවමකර දෙලෝවැඩ-ඇතැම්-සුදනසමගව-බොහෝ. † බබලනා-හැම.

**230.** **නූපයාසව්සිරි–දුගිලුහුදන දනඹුසොඬකම්,**
**අව්යත්වැ පඬිබැව්–පතනනැණනැතිදදදනෝමෙන්.***

**231.** **සක්විතිරජඉසුරු–සරිකරත දෙව්ලොවෙකසිරිහා,†**
**නස්නාපහණසම්–කළසව්සිරිත් + රන්රුවන්වැනි.**

**232.** **මෙබඳුසුරපුරටත්-දඹදිවම වැඩිපින්කෙත්,**
**‡එමතුනොවමුනිවිරු–මෙහිඉපිදබුදුවමොක්දෙනුවෝ.**

**233.** **සුදනන්ටකලවැඩ–පලනොදෙසි යනසැකයනොසිතව්,**
**නෙරළුපැලයටඇදි–දියටපලගෙණදෙනවිලස්වේ.**

---

230. දුගී, දරිද්‍රවූ; ලුහුදන, ලඝුජනයන්; සව්සිරි, සකලෛශ්වය්‍ර්‍යය; නූපයා, නූපදවා; (සිටගෙන) දන, වස්තුවකෙරෙහිද; අඹු, අන්‍යභාය්‍ර්‍යාවන්කෙරෙහිද; සොඬකම්, ගිජුවීම; හෙවත් ආශා ඇතිකිරීම; (කෙබඳුද?) නැණනැති, ඥානරහිතවූ; දදදනෝ, දග්ධජනයෝ; අව්යත්වැ, අව්‍යක්තව (සිට); පඬිබැව්, පණ්ඩිතභාවය; පතනමෙන්, ප්‍රාර්ථනාකරන්නාක්මෙනි.

231. සක්විතිරජ ඉසුරු, චක්‍රවර්තිරාජ්‍යශ්‍රිය; දෙව්ලොව, දිව්‍යලොකයෙහි; එකසිරිහා, එකම සම්පත්තියක්හා; සරිකරත, සදෘශකරතහොත්; රන්රුවන්, රත්නයන්හා සවර්ණයන්ද; සව්සිරිත්, සකලසම්පත්තියද (යනමොවුන්); නස්නාපහණ, නිකෂපාෂාණයහා, හෙවත් උරගලහා; සමකළවැනි, සදෘශකළාක්වැන්න.

232. මෙබඳු, මෙයාකාරවූ; සුරපුරටත්, දිව්‍යපුරයටද (වඩා); දඹදිවම; ජම්බුද්වීපයම; වැඩි, අධි[illegible]වූ හෝ ශ්‍රෙෂ්ඨවූ; පින්කෙත්, පුණ්‍යක්‍ෂෙත්‍රයෙකි; එමතුනොව, එපමණක්දනොව; මුනිවිරු, මුනිවරයෝ; මෙහි, මේ ජම්බුද්වීපයෙහි; ඉපිද, උත්පන්නව; බුදුව, බුඬත්වයට පැමිණ; මොක්දෙනුවෝ, මොක්‍ෂය දෙන්නෝය.

233. සුදනන්ට, සත්පුරුෂජනයන්ට; කලවැඩ, කළාවූහිතකාය්‍ර්‍යතෙම; පලනොදෙසියන, විපාකදනය නොකරන්නේය යන; සැකය, ශඞ්කාව; නොසිතව්, චින්තනයනොකරව්; නෙරළුපැලයට, නාලිකෙරගච්ඡය (වර්ධනය)ට; ඇදි, (තමාවිසින්) ගෙනෙනලද; හෙවත් වත්කරනලද; දියට, ජලයට; (ප්‍රමාණවූ) පලගෙනදෙනවිලස්වේ, ඵලඋපදවාදෙන්නාක්වැනිවේ.

---

*පානෙ නැණනැති දද දනොවෙත්–හැම, †ලොවෙක සිරි–හැම, + කළසව්සිරී-හැම ‡ මතුනොවේ මුනිවර–හැම.

234. අඟසිට මුලට උක්-කනවැන්න* සුදනන්ගෙ ඉතකම්,
දුදනන් සමගවනු-එහිම මුලසිට† අගටබුදිනෙව.

235. නොයෙක්කටයුතුකම්-දන්නාලෙසට ලොවනැනැතිවී,
නායෙක් උපමාවෙන්-සැදූනිරතුරැ බලාගැනුමට.

236. අනුවණදුරැරසැප-වැසය+කරමේලොවෙහි
මොනොවට,×
ලෝකොපකාරය=බලව් සැපලැබගන්ට සගමොක්.**

---

234. සුදනන්ගේ, සාධුජනයන්ගේ; ඉතකම්, හිතෛෂික්‍රියා තොමෝ; හෙවත් මිත්‍රභාවයතෙම; අගසිට, අගපටන්; මුලට, මුල දක්වා; උක්, උක්දණ්ඩ; කනවැන්න, භක්‍ෂණයකරන්නාක්වැන්න; දුදනන්, දුජ්නයන්හා; සමගවනු, සමගිවීම; හෙවත් මිත්‍රවීම; එහිම, එම උක්දණ්ඩයෙහිම; මුලසිට,මුලපටන්; අගට, අගදක්වා; බුදිනෙව්, සපා පැණිබොන්නාක්මෙනි.

234. භා:- සත්පුරුෂයන්ගේ මිත්‍රභාවයතෙම දිනෙන්දිනම යහපත් දියුණුවටම පැමිණේත්. කුමක්මෙන්ද? උක්දණ්ඩ අග සිට අනුභවකරනකල්හි එහි රසයද පිළිවෙළින් අධිකවන්නේය එමෙනි. දුජ්නයන්ගේ මිත්‍රධර්මය වනාහී දිනෙන්දිනම හීනවන් නේය. කුමක්මෙන්ද? උක්දණ්ඩ මුලසිට අගදක්වා අනුභවකරන කල්හි එහිරසය පිළිවෙළින් හීනවන්නේය. එමෙනි.

235–236. අනුවණ, අඥනභාවය; දුරැර, දුරීභූතකිරීමෙන්; මේලොවෙහි,ඉහලොකයෙහි; මොනොවට,මනාකොට; සැපවැස යකර, සුඛවිහරණයකොට; සගමොක්සුව, (පරලෙව්හි) ස්වර්ග මොක්‍ෂ සම්පත්තියද; ලැබගන්ට, ලබාගැනීමසඳහා; නැනැතිවී, ප්‍රඥඇතිව; ලොව, ලොකයෙහි; නොයෙක්, අනෙකප්‍රකාරවූ; කට යුතුකම්, කර්තව්‍යවිධිය; දන්නාලෙසට, දනගන්නා පරිද්දෙන්; නිරතුරැ, නිරන්තරයෙන්; බලාගැනුමට, බලාගන්නාපිණිස; නොයෙක් උපමාවෙන්, නානාවිධ උපමාවලින්; සැදූ, සරසනලද් දවූ; ලෝකොපකාරය, ලෝකොපකාරනම් මෙම ග්‍රන්ථය; බලව්, (සාධුජනයෙනි! යුෂ්මත්හු) නිරීක්‍ෂණයකරව්.

---

*කනවැනිය–ඇතැම්, කැමවැනි–කිසි, †මුලපටන්–හැම,
+වාසය-බොහෝ, ×ලොවෙහි නිරතුරෙන්–හැම.
**සගමොක්සැපත් ලැබගන්ටබලව ලොකොපකාරය–හැම.

237\. සිරිසර ගුණැති මහ–නැනතෙදිනි ලොව පරසිදුවසිරි,*
සිරිපිරි තොටගමුවෙ–වෙහෙරවැඩසිටිබොහොසෙ
කල්හැර. +

238\. කොළවර කෙළෙ මෙපොත=පුරසත්‍යසකවස පිරිසිරි,
පරපුරවණිජකුල–රණස්ගලුතෙර නමැති යතිඳු. ×

## ලෝකෝපකාරය නිමි.

---

237-238\. සිරිසර, ශ්‍රීසාරවූ; ගුණැති, ගුණයුක්තවූ; මහ, පිදියයුතුවූ; නොහොත්, මහගුණැති, මහත්ගුණඇත්තාවූ; නැනතෙදින්, ප්‍රඥමහිමයෙන්හා තෙජොගුණය කරණකොටගෙන; ලොව, ලොකයෙහි; පරසිදුව සිරි, ප්‍රසිඬව සිරියාවූ; සිරිපිරි, ශ්‍රීපරිපූර්ණවූ; තොටගමුවෙ, තීර්ථග්‍රාමයෙහිවූ; වෙහෙර, විහාරවරයෙහි; බොහොසෙ, බොහෝසෙයින්; හෙවත් වැඩිවශයෙන්; කල්හැර, කාලාතික්‍රමණය කෙරෙමින්; වැඩසිටි, වාසොපගතවූ; වණිජකුල පරපුර, වාණිජවංශොද්භූතවූ; රණස්ගලුතෙර නැමැති යතිඳු, රණස්ගලුසථවිර නාමධෙය යතීන්‍ද්‍රතෙම; පිරිසිරි, පරිපූර්ණව සිරියාවූ; පුරසත්‍යසකවසැ, පුරසත්‍ය නම් ශකවර්ෂයෙහි; හෙවත් 1721 එක්දහස්සත්සියඑක්විසිවන ශකවර්ෂයෙහි (දී); මෙපොත, මේ ලොකොපකාරනම්වූ ග්‍රන්ථය; කොළවරකෙළේ,සමාප්තකෙළේය.

## ලෝකෝපකාර වර්ණනාව සමාප්තයි.

---

237 *නැණතෙදිනි පරසිදුවසිරි–වැනි.
\+ බොහොසෙකල්හැර වැඩසිටි–ඇතැම්.
× රණස්ගලුතෙරසාමින්–හැම.



